



★

The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
දිනමිණ




යොවුන් ජනතා
අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බක් පුර දොළොස්වක ලත් ගනි දින | කාණ්ඩය 112 | පත්‍රය 109 | පිටු 16 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 24 සෙනසුරාදා

# රට වහන්නේ නෑ ඒත් පරිස්සම් වන්න

## යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා

## පැතිරෙන නව ප්‍රභේදය දරුණුයි - ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි

### අභියෝගය තේරුම් ගෙන වගකීම් ඉටු කරමු
ඇමැති කෙහෙලිය

### තරුණ අයට බෝ වීමේ ප්‍රවණතාව ඉහළයි
මහාචාර්ය නීලිකා

### දැඩි පියවර නොගන්නේ ජනතා පීඩනය අඩු කරන්නයි
ලලිත් වීරතුංග



ඡායාරූපය - රුක්මාල් ගමගේ

රක්ෂණ ශ්‍රියන්ත

සති අන්තයේ රට වසා දැමීමට හෝ සංචරණ සීමා පැනවීමට මෙතෙක් තීරණයක් ගෙන නැතැයි යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී පැවති මාධ්‍ය හමුවකදී ඊයේ (23) පැවසීය.

පිට 06

## ආණ්ඩුව හරීන්ව අත්අඩංගුවට ගන්න හදනවා



ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයාව අත්අඩංගුවට ගැනීමේ සූදානමක් පවතින බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (23) ප්‍රකාශ කළේය.

පිට 06

## අත්අඩංගුවට ගැනීමේ කිසිදු සූදානමක් නෑ



ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා පාර්ලිමේන්තුව තුළ කර ඇති ප්‍රකාශයක් පදනම් කර ගනිමින් අත්අඩංගුවට ගැනීමේ කිසිදු සූදානමක් නැතැයි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (23) ප්‍රකාශ කළේය.

පිට 06

## අවුරුදු සමයේ ලංගමට කෝටි 66ක ආදායමක්

සුභාෂිණී සේනානායක

අලුත් අවුරුදු සමයේ දින 10ක් තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය රුපියල් කෝටි 66ක (මිලියන 660ක) ආදායමක් උපයා තිබේ.

අලුත් අවුරුද්ද වෙනුවෙන් ගම්බිම් බලා යන ජනතාවට යෙදූ විශේෂ බස් සේවාව මඟින් මේ ආදායම උපයා ඇති බව එහි සභාපති නීතිඥ කිංස්ලි රණවක මහතා දිනමිණට ඊයේ (23) පැවසීය.

පිට 06

## වරාය නගර කොමිසමට එරෙහි පෙත්සම් සලකා බැලීම අවසන්

නිගමනය ජනපතිට සහ කථානායකට

නෙල්කා මැදගෙදර

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් පනත් කෙටුම් පතෙහි ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සිය තීන්දුව ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙත දන්වා යවන බව ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (23) සඳහන් කළේය.

පිට 06

## කෝටි 2ක හෙරොයින් වෙන්නප්පුවෙන් අල්ලයි

පිට7

## යහපාලන ආණ්ඩුව රාජ්‍ය බලයෙන් දේශපාලනඥයන් මර්දනය කළා



පිට 7

## කොරෝනා එක්ක වැඩ කරන්න මාර්ගෝපදේශ මාලාවක්

සන්ධ්‍යා කරුණාරත්න

කොරෝනා වයිරසය ව්‍යාප්ත වීමේ අවදානම මත පදනම්ව මෙරට ජනතාව පොදු ක්‍රියාකාරකම් කළ යුතු ආකාරය දක්වමින් මැයි 31දා දක්වා බලපැවැත්වෙන පරිදි කරුණු 48කින් සමන්විත මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

පිට 06

## ත්‍රිකුණාමලයට සංචරණ සීමා

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වසංගතයේ ව්‍යාප්තිය ඉහළ යෑම හේතුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සංචරණ සීමා පැනවීමට රජය තීරණය කරයි.

පිට 06

## නිරාවිය සහ නිකදලුපොත හුදෙකලා කරයි

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් වාරියපොළ ප්‍රදේශයේ නිරාවිය සහ නිකදලුපොත යන ග්‍රාම නිලධාරි කොට්ඨාස ඊයේ (23) මධ්‍යම රාත්‍රියේ සිට හුදෙකලා කිරීමට තීරණය කළ බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

පිට 06

## අලුත් කොරෝනාවේ මූලික ලක්ෂණය නිව්මෝනියාවයි

ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති

උපාලි කරුණාරත්න

උගුරේ වේදනාව හා අමතර රෝග ලක්ෂණ මතු වීමටත් පෙර නිව්මෝනියා තත්ත්වයක් මතු වීම ශ්‍රී ලංකාව තුළ මේ වන විට පැතිර යන කොවිඩ් නව ප්‍රභේදයේ විශේෂ ලක්ෂණය බව ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති, විශේෂඥ වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහතා දිනමිණට ඊයේ (23) පැවසීය.

පිට 06

## නව ප්‍රභේදයක් විද්‍යාත්මකව හඳුනාගෙන නෑ

රවි කුමුදේශ්

පිට 6

## වියළි මිදි යැයි කියා ඉන්දියාවෙන් ගෙනා කහ කිලෝ 14,000ක් අත්අඩංගුවට

සුභාෂිණී සේනානායක

වියළි මිදි බහාලන පෙට්ටි තුළ සඟවා ඉන්දියාවෙන් ආනයනය කරන ලද රුපියල් කෝටි 5කට අධික වටිනාකමකින් යුත් කහ කිලෝ 14,000කට ආසන්න තොගයක් රේගුව විසින් අත්අඩංගුවට ගෙන තිබේ. වියළි මිදි ගෙන්වන බවට රේගුවට ලිපි ලේඛන ඉදිරිපත් කර මේ කහ තොගය ආනයනය කර තිබෙන බව රේගු මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු) සුදත්ත සිල්වා මහතා පවසයි.

පිට 06

පිට 6

## මැති සබේ ගැටුම විමර්ශන කමිටුවේ සභාපති සියඹලාපිටිය

## සහරාන්ගේ මාමණ්ඩිය ඇතුළු දෙදෙනෙක් අත්අඩංගුවට

## ගෙවුණු මාස 4ට අල්ලස් පැමිණිලි 917ක්

## මැලේසියාවේ සිට මෙහෙයවන කුඩු ජාවාරමක සුලමුල හෙළි වෙයි

සොයිසාපුරෙන් රටටම බෙදලා

සුභාෂිණී සේනානායක රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

පාතාල සාමාජික සයිමා මැලේසියාවේ සිට මෙහෙයවූ සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකු වන ධනුෂ්ක නොහොත් සයිමා විසින් මැලේසියාවේ සිට මෙහෙයවනු ලබන මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාලයක් හඳුනා ගැනීමට විශේෂ කාර්ය බළකා බුද්ධි කොට්ඨාසය සමත් වී තිබේ. පිට 06



## කොවිඩ් තුන්වන රැල්ලේ අවදානමක්:

# බන්ධනාගාර රැඳවූවන් හමු වීමට අමුත්තන් පැමිණීම අත්හිටුවයි

**බුද්ධිකා ඉඹුලාන**

කොවිඩ් තුන්වන රැල්ලේ අවදානමක් රටේ ඉස්මතු වීමත් සමගම, බන්ධනාගාර රැඳවූවන් හමු වීමට අමුත්තන් පැමිණීම අද (24) සිට සති දෙකක කාලයක් අත්හිටුවීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

බන්ධනාගාර පරිශ්‍රවලට පිටතින් පැමිණෙන පුද්ගලයන්ගෙන්, කොවිඩ් වසංගතය බන්ධනාගාරවල යළිත් ව්‍යාප්ත වීම වීමේ අවදානම නිසා මේ පියවර ගැනීමට තීරණය කළ බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

එහෙත් පවුලේ සාමාජිකයන් විසින් රැඳවූවන්ට අවශ්‍ය ද්‍රව්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය අදාළ බන්ධනාගාරවල ආපනශාලාවට මුදල් ගෙවීමෙන් එම රැඳවූවන්ට ලබාදීමට පෙර පරිදිම අවස්ථාව හිමිවන බවද ඒකනායක මහතා පවසයි.

පසුගිය දින කීපයේ බන්ධනාගාර ගණනාවකින් කොවිඩ් ආසාදිත නව රැඳවූවන් වාර්තා වූ අතර අධිකරණ මගින් එසේ අලුතින් බන්ධනාගාර වෙත යොමු කරන රැඳවූවන් නිසා යළිත් බන්ධනාගාර කොවිඩ් රැල්ල ඉහළ නොයාමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙවැනි දැඩි සෞඛ්‍ය ආරක්ෂිත වැඩපිළිවෙළ අනුගමනය කිරීමට තීරණය කර ඇත.

## ජපානයේ ත්සුකුබාහි අවුරුදු උත්සවයක්



ජපානයේ ත්සුකුබා ශ්‍රී ලාංකික මිත්‍ර සංවිධානය විසින් ත්සුකුබා හා අධ්‍යාපන හා පර්යේෂණ ආයතනවල සේවය කරන හා ප්‍රදේශයේ අධ්‍යාපනය ලබන සිසුන් හා එහි ආදි විද්‍යාර්ථීන් හා ඔවුන්ගේ පවුල්වල අය හා එක්ව සංවිධාන කළ අවුරුදු උත්සවයක් ත්සුකුබාහි පිහිටි ක්‍රීඩාංගණයකදී පැවැත්විණි. එහිදී ශ්‍රී ලංකාවේ අවුරුදු ක්‍රීඩා රැසක්ම පැවැත් වූ අතර ශ්‍රී ලාංකීය සාම්ප්‍රදායික ජන ක්‍රීඩා රැසක්ද එහිදී පැවැත්වුයේ එරට වෙසෙන ශ්‍රී ලාංකික දරු දැරියන්ගේ දැනුම වැඩි කිරීමටය.

එහිදී කුඩා දරු දැරියන් බැලුම් පිපිරවීමේ තරගයට එක් වූ අවස්ථාවයි මේ.

# පන්නලින් ආසාදිතයෝ 55ක්

## පන්නල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී

**රත්නසිරි පතිරණ සහ ගිරිඋල්ල සමූහ**

පන්නල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයෙන් ඊයේ (23) වන විට කොවිඩ්-19 ආසාදිතයන් 55ක් පමණ ප්‍රතිකාර සඳහා යොමුකර ඇති බව පන්නල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී සාමා හේරත් මහත්මිය සඳහන් කළාය. මේ රෝගීන් දඹදෙණිය,බිංගිරිය,අඹන්පොල සහ නාරම්මල ප්‍රතිකාර මධ්‍යස්ථානවලට යොමුකර ඇති බවද ඒ මහත්මිය පැවසුවාය.

සෞඛ්‍ය අංශ ලබාදී තිබූ උපදෙස් කිසිවක් ගණන් නොගෙන අවුරුදු සැමරීමට ජනතාව එක්රොක් වී කටයුතු කිරීම මෙවර කොවිඩ්-19 ආසාදිතයන් එකවර වැඩිවීමට ප්‍රධාන හේතුවක් වී ඇති බව හේරත් මහත්මිය කීවාය. ඉදිරි සතියේ රෝගීන්ගේ යම් ඉහළයාමක් පන්නල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ සිදු විය හැකි බවද ඇය සඳහන් කළාය. සෞඛ්‍ය අංශ ලබාදී ඇති උපදෙස් නිසි අයුරින් පිළිපැදීම මේ වසංගත තත්ත්වය පාලනය කර ගැනීමට ඇති එකම විසඳුම බවත් ජනතාව ඉතා ප්‍රවේශමෙන් දෛනික කටයුතු සිදු කර ගන්නා ලෙසද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය වැඩිදුරටත් සඳහන් කළාය.

## කොවිඩ් ව්‍යාප්තිය වැඩියි:

# එළැඹෙන සති අන්තයේ සංචරණ සීමා පනවන්න

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය රජයෙන් ඉල්ලයි

**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

කොවිඩ් වසංගත තත්ත්වය ශීඝ්‍රයෙන් ව්‍යාප්තවීම හේතුවෙන් එළැඹෙන සති අන්තයේ සංචරණ සීමා පනවන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය රජයෙන් ඉල්ලීමක් කර තිබේ.

එවැනි පියවරක් නොගතහොත් ඉදිරියේදී සැහෙන ප්‍රමාණයකින් ආසාදිතයන් සංඛ්‍යාව ඉහළ යාහැකි බව සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා පෙන්වා දෙයි.

තම සංගමය මේ සම්බන්ධයෙන් විටින් විට ආණ්ඩුවට සහ සෞඛ්‍ය අංශවලට දැනුවත් කිරීම් සිදු කළ බව පෙන්වා දුන් ඒ මහතා මේ සති අන්තය තීරණාත්මක සති අන්තයක් බැවින් මේ තීරණය ගැනීමේ වගකීම පෙන්වා දුන් බවද කියා සිටියේය. පසුගිය වසරේ අලුත් අවුරුදු නිවාඩුව සම්බන්ධයෙන් රජය සිදු කළ දැනුවත්වීම්වලට මෙරට ජනතාව අවනත වූ බවත් මෙවරත් කොවිඩ් ව්‍යාප්තියේ ඇති අවදානම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කළ යුතු වන බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

මේ වනවිට කොවිඩ් ව්‍යාප්තිය වෙනුවෙන් ලබා දුන් ඇස්ට්‍රා සෙනෙකා එන්නතේ දෙවන මාත්‍රාව සෞඛ්‍ය සේවකයන්ට අප්‍රේල් මස 20 වැනිදා ලබාදීමට නියමිත බවත් ඒ සම්බන්ධයෙන්ද බිම් මට්ටමේ විශාල කතා බහක් ඇති වී තිබෙන බවත් ඒවා සම්බන්ධයෙන්ද රජය පිළිතුරු දිය යුතු වන බවත් ඒ මහතා අවධාරණය කළේය.

# ගාල්ල නාගොඩින් කොරෝනා ආසාදිතයෝ 5ක්

**එල්.ඒ.පී.හේමපාල-නාගොඩ සමූහ**

ගාල්ල නාගොඩ ප්‍රදේශයේ ඊයේ (23) වන විට කොරෝනා රෝගීන් පස් දෙනෙකු හමුවී ඇතැයි වාර්තා වේ. ඉන් සිව් දෙනෙකුම බැංකු ආරක්ෂක නිලධාරියකුගේ පවුලේ සාමාජිකයන්ය. බැංකු ආරක්ෂකයා, ඔහුගේ බිරිය හා දරුවන් දෙදෙනා කොරෝනා ආසාදිතව රෝහල් ගත කර ඇත. මීට අමතරව මාපලගම අලුත්පහළ ප්‍රදේශයේ බයිසිකල් අලුත් වැඩියා කරන පුද්ගලයකුටද කොරෝනා ආසාදනය වී ඇති අතර ඔහුට වයිරසය ආසාදනය වූ මූලාශ්‍රය මෙතෙක් සොයාගෙන නැතැයි සෞඛ්‍ය අංශ පවසයි.

# කොස්වත්ත පොලිසිය වසයි

පොලිස් පරීක්ෂකවරයකුට කොවිඩ් -19 ආසාදිත වීම නිසා හලාවත, කොස්වත්ත පොලිස් ස්ථානය ඊයේ (23) උදෑසන තාවකාලිකව වසා දමා තිබේ.

මේ වන විට කොස්වත්ත පොලිස් ස්ථානයේ රාජකාරි කටයුතු ප්‍රදේශයේ විහාරස්ථානයක සිදුකරන බව වාර්තා වේ.

# අනුරාධපුර පුද බිමට එන්න එපා

## ආණ්ඩුකාර මහීපාල හේරත් ඉල්ලීමක් කරයි

**හිඳෝගම සමූහ**

ඉදිරියේදී පැමිණෙන දීර්ඝ නිවාඩුවක් සමග අනුරාධපුරට වැඩි ජනතාවක් පැමිණියොත් කොරෝනා වයිරසය රට වටා පැතිර යෑමේ අවදානමක් තිබෙනවා .අනුරාධපුර මේ රෝගය ශීඝ්‍ර ලෙස පැතිර යන බව සෞඛ්‍ය අංශ පෙන්වා දෙනවා. මේ නිසා ඉදිරි දින කීපය බැතිමතුන්ගේ පැමිණීම සීමා කිරීමට අප තීරණය කළා.

කණ්ඩායම් වශයෙන් පැමිණීම නොකරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින බව උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා පැවසීය.

මේ කරුණු අනාවරණය වුණේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස පැවති සාකච්ඡාවකදීය. අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස නාහිමියන් ඇතුළු මහා සංඝරත්නය, ආණ්ඩුකාර මහීපාල හේරත්, උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පාලිත බණ්ඩාර මහත්වරුන් සෞඛ්‍ය අංශ සහ ශ්‍රී ලංකා පොලීසිය, යුද හමුදාව මේ සාකච්ඡාවට එක්වූහ. අනුරාධපුරට පැමිණෙන ජනතාව වෙනුවෙන් මාර්ග බාධක යොදා පී.සී. ආර් පරීක්ෂණ කිරීමට ද අප තීරණය කළ බවද වැඩිදුරටත් හෙතෙම පැවසීය. මෙය හේතු කොටගෙන බැතිමතුන්ගෙන් ඉල්ලා සිටින්නේ අනුරාධපුරයට පැමිණීමෙන් වළකින ලෙසයි.

# ත්‍රිකුණාමලය චීන වරාය දමිළ මහා විදුහල දින නියමයක් නැතිව වසයි

**සුභාෂිණී සේනානායක**

ත්‍රිකුණාමලය චීන වරාය දමිළ මහා විද්‍යාලය දින නියමයක් නැතිව වසා දැමීමට එහි පාලනාධිකාරිය ඊයේ (23) තීරණය කර තිබේ. ඒ එම පාසලේ ගුරුවරියකට කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් පාසල වසා දමා ඇති අතර අදාළ ගුරුවරියට දෙදිනකට පෙර පී.සී.ආර් පරීක්ෂණයක් සිදු කර තිබියදී පෙරේදා (22) දිනයේදීත් පාසලට පැමිණ තිබීම හේතුවෙන් මේ තීරණය ගෙන තිබේ. හලාවත කෙසෙල්වත්ත පොලිස් ස්ථානය ඊයේ (23) උදෑසන තාවකාලිකව වසා දමා ඇති අතර එහි පොලිස් පරීක්ෂකවරයකුට වයිරසය ආසාදනය වීම හේතුවෙන් මේ තීරණය ගෙන ඇත.

## 'ලේඛකයකු සමඟ හෝරාවක්' අද සුගත් ශාන්ත මොරගහකුඹුර

මහජන පුස්තකාල ලේඛක හා පාඨක සංසදය මෙහෙයවන 'ලේඛකයකු සමග හෝරාවක්' වැඩසටහන අද (24) සවස 2.30ට කොළඹ මහජන පුස්තකාල සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

ජනප්‍රිය ලේඛකයකු වන සුගත් ශාන්ත මොරගහකුඹුරගේ 'මයේ අප්පච්චි' නවකතාව වෙනුවෙනි.

මේ වැඩ සටහනට එක්වන ලෙස සහෘද ලේඛකයන්ට හා පාඨකයන්ට විවෘත ආරාධනයක් කෙරේ.

AROUND THE WORLD ලොව වටා



# ඉන්දියාවේ කොවිඩ් රැල්ල දරුණුම තැනට ඇවිත්

ඉන්දියාවේ කොරෝනා වසංගතය ඉතාම උච්ඡ තත්ත්වයට පත් වී ඇතැයි වාර්තා වේ. ප්‍රධාන වශයෙන්ම එරට රෝහල්වල දැඩිසත්කාර ඒකකවල ඇඳන් ප්‍රමාණය ඉක්මවා රෝගීන් වාර්තා වීමත්, ඔක්සිජන් හිඟයත් ඇති බවත් රෝහල්වලට ඇතුළු වීමටත් පෙර රෝගීන් මිය යන ශෝචනීය පුවත් දසතින් වාර්තා වේ. නවදිල්ලියේ සහ මහා රාෂ්ට්‍රයේ වෛද්‍ය සේවා හිඟය දැඩිවම බලපා ඇත. ගෙවුණු පැය 24 ඇතුළත වාර්තාගත අයුරින් රෝගීන් හමු වී තිබේ.







## රෝහල්වලට ඇතුළු වීමටත් පෙර රෝගීන් මිය යන දසුන්

## රට පුරා ඔක්සිජන් හිඟයක්





ඉන්දියාවේ අම්රිත්සාර් නුවර ඉස්ලාමීය දේවස්ථානයක ඊයේ (23)පැවැති රාමදන් දේව මෙහෙයකට එක් වූ ඉස්ලාමීය බැතිමතුන් පිරිසක්.







# යාපනය බන්ධනාගාරය හා පොලීසි කීපයකින් හමු වන ආසාදිතයන් තවමත් වැඩියි

## උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනය බන්ධනාගාරය හා යාපනයේ තවත් පොලීසි කීපයකින් හමුවන කොරෝනා රෝගීන් සංඛ්‍යාව යළි ඉහළ ගොස් තිබේ. උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කළේ පෙරේදා (22) යාපනයෙන් පමණක් කොරෝනා රෝගීන් 27ක් හමු වූ බවයි.

ඔවුන් අතුරින් යාපනයේ රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියකු බන්ධනාගාරයේ සිරකරුවන් පස් දෙනෙකු පොලීසියේ තුන් දෙනෙකුද සිටින අතර මේ වන විට යාපනයේ විවිධ පළාත්වල පොලිසිවලින් කොරෝනා රෝගීන් 21ක් හමු වී තිබේ.

උතුරු පළාතේ සෙසු පළාත්වලින් පෙරේදා (22) හමු වූ රෝගීන් සංඛ්‍යාව 8ක් වන අතර ඉන් 4 ක් මන්නාරමෙන්ද 2ක් වවුනියාවෙන්ද මුලතිව් හා කිලිනොච්චිය පළාත්වලින් රෝගීන් එක බැගින්ද වෙයි.

# මිනුවන්ගොඩ පාසල් කීපයකින් කොවිඩ් ආසාදිත සිසුන් 10ක් හමු වුණා

## මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් කීපයකින් කොරෝනා ආසාදිත සිසුන් 10ක් ඊයේ (23) වාර්තා වූ බව මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වජිර රණරාජා මහතා පැවැසීය.

මේ හේතුවෙන් සිසුන් 78ක් ස්වයං නිරෝධායනයට යොමු කළ බව ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා පැවසීය.

මීට අමතරව දරු දැරියන්ගේ මවුපියන් 14ක් ද කොරෝනා ආසාදනය වී ඇති බව හඳුනාගෙන ඇතැයි ද සෞඛ්‍ය අංශ කියයි. මිනුවන්ගොඩ පාසල් 15කින් මේ පිරිස වාර්තා වී ඇති අතර එක් පාසලක ගුරුවරයකුට ද කොරෝනා වයිරසය ආසාදනය වී ඇත.

ආසාදිත හා නිරෝධායනයට ලක් කර ඇති පාන්ති සීමා කිරීමට කටයුතු යොදා ඇතැයි ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් පැවැසීය.



# මන්නාරමෙන් වියළි කහ කිලෝ 802ක් සැකකරුවන් සමඟ නාවික හමුදා භාරයට

**උතුරු පළාත් විශේෂ- රසුල දිල්හාර ගමගේ**

නාවික හමුදාව විසින් මන්නාරම ප්‍රදේශයෙන් අවස්ථා දෙකකදී අත්අඩංගුවට ගන්නා ලද වියළි කහ කිලෝ ග්‍රෑම් 802ක් සමඟ සැකකරුවන් පස් දෙනෙකු පෙරේදා(22) මන්නාරම පොලීසිය වෙත බාර දීමෙන් පසු ඔවුන් නිරෝධායනය කිරීමට සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය වෙත රැගෙන ගොස් තිබේ.

මන්නාරම කුඩිඉරිප්පු ප්‍රදේශයට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ සිදුකළ විශේෂ සෝදිසි මෙහෙයුමකදී සැක කටයුතු ඩිංගි යාත්‍රාවක් පරීක්ෂා කර එහි උර 15ක අසුරා තිබූ වියළි කහ කිලෝ 543 ග්‍රෑම් 700 ක් සැකකරුවන් දෙදෙනෙක් සහ ඩිංගි යාත්‍රාව නාවික හමුදා භාරයට ගෙන තිබේ.

මන්නාරම පේසාලේ ප්‍රදේශයට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ කළ තවත් විශේෂ සෝදිසි මෙහෙයුමකදී නාවික මෙහෙයුම් හේතුවෙන් ජාවාරම්කරුවන් විසින් මුහුදට දමන ලද වියළි කහ කිලෝ 258 ග්‍රෑම් 500 ක් සහිත උර 04ක් සමඟ සැකකරුවන් දෙදෙනෙක් සහ ඩිංගි යාත්‍රාවක් නාවික හමුදා භාරයට ගැනීමට නාවික හමුදාවට හැකි වී තිබේ.

මේ සැකකරුවන් නිරෝධායනය කිරීමෙන් පසු රේගුව හරහා මන්නාරම අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.



## කෝටි ගණනක විසිතුරු භාණ්ඩ ඖෂධ හා රූපලාවණ්‍ය ආලේප රැගෙන





## මන්නාරමට ආ ඉන්දීය ධීවරයෝ පස්දෙනෙක් කොටු

**උතුරු පළාත් විශේෂ- රසුල දිල්හාර ගමගේ**

රුපියල් කෝටි ගණනක් වටිනා විසිතුරු භාණ්ඩ ඖෂධ හා රූපලාවණ්‍ය ආලේප රැගෙන මන්නාරම ඔස්සේ උතුරට පැමිණි ඉන්දීය ධීවරයන් පස් දෙනෙකු නාවික හමුදාව විසින් මන්නාරම කුදිරමලෙයි ප්‍රදේශයේදී ඊයේ (23) අත්අඩංගුවට ගෙන තිබේ.

මේ ද්‍රව්‍ය ඔවුන් විසින් බෝට්ටුවක ආධාරයෙන් රැගෙන විත් ඇති අතර ඔවුන්ට එම ද්‍රව්‍ය රැගෙන ඒමට කිසිදු බලපත්‍රයක් නොතිබූ බව නාවික හමුදාව කියයි.

අත්අඩංගුවට ගත් ඉන්දීය ජාතිකයන් පස්දෙනා රේගුවට භාර දීමට නාවික හමුදාව පියවර ගෙන තිබේ.

## ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



- ඒකාලෙ හරීන් කිව්වෙ රැල්ලට බයනං වැල්ලට එන්නෙ නෑ කියල බං !
- ඒ වුණාට සර් සීඅයිඩී එකට බයයිනෙ !

# මියගිය එල්ටීටීඊ සාමාජිකයන් නමින් ව්‍යාජ හැඳුනුම්පත් හදා පුද්ගලයන් රට යවලා

## සැකකරු වව්නියාවේදී අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

මියගිය එල්ටීටීඊ සාමාජිකයන්ගේ නමින් ව්‍යාජ හැඳුනුම්පත් සහ ගමන් බලපත්‍ර සකස් කර යම් යම් පුද්ගලයන් විදේශ ගත කළ පුද්ගලයකු පෙරේදා (22) වව්නියාව ප්‍රදේශයේදී ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42ක් වන වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

සැකකරු ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසය වෙත රැගෙන විත් රඳවා තබා ගැනීමේ නියෝග ලබාගෙන වැඩිදුර විමර්ශන සිදු කරයි.

සැකකරු එල්.ටී.ටී.ඊ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ අයෙකුද සැකකරු විසින් කුමන පුද්ගලයන් ව්‍යාජ ගමන් බලපත්‍ර සාදා විදේශ ගත කර ඇත්ද යන්න පිළිබඳ ත්‍රස්ත්‍ර ක්‍රියා විමර්ශන කොට්ඨාසය විසින් විමර්ශන සිදුකරයි.

# අත්තනගලු ඔයේ ජල මට්ටම ඉහළ යයි

**උපාලි කරුණාරත්න**

මේ දිනවල නිරිත දිසාවෙන් සුළං හැමීමත් පහළ වායු ගෝලයේ හොඳින් ජල වාෂ්ප තිබීම සහ නිරිත දිග වෙරළාසන්න ප්‍රදේශවලදී සුළං එකතුවීම හේතුවෙන් ඉදිරි දිනවලදීත් පුත්තලම සිට කොළඹ, ගාල්ල, මාතර හරහා හම්බන්තොට දක්වා වන වෙරළාසන්න ප්‍රදේශවල උදෑසන කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බව කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ කසුන් පැස්කුවල් මහතා පැවසීය.

දිවයිනේ නිරිත දිග කොටසේ ඉදිරි දිනවලදීත් තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි අපේක්ෂා කරන අතර දිවයිනේ සෙසු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. ඊයේ (23) උදෑසන 8.30න් අවසන් වූ පැය 24 තුළ කුකුලේගඟ ප්‍රදේශයට මි.මී 160 වර්ෂාපනයක්ද, කෑගල්ල, කළුතර, රත්නපුර දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවලට මි.මි 100 ඉක්මවූ වර්ෂාපතනයක්ද ඇතිවී තිබේ. කොළඹ නගරයට මි.මී 39.6ක වර්ෂාපතනයක් පැවැති බව කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥවරයා කීය. එමෙන්ම ඊයේ (23) පෙරවරු 9.30 පමණ වන විට දූනමලේ ප්‍රදේශයෙන් අත්තනගලු ඔයේ ජල මට්ටම ඉහළ යමින් තිබිණ.

# මාරක රිය අනතුරුවලින් ඊයේ 07ක් මිය ගිහින්

## පොලිස් මාධ්‍ය ප්‍රකාශක

**රක්ෂණ ශ්‍රියන්ත**

දිවයිනේ විවිධ ප්‍රදේශවල මාරක රිය අනතුරුවලින් පුද්ගලයන් 07ක් ඊයේ (23) උදෑසන 6.00 වන විට මියගොස් ඇති බව පොලිසිය පවසයි.

එළඹෙන දීර්ඝ සති අන්තයේදී ගමන් බිමන් යෑමේදී සෑමවිටම මාර්ග නීතිවලට ගරුකරමින් සුපරික්ෂාකාරීව මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොරව රිය පදවන ලෙස පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඉල්ලා සිටී.

පසුගිය දිනවල දිනකට මාරක රිය අනතුරුවලින් සිදුවන මරණ සංඛ්‍යාව 16 දක්වා වර්ධනය වී තිබුණද මේ වන විට එය 07ක් දක්වා පහළ වැටී ඇති අතර එයද සතුටු විය හැකි මට්ටමක නොපවතින හෙයින් සෑම විටම සැලකිලිමත්ව රිය පදවන ලෙස පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඉල්ලා සිටී.





**දුටු විට මැති සබාවේ සිදු වන ගෝරි**
**පවතින උත්තරීතර බව ඇත තේරී**
**ඔතැනට ගිය පිරිස මහ සටනින් බේරී**
**යන බව පෙනේ යළි යුගයට වනචාරී**

**උපයෝගීව ඡන්දය සහ ලැයිස්තු**
**එන හැම දෙනම අප කළ යුතු නඩත්තු**
**එහි සිදු වුණොත් නුසුදුසු දේ සවුත්තු**
**දවසක ගහනු ඇත ගලවා සපත්තු**

රටේමුල්ලේ මුදන්නායක

**රට කරවන තැන උදවිය හිටි හැටියේ උරණ වුණේ**
**වසංගතේ අස්සේ මොන මොනවාටද ගැටෙනු පෙනේ**
**ඇත්තම වයිරස් හඳුනා ගන්නට බැරි එකනෙ හෙනේ**
**ඕවා ගැන හොයන්න බෑ නහය ළඟට ගලනු පෙනේ**



ගැහැමන් හාමි

## මල්වාන නගරයේ හදිසි ගින්නක්:

# නිවාස තුනක් හා වෙළෙඳසල් හතරක් දැවී අළු වෙයි



**මල්වාන සමුහ- මහානාම විතානගේ, දෙල්ගොඩ සමුහ- සුදත් පුබුදු කීර්ති සහ මල්වාන විශේෂ- එම්. ටී.එම්. හනෆි**

මල්වාන නගරයේ ඊයේ (23) පස්වරුවේ ඇතිවූ හදිසි ගින්නකින් නිවාස තුනක් හා වෙළෙඳසල් හතරක් ගින්නෙන් මුළුමනින්ම විනාශ වී තිබේ. මේ අවස්ථාවේ එම නිවෙස්වල හා වෙළෙඳසල්වල උදවිය මුස්ලිම් දේවස්ථානවල යාච්ඤා කිරීමට ගොස් සිටි නිසා කිසිවකුට අනතුරක් සිදු වී නැතැයි කියති.

මේ ගින්නෙන් බියගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. එම්. එස්. හසන් මහතාගේ (ශ්‍රී ල.මු. කො.) නිවෙස ඇතුළු නිවෙස් තුනක් ද රෙදි වෙළෙඳසල් තුනක් හා ප්ලාස්ටික් භාණ්ඩ වෙළෙඳසලක් විනාශ වී තිබෙන අතර එයින් සිදු වූ අලාභය රුපියල් කෝටි දෙකකට අධික වෙති.

මේ ගින්න මුලින්ම හටගෙන තිබෙන්නේ නිවෙසක මැද කාමරයක වන අතර පසුව එම ගින්න එයට යාබදව තිබෙන සෙසු නිවාස හා වෙළෙඳසල්වලට පැතිරී ගොස් ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් බියගම නිදහස් වෙළෙඳ කලාපයේ ගිනි නිවන ඒකකය, ගම්පහ මහා නගර සභාවේ ගිනි නිවන ඒකකය හා බියගම පොලිසිය මැදිහත් වී ප්‍රදේශවාසින්ගේ ද සහාය ඇතිව ගින්න සෙසු ප්‍රදේශවලට පැතිරී යෑම වළක්වා තිබේ.

මේ ගින්න පස්වරු 1.00ට පමණ හටගෙන තිබෙන අතර පැය දෙකක් පමණ ගින්න තිබූ අතර මෙය විදුලි කාන්දුවකින් සිදු වූ බවට සැක කරති. බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ. ජේ. එම්. ආර්. සමරසිංහ මහතා මේ සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 24 සෙනසුරාදා

# පළි ගැනීම් ගැන ඇත්ත කතාව

දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු විවාදය පසුගිය බ්‍රහස්පතින්දා පැවැත්විණි. එය අපගේ දේශපාලන ඉතිහාසයේ තවත් වැදගත් අවස්ථාවක් සේ සැලකිය හැකිය. ප්‍රජාතන්ත්‍රවාදය, නායකයන්ගේ හැසිරීම, රජය හා රාජ්‍ය පාලනය ගැන කරුණු සොයන කෙනකුට මේ විවාදය ඉතා වැදගත් වෙයි. දියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රටවල දේශපාලකයා තම ප්‍රතිමල්ලවයා විවේචනය කිරීම සඳහා රාජ්‍ය බලය යම් පමණකින් යොදා ගන්නේ වුව ප්‍රතිමල්ලවයා හා ඔහුගේ පවුල විනාශ කිරීම සඳහා එම බලය යොදා ගන්නේ නැත. එහෙත් යහපාලන ආණ්ඩුව ප්‍රතිමල්ලවයා පමණක් නොව, ප්‍රතිමල්ලවයාගේ පරම්පරාවම විනාශ කිරීම සඳහා රාජ්‍ය බලය යොදා ගෙන ඇති බව ඉහත විවාදයේදී හෙළිදරවු විය.

දේශපාලන පළි ගැනීම් පිළිබඳ මෑත කාලීන කතාන්දරයේ ආරම්භය එක්දහස් නවසිය හැත්තෑ ගණන් තෙක් අතීතයට ගමන් කරයි. 1977 ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව පරාජිත දේශපාලන ප්‍රවාහයෙන් දිගින් දිගටම පළි ගත්තේය. බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම හා විජය කුමාරතුංග සිරභාරයට ගෙන හිරිහැර කිරීම ජේ.ආර්. ජයවර්ධන සිදු කළ අපරාධ සේ අදටත් ගණන් ගනු ලැබේ. එම පාලන සමය තුළ රාජ්‍ය ආයතන තුළ සිදු වූ අමානුෂික දේශපාලන පළි ගැනීම් සියල්ල හෙළිදරවු වී නැත. ජේ.ආර්. එම පළි ගැනීම් සිදු කළේ ධර්මිෂ්ඨ සමාජය නම් බෝඩ් ලෑල්ලට මුවා වෙමින්ය. එලෙසම ඔහුට ලැබී තිබුණු හයෙන් පහක බලය ඒ සඳහා හොඳින් යොදා ගැනිණි.

දේශපාලන පළි ගැනීම් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පාදක කරගත් පාර්ලිමේන්තු විවාදය ආරම්භ කළේ ආණ්ඩු පක්ෂයේ මහජන නියෝජිතයන්ය. ඒ සඳහා අයිතියක් ද ආණ්ඩු පක්ෂයට තිබේ. 2015 ජනවාරි 08 දා පිහිටුවා ගත් යහපාලන ආණ්ඩුව සැලකෙන්නේ සුළුතර ආණ්ඩුවක් හැටියටය. එහි පැවැත්ම සඳහා ජනතා විමුක්ති පෙරමුණෙන් බරපතළ සහයෝගයක් ලැබිණි. යහපාලන ආණ්ඩුවේ අගමැති රනිල් වික්‍රමසිංහ ජනතා විමුක්ති පෙරමුණේ ද සහයෝගය ඇතිව ජාතික විධායක සභාවක් පිහිටුවීය. එලෙසම පොලිස් දෙපාර්තමේන්තුවට අලුත් විමර්ශන කොට්ඨාසයක් ද දුන්නේය. ඒ දෙකම ක්‍රියාත්මක වී ඇත්තේ රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රධානීන්ගෙන් පළි ගැනීම සඳහාය.

පළි ගැනීම යන්න තවත් ආකාරයකින් විග්‍රහ කළ හැකිය. එනම්: පුද්ගලයන් අකර්මණ්‍ය කිරීම සඳහා යන්නය. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය නිමා කොට රට එක්සේසත් කළ නායකයකු හැටියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට විශාල සමාජ පිළිගැනීමක් තිබිණි. එලෙසම ආරක්ෂක අංශවලට මෙන්ම ආරක්ෂක අංශවල ප්‍රධානීන්ට ද විශාල ජන ප්‍රසාදයක් තිබිණි. ත්‍රස්තවාදය පවතින සමයේ රනිල් වික්‍රමසිංහ යනු බොහෝ දෙනකුගේ අප්‍රසාදයට ලක් වූ දේශපාලන චරිතයකි. ඔහු තම අඩුව සපුරා ගන්නට රාජ්‍ය බලය යොදා ගත් බව පැහැදිලිය. යහපාලන ආණ්ඩු සමය තුළ රාජපක්ෂ පවුලෙන්ම පළිගත්තේය. ආරක්ෂක ප්‍රධානීන් හිරභාරයට පත් කැරිණි.

ඉහත කොමිෂන් සභා වාර්තාව සමාජගත වී නැතත් එහි සඳහන් තොරතුරු වාර්තා වන ආකාරයට රාජපක්ෂ පවුල දේශපාලනයෙන් ඉවත් කිරීම සඳහා කිසියම් රහස් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වී ඇත. බැසිල් රාජපක්ෂ අත්අඩංගුවට ගන්නේ මධ්‍යම රාත්‍රියේය. යෝෂිත රාජපක්ෂ අත්අඩංගුවට ගන්නේ හිමිදිරි පාන්දරය. නාමල් රාජපක්ෂ අත්අඩංගුවට ගන්නේ කිසිදු හේතු සාධකයක් සනාථ නොවූ තත්ත්වයක් යටතේය. මූල්‍ය අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට පිහිටුවූ මූල්‍ය අපරාධ පිළිබඳ පොලිස් කොට්ඨාසය නීත්‍යනුකූල ආයතනයක් නොවන බව සනාථ වී ඇත. ජාතික විධායක සභාව ක්‍රියාත්මක වූ ආකාරය ගැන එහි සාමාජිකයන් පවා දන්නේ නැත. හිටපු අගමැති රනිල්ගේ හා ඔහුගේ සමීපතමයන් කිහිප දෙනකුගේ සිතැඟි අනුව එහි තීන්දු තීරණ ගෙන ඇත.

යහපාලන ආණ්ඩුව යටතේ, පොලිසිය, අධිකරණය හා මූල්‍ය අපරාධ පිළිබඳ සොයා බලන විශේෂ පොලිස් කොට්ඨාසය ක්‍රියා කළ ආකාරය පිළිබඳ කිසියම් ඉඟියක් මන්ත්‍රී රන්ජන් රාමනායකගේ කුප්‍රකට දුරකතන සංවාද ඔස්සේ ගත හැකිය. පොලිස් ප්‍රධානයකු වන ශානි හා රනිල්ගේ සමීපතමයකු වන රන්ජන් අතර පැවැති දුරකතන සංවාදය මීට කදිම නිදසුනක් ලෙස ගත හැකිය. පොලිස් නිලධාරීන් දේශපාලකයන්ගේ න්‍යාය පත්‍ර ක්‍රියා කිරීමට දරන උත්සාහය එම දුරකතන සංවාදයෙන් පැහැදිලි වෙයි. එලෙසම පොලිස් නිලධාරීන් සඳහා යහපාලන ආණ්ඩුව අත් කර දීමට ගිය අමතර වාසි ගැන තොරතුරු එම දුරකතන සංවාදවලට ඇතුළත්ය. මේ කිසිදු සිද්ධියක් දැන් රහසක් නොවේ.

යහපාලන ආණ්ඩුව මහින්ද රාජපක්ෂ පාලනයට සම්බන්ධ සෑම පුද්ගලයකුගෙන්ම සූක්ෂ්ම ලෙස පළි ගත් බව පිළිගත හැකි කාරණයකි. ආණ්ඩුව පස මිතුරු දේශපාලකයන්ගෙන් මෙන්ම නිලධාරීන්ගෙන් ද පළි ගත්තේය. නිලධාරීන්ට සහාය දුන් සාමාන්‍ය චරිතවලින් ද පළි ගත්තේය. මේ හැරෙන්නට යහපාලන පාලන සමය තුළ රාජ්‍ය ආයතන වෙතින් ඉවත් කළ විශාල පිරිසක් ද සිටිති. මේ සියල්ල සඳහා වැය කර ඇත්තේ මහජනයාගේ මුදල්ය. මහජනයා සතු සම්පත් එලෙස විනාශ කළ හැකි ද යන්න තවත් ගැටලුවකි. කුමක් වුව දේශපාලන පළි ගැනීම් පිළිබඳ මෙරට ඉතිහාසයේ ඇත්ත කතාව පාර්ලිමේන්තු විවාදයේදී දිග හැරිණි.

ඉහත විවාදයේදී ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් සභාගත කළ වැදගත් අදහසක් තිබේ. එනම්, 'නුඹලා අපට කළ දෙය වෙනුවෙන් පළි ගන්නට අපි ඉදිරිපත් නොවෙමු' යන්නය.

දිල්රූගෙ සීවිද

නැති කර දමා දැනෙමින් තිබු සැනසිල්ල
එසවෙයි ටිකෙන් ටික දැන් තුන්වැනි රැල්ල
නොවනට නම් අපත් එහි ඊළඟ බිල්ල
දැන්වත් පරිස්සම වෙත දෙමු සැලකිල්ල

# ආසියානු රටවල් යළිත් වසා ගත් කොවිඩ් උවදුර

විදෙස් විත්ති විග්‍රහය

ලොව පුරා කොරෝනා වයිරසය ආසාදනයට ලක් වූවන්ගේ සංඛ්‍යාව මිලියන 145 ඉක්මවා තිබේ. වයිරසයට ගොදුරු වූ ජීවිත සංඛ්‍යාව මිලියන 3 පසු කර ඇත. මෙතෙක් සුවය ලබා රෝහල්වලින් පිටව ගිය සංඛ්‍යාව මිලියන 123ට වැඩිය. දෙවැනි වටය ව්‍යාප්ත වීමට පටන් ගැනීමත් සමඟ ඉන්දියාවේ නිර්මාණය වී ඇති තත්ත්වය අතිශයින් කනගාටුදායක වී තිබේ. වසංගත ව්‍යාප්තිය ඇරඹී ගෙවී ගිය වසරකට වැඩි කාල සීමාව තුළ ලොව කොතැනින් හෝ වාර්තා වූ දෛනික වැඩිම ආසාදිතයන් ගණන ද ඉකුත් බ්‍රහස්පතින්දා ඉන්දියාවෙන් වාර්තා විය. එම සංඛ්‍යාව තුන් ලක්ෂය ඉක්මවීය. එදින වාර්තා වූ මරණ සංඛ්‍යාව 2104කි. ඉන්දීය රජයේ සංඛ්‍යා ලේඛන දක්වන පරිදි මේ වන විට එරට ජනයාගෙන් කෝටි 13.5කට එන්නත් දී ඇත. ඉකුත් බ්‍රහස්පතින්දා තුළ පමණක් එන්නත් ලක්ෂ 30ක් දී තිබේ.

ඉන්දියාවේ රෝහල් ඇඳන් පිරී ගොස් ඇති අතර රෝගීන් සඳහා යොදා ගන්නා ඔක්සිජන්වල දැඩි හිඟයක් මතු වී තිබෙන බව වාර්තා විය. මේ හේතුවෙන් කාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට වෙන් කළ ඔක්සිජන් පවා අසාධ්‍ය රෝගීන්ට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් යොමු කර ඇතැයි ද වාර්තා වේ.

මේ වන විට, ඉන්දියාවේ පමණක් කොරෝනා වයිරසය විසින් ගොදුරු කරගත් ජීවිත සංඛ්‍යාව 185000ක් පමණ වේ. ඉන්දියාවේ සහ පාකිස්තානයේ සිට පැමිණෙන ගුවන් මගීන් සඳහා රටවල් ගණනාවක් තාවකාලිකව සංචාරක තහංචි පනවා ඇත. එන්නත්කරණ වැඩසටහන් ද දියත් වීමත් සමඟ වයිරසය සාර්ථකව පාලනය කරමින් සිටින බවක් පෙන්නුම් කළ ඉන්දියාවේ තත්ත්වය එක්වරම බේදනීය හැරෙන්න පටන් ගත්තේ වාර්ෂික කුම්භ මේලා උත්සවයෙන් අනතුරුවය. එම උත්සව සඳහා ජනතාව අතිවිශාල වශයෙන් ඒකරාශි වී සිටි අයුරු දැකගත හැකි විය.

ඉන්දියාවේ නවදිල්ලි අගනුවර ඉකුත් සති අන්තයේ ලොක්ඩවුන් කරන ලද අතර නැවතත් එය සතියක කාලයක් සඳහා දීර්ඝ කිරීම ද සිදුව ඇත. රෝහල් අසල දැකගත හැකි දසුන් අතිශයින් සංවේදීය. ගිලන් රථ තුළ මෙන්ම රෝහල්වලින් පිටතදී පවා රෝගීන්ට ප්‍රතිකාර කරන අතර ඇතැම් රෝගීන් රෝහල්වලට ඇතුළු කිරීමට පෙරදීම ජීවිතයෙන් සමු ගන්නා බව වාර්තා විය. පවතින තත්ත්වය යටතේ ලොව වැඩිම රෝගීන් හා මරණ සංඛ්‍යා වාර්තා වන දෙවැනි රට බවට ඉන්දියාව පත්ව ඇත. තවමත් එහි පළමු තැන ඇත්තේ අමෙරිකාවටය.

ඉන්දියාවේ මෙවැනි බියකරු තත්ත්වයක් පවතින අතර ප්‍රාන්ත මැතිවරණ ද යෙදී ඇත. මුම්බායි හි මැතිවරණ කටයුතු සඳහා අගමැති නරේන්ද්‍ර මෝදි දින කිහිපයකට පෙර එහි සංචාරය කිරීමට නියමිතව සිටි නමුත්, අගමැතිවරයා ට්විටර් පණිවිඩයක් මඟින් දන්වා තිබුණේ එම සංචාරය අත්හිටුවූ බවය. කෙසේ වුව ද, බටහිර බෙංගාලයේ ජනතාවගෙන් සිය ඡන්ද බලය භාවිත කරන ලෙස ඔහු ඉල්ලා තිබිණි. විදෙස් මාධ්‍ය වාර්තා කරන පරිදි බොහෝ රජයේ සහ පෞද්ගලික රෝහල් ඔක්සිජන් සපයන ලෙසට ඉල්ලීම් කර තිබේ. ඉකුත් බදාදා පමණක් දිල්ලියට ඔක්සිජන් ටොන් 500ක් සපයා තිබුණ ද දෛනික අවශ්‍යතාව ටොන් 700ක් පමණ වේ. එදිනට දිල්ලි අධිකරණය රජයට නියෝග කළේ කම්හල්වල සිට ඉන්දියාව පුරා රෝහල්වලට ඔක්සිජන් සැපයුම විධිමත්ව සිදු වන බවට වගබලා ගන්නා ලෙසටය. දිල්ලි මහ ඇමැති අර්වින්ද් කෙජ්‍රිවාල් පවසන පරිදි මේ වන විට ඔක්සිජන් ලැබෙමින් ඇති අතර එම සෑම සැපයුමක්ම රෝහල් වෙත දීමට ඔවුහු වෑයම් කරමින් සිටිති. ගුවන් මඟින්ද එම හදිසි සැපයුම් සිදු කිරීමට මේ වන විට පියවර ගෙන තිබේ.

කුම්භ මේලා, උත්සවයට ජනයා රැස් වූයේ මිලියන ගණනිනි. ඊට අමතරව දේශපාලන රැලි, ක්‍රිකට් තරග සහ මංගල උත්සව සඳහා ද ජනතාව විශාල ලෙස ඒකරාශි වූහ. මේ ප්‍රවණතාව අනතුරුදායක බව ජනතාව වටහා නොගත් සෙයක් පෙනෙන්නට තිබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවේ සෑම ප්‍රාන්තයකම පාහේ ලොක්ඩවුන් තත්ත්ව ප්‍රකාශයට පත් කර ඇති අතර ඇතැම් ප්‍රාන්තවල අත්‍යවශ්‍ය නොවන සියලු වෙළෙඳසල් සති අන්තයේ වසා දමා තිබේ. කල්කටා වැනි ප්‍රාන්තවල රෝහල් ඇඳන් හිඟ වී ඇති බව ද වාර්තා විය. නගරයේ සෑම රෝහලකම පාහේ ඇඳන් ගැනීම සඳහා අවම වශයෙන් 100 දෙනකුවත් අපේක්ෂාවෙන් සිටින බව සෞඛ්‍ය අංශවලින් පැවැසිනි.

මෙම පසුබිම යටතේ, මේ වර්ෂයේ මුල පටන් කොරෝනා වයිරසයට එරෙහි එන්නත් නිෂ්පාදනය ද යම් දුරකට මන්දගාමී වී හෝ නතර වී ඇති බව ද වාර්තා වේ. ඔක්සිජන් සැපයුම හිඟ වීම එම ක්‍රියාවලියට ද බලපා ඇත. මේ තත්ත්වය අයුතු ලාභ හා වාසි ගැනීම පිණිස කළු කඩ වෙළෙඳපොළට අවස්ථාවක් උදා කර තිබේ.

අමෙරිකාව සිය රටවැසියන්ට අවවාද කර ඇත්තේ අවම වශයෙන් එන්නත් මාත්‍රා 2 ම ගෙන අවසන්ව ඇත්නම් මිස ඉන්දියාවේ සංචාරය නොකරන ලෙසය. බ්‍රිතාන්‍ය රතු ලැයිස්තුවට ඉන්දියාව ඇතුළත් කර ඇති අතර හොංකොං සහ නවසීලන්තය ගුවන් ගමන් තහනම් කර තිබේ. ඕස්ට්‍රේලියාව ද ඉන්දියාවෙන් සිය රටට පැමිණෙන පුද්ගලයන් සඳහා දැඩි සීමා පැනවීමට ක්‍රියා කර ඇත. එවැනි පුද්ගලයන් නිරෝධායනයට යොමු කළ පසුව ඔවුන් අතරින් 40%ක් පමණ කොවිඩ් ආසාදිත පුද්ගලයන් ලෙස හඳුනාගැනෙන බව අගමැති ස්කොට් මොරිසන් පවසා තිබේ.

මැයි මස 1 වැනිදා වන විට අවුරුදු 18 ට වැඩි සියලු වැඩිහිටියන් එන්නත් ගැනීමට සුදුසු වන බව ඉන්දියාව ප්‍රකාශ කර ඇත. රජය ක්‍රියාමාර්ග ගනිමින් සිටිය ද උද්ගතව ඇති බරපතළ තත්ත්වය හමුවේ ඒවා ප්‍රමාණවත් නොවන බවට විවේචන එල්ල වෙමින් පවතී. ජනතාව මිය යන්නේ ඔක්සිජන් සැපයීමට රෝහල්වලට නොහැකි වී ඇති නිසා බවට මැසිවිලි නැඟෙමින් තිබේ. මේ චෝදනාව සත්‍ය බව පිළිගැනීමට සිදු වේ. අධිකරණයේදී ද ඒ බැව් පැහැදිලි විය.

අගමැති මෝදි නිලධාරින්ට උපදෙස් දී ඇත්තේ ප්‍රමාණවත් ලෙස ඔක්සිජන් සැපයුම සිදු වන බවට වගබලා ගන්නා ලෙසටය. ඊට අවශ්‍ය විධික්‍රම සොයා බලන ලෙස ද ඔහු ඉල්ලා තිබිණි. කෙසේ වුව ද, එය පහසු කාර්යයක් නොවන බව පෙනෙන්නට ඇත.

රට පුරා ලොක්ඩවුන් තත්ත්වයක් ප්‍රකාශ කිරීමත් මේ වන තෙක් සිදු වී නොමැත. ප්‍රාන්ත වශයෙන් පමණක් එම පියවර ගනිමින් තිබේ. ඉන්දියාවේ මූල්‍ය කේන්ද්‍රය ද වන මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ තත්ත්වය වඩාත් බරපතළය. එය කොවිඩ් - 19 උණුසුම් ස්ථානයක් බවට පත්ව ඇත. වසංගත ව්‍යාප්තියත් සමඟ එරටින් වාර්තා වූ ආසාදිත පුද්ගලයන් අතරින් ¼ ක්ම වාර්තා වූයේ එම ප්‍රාන්තයෙනි. මහා රාෂ්ට්‍රයේ කොවිඩ් මරණ සංඛ්‍යාව ද සෙසු ප්‍රාන්තවලට වඩා ඉහළය. උත්තර ප්‍රදේශය ගැන ද මේ වන විට වැඩි අවධානයක් යොමුව තිබේ. වැඩිම බලපෑමක් ඇති දිස්ත්‍රික්ක 5 ක් ලොක්ඩවුන් කරන ලෙසට අධිකරණය නියෝග කර ඇත. එම තීරණය පිළිබඳ අභියාචනයක් ඉදිරිපත් කිරීමට රජය පියවර ගෙන තිබිණි.

නේපාලයෙන් පළමු කොවිඩ් ආසාදිත පුද්ගලයා මීට දින කිහිපයකට පෙර වාර්තා විය. ඒ හිමාලය තරණය කිරීමට පැමිණි කණ්ඩායම් අතුරිනි. සති ගණනාවක් තිස්සේ කඳු තරණය අත්හිටුවා තිබූ අතර යළි එම අවසරය ලැබී ඇත්තේ දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේය. කත්මන්ඩු අගනුවරදී සිදු කළ පීසීආර් පරීක්ෂණවලින් කඳු නගින්නන් කීප දෙනකුම වයිරස ආසාදනයට ලක්ව ඇති බව හඳුනාගෙන ඇතැයි විදෙස් මාධ්‍ය වාර්තා කර තිබිණි. මේ තත්ත්වය හිමාලය කේන්ද්‍ර කර ගත් සංචාරක කර්මාන්තයට යළිත් බලපෑම් කරන බව පෙනෙන්නට ඇත. ඉකුත් වසරේදී ද ලොක්ඩවුන් තත්ත්වය නිසා එය විශාල පසු බෑමකට ලක් විය. කඳු තරණය සඳහා අවසර ලැබෙන්නේ පුද්ගල දුරස්ථභාවය පවත්වා ගැනීම පීසීආර් පරීක්ෂණ ආදිය සඳහා එකඟ වීම වැනි දැඩි ක්‍රියාමාර්ග යටතේය. කෙසේ වුව ද ඇතැම් අය මෙම උපදෙස් කඩ කරන තත්ත්වයක් ඇති බව මාධ්‍ය වාර්තා කර ඇත. සංචාරකයන් සඳහා අමතර රක්ෂණයක් හඳුන්වා දී ඇති බව ද මෙය මේ අන්දමින් විවෘත කර පවත්වා ගැනීම මිස අන් විකල්පයක් නැති බව ද නේපාල සංචාරක දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා පවසන්නේ, "අපට කඳුකර ආර්ථිකය පවත්වා ගැනීමටත් අවශ්‍යයි" යනුවෙන් දක්වමිනි. මෙතෙක් නේපාලය කොවිඩ් - 19 බලපෑමට හසු නොවූ තරම්ය.

ලාඕසය ද සිය අගනුවර ලොක්ඩවුන් කිරීමට පියවර ගෙන ඇත්තේ කොවිඩ් ව්‍යාප්තියේ බලපෑම පිළිබඳ සැලකිල්ලට ගනිමිනි. සිය දේශසීමා වසා දැමීමට ද ලාඕස බලධාරීහු පියවර ගත්හ. අසල්වැසි තායිලන්තයට යාබද ප්‍රදේශවලින් කොවිඩ් පොකුරු කිහිපයක් හඳුනා ගැනීම ඊට බලපෑවේය. විශේෂයෙන් අගනුවර වැසියන්ට නගරයෙන් බැහැරවීම ද, පිටස්තරයන්ට නගරයට ඇතුළු වීම ද තහනම් කර ඇත. ලොක්ඩවුන් රෙගුලාසිවලට අගමැති විසින් අත්සන් තබා තිබේ. දැඩි සීමා කිරීම් මැයි 5 වැනිදා තෙක් බලපැවැත්වෙනු ඇතැයි සඳහන් වේ.

ලාඕසයේ සමස්ත ජනගහනය මිලියන 7.5කි. ඉන් අගනුවර 700,000ක් පමණ වාසය කරති. ඉකුත් බදාදා අගනුවරින් හඳුනාගත් ආසාදිත පුද්ගලයන් ගණන 28ක් වන අතර ඒ සමඟ එරටින් වාර්තා වූ සමස්ත ආසාදිත සංඛ්‍යාව 88ක් විය. අසල්වැසි තායිලන්තය ද කොවිඩ් - 19 වසංගතයට එරෙහිව දැඩි සටනක යෙදී සිටින නමුත් රට පුරා ලොක්ඩවුන් තත්ත්වයක් ප්‍රකාශ කර නැත. බොහෝ පළාත්වලට ඇතුළු වන පිටස්තරයන් නිරෝධායන රෙගුලාසි පිළිපැදිය යුතුය. ඉකුත් බ්‍රහස්පතින්දා තායිලන්තයෙන් වාර්තා වූ ආසාදිත පුද්ගලයන් ගණන 1470කි. ඒ සමඟ එරට එම සමස්ත සංඛ්‍යාව 48000 පසු කළේය. මෙතෙක් 117 දෙනකු මරණයට පත්ව තිබේ.

මේ තත්ත්වය යටතේ ආසියානු කලාපයේ රටවල් ගණනාවක් වසංගත ව්‍යාප්තිය හමුවේ දැඩිව පීඩා විඳින බව පැහැදිලිය. එය කිසි සේත් බැහැර කළ නොහැකි තත්ත්වයකි. මෙය වඩාත් බේදනීය අන්තයකට ගමන් කිරීම වළක්වා ගැනීමට නම් සෞඛ්‍ය පහසුකම් නැංවීමට අමතරව පුද්ගලයන් ලෙස තනි තනිව තමන්ට පැවරෙන වගකීම සහ සමාජ වගකීමද බිඳකුදු නොපිරිහෙළා ඉටු විය යුතු බව ඉතා පැහැදිලිය. වසංගත යක්ෂයා පරාජය කළ හැකි වනු ඇත්තේ එවැනි හැඟීමකින් හා වගකීමකින් යුතුව එක්ව නැඟී සිටිය හොත් බව නොපමාව අවබෝධ කර ගත යුතුය.




> "මේ තත්ත්වය යටතේ ආසියානු කලාපයේ රටවල් ගණනාවක් වසංගත ව්‍යාප්තිය හමුවේ දැඩිව පීඩා විඳින බව පැහැදිලිය. එය කිසි සේත් බැහැර කළ නොහැකි තත්ත්වයකි. මෙය වඩාත් බේදනීය අන්තයකට ගමන් කිරීම වළක්වා ගැනීමට නම් සෞඛ්‍ය පහසුකම් නැංවීමට අමතරව පුද්ගලයන් ලෙස තනි තනිව තමන්ට පැවරෙන වගකීම සහ සමාජ වගකීම ද බිඳකුදු නොපිරිහෙළා ඉටු විය යුතු බව ඉතා පැහැදිලිය.

**ධම්මික සෙනෙවිරත්න**





# බ්‍රිතාන්‍යයෙන් පාකිස්තානයට රතු එළියක්

ත්‍රස්තවාදය යනු ඕනෑම රටක ආර්ථිකය හා සංවර්ධනය මුළුමනින්ම විනාශයට පත් කරන භයානක සතුරකු බව දශක තුනක එල්ටීටීඊ ත්‍රස්තවාදී යුද්ධයෙන් බැට කෑ ශ්‍රී ලාංකිකයෝ හොඳින් දනිති. රට අභ්‍යන්තරයේ පවතින සිවිල් යුද්ධ ගැටුම් සමථයකට පත් කිරීමට අන්තර්ජාතික මැදිහත්වීම් සිදුවෙද්දී එහි වාසිය සතුරාටත් එක සේ බෙදී යන බව ද අත්දැකීමෙන් දනිති. එහෙත් ගෝලීය ත්‍රස්තවාදය අරභයා මෑත කාලයේ සිට බොහෝ බටහිර රටවල් අනුගමනය කරමින් සිටින්නේ ඊට වඩා වෙනස් ක්‍රියාවලියකි. එවකට බොහෝ බටහිර රටවල් විසින් ඔවුනොවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුව බිහි කළ ඇතැම් ත්‍රස්තවාදී සංවිධාන පසුකාලීනව ඔවුන්ටම බූමරංගයක් වීමෙන් පසු ගෝලීය ත්‍රස්තවාදයට වැට බැඳීමේ ප්‍රතිපත්තියකට එළැඹී සිටී.

බ්‍රිතාන්‍යය විසින් පසුගියදා පාකිස්තානයට එරෙහිව අතිශය තීරණාත්මක පියවරක් ගනු ලැබුවේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ ද වැඩි අවධානය යොමු වූ එම තීරණය වන්නේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සපයන ඉහළ අවදානමක් සහිත රටවල් ලැයිස්තුවට පාකිස්තානය ඇතුළත් කිරීමය. එම ලැයිස්තුව බ්‍රිතාන්‍යය කාලයක් තිස්සේ නඩත්තු කරමින් සිටින අතර, පාකිස්තානය දැන් එහි 21 වැනි රට බවට පත් වී තිබේ. මීට පෙර යුරෝපා හවුල විසින් පවත්වාගෙන යනු ලැබූ එම ලැයිස්තුව බ්‍රිතාන්‍යයේ ස්වාධීන ලැයිස්තුවක් බවට පත් වූයේ ඔවුන් බ්‍රෙක්සිට් ක්‍රියාවලියෙන් ඉවත්වීමෙන් පසුවය.

## ත්‍රස්තවාදය පෝෂණය කිරීම

දශක ගණනාවක් මුළුල්ලෙහිම ත්‍රස්තවාදයට නොමසුරුව පෝෂණය වීමට හැකි අයුරින් නිදහස් පසුබිමක් සකස් කර දීමේ චෝදනාව පාකිස්තානයට එල්ල වන්නේ දිගු කාලයක සිටය. එබැවින් බ්‍රිතාන්‍යය ගත් මේ තීරණය තවත් රටවල් රැසක නව පිබිදීමක් ඇති කරලනු ඇතැයි මේ පිළිබඳ සටහනක් තබමින් දකුණු ආසියානු අධ්‍යයනයන් පිළිබඳ යුරෝපා පදනම (EFSAS) සිය වෙබ් අඩවියේ සඳහන් කළේය. එපමණක් නොව එවැනි පියවරක් ගත නොහැකිව 'වැට උඩ සිටින' තවත් රටවල් ගණනාවකට ඒ සම්බන්ධයෙන් ප්‍රංශ රජයෙන් ද උපදෙස් ලැබිය හැකි බව සඳහන් කර ඇත්තේ බ්‍රිතාන්‍යය ගත් තීරණය අනුගමනය කිරීමට තවදුරටත් දිරිගැන්වීමක් වශයෙනි. පාකිස්තාන අරභයා ගනු ලැබූ තීරණයකට ප්‍රංශය පැටලී ඇත්තේ උග්‍ර ප්‍රංශ විරෝධී උද්ඝෝෂණ මාලාවක් පසුගිය දින කිහිපය තුළ රට පුරා ව්‍යාප්තව ඇති බැවිනි. එය මෙහෙයවනු ලබන්නේ පාකිස්තානයේ දැඩි අන්තවාදී කණ්ඩායමක් බව කියැවේ. මේ උණුසුම් තත්ත්වය හමුවේ තම තමන්ගේ ආරක්ෂාව උදෙසා වහාම රටින් පිටවන ලෙස එරට රැඳී සිටින සියලු ප්‍රංශ ජාතිකයන්ට අනතුරු ඇඟවීමක් ද ප්‍රංශය විසින් සිදු කරනු ලැබීය.

බ්‍රිතාන්‍යය විසින් පාකිස්තානය ත්‍රස්තවාදයට අනුබල සපයන ඉහළ අවදානමක් සහිත රටක් ලෙස ලේබල්ගත කරනු ලැබුවේ මෙවැනි පසුබිමකදීය. එය එක් අතකින් සාමයට ලැදි ලෝක ප්‍රජාවගේ හිත සුව පිණිස වනු ඇත. අනිත් අතට පාස්කු ප්‍රහාරයෙන් පසු මෙරට අයිඑස් ත්‍රස්තවාදය ව්‍යාප්ත වෙමින් ඇති බවට අනාවරණය වීමෙන් පසු ශ්‍රී ලංකාව ද නව ත්‍රස්තවාදයකට මුහුණ පා සිටින බැවින් බ්‍රිතාන්‍යය ගත් තීරණය ශ්‍රී ලංකාවට ද වැදගත් එකකි.

ත්‍රස්තවාදය මැඬ පැවැත්වීමට අසමත්ව සිටින ඉහළ අවදානමක් සහිත රටවල් 21ක ලැයිස්තුවට උතුරු කොරියාව, සිරියාව, බාබඩෝස්, යේමනය, මියන්මාරය, ඉරානය, මොරිසස් රාජ්‍යය, මොරොක්කෝව, පැනමා, කාම්බෝජියාව, ජැමෙයිකාව, ඝානා, නිකරගුවා, සෙනෙගල්, උගන්ඩාව, බොස්වානා, ඇල්බේනියා, කේමන් දූපත් සහ සිම්බාබ්වේ වැනි රටවල් ද ඇතුළත්ය.

පාකිස්තානය මේ රටවල් අතරට ඇතුළත් කිරීමට පෙර ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මැඬ පැවැත්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස එරට රජයට ත්‍රස්ත විරෝධී විවිධ ගෝලීය සංවිධාන අනතුරු අඟවා තිබුණේ බොහෝ කලෙක සිටය. ගෝලීය සෝදිසිකරුවන් ලෙස හඳුන්වනු ලබන මූල්‍යමය කටයුතු පිළිබඳ විශේෂ කාර්ය බළකාය (FATF) නුසුදුසු මූල්‍ය පරිහරණය සහ අයෝජන සම්බන්ධව කාලයක සිට grey list නමින් ලැයිස්තුවක් පවත්වාගෙන යමින් සිටින අතර, පාකිස්තානය ද ඊට ඇතුළත්ය. එම වාර්තාව ද බ්‍රිතාන්‍යය සැලකිල්ලට ගත් බවක් පෙනේ.

## කළු සල්ලි ගලා ඒම

ඒ අනුව පාකිස්තානය ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට ඉහළ අවදානමක් ඇති රටවල් ලැයිස්තුවට ඇතුළත් වූයේ අවස්ථා ගණනාවකදීම ත්‍රස්තවාදයට වැට බැඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සිදු කළ බලකිරීම් ගණනාවකට පසුවය.

> පාකිස්තානය හමුවේ ඇත්තේ සුළුපටු අභියෝගයක් නොවේ. අන්තර්ජාතික ප්‍රජාව අතර විනිවිදභාවයකින් යුතුව කටයුතු කරමින් සිය රටෙහි පෝෂණය වන ගෝලීය ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ කාර්යභාරය හා වගකීම ඇත්තේ පාකිස්තානයටම පමණි.

එමෙන්ම කිසිදු බාධාවකින් තොරව එක දිගටම පාකිස්තානයෙන් බ්‍රිතාන්‍යයට 'කළු සල්ලි' ගලා ඒමත් බ්‍රිතාන්‍යයේ සැලකිල්ලට භාජනය වී තිබිණි. බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරය සහ ස්වදේශ කටයුතු කාර්යාලය විසින් සකස් කරන ලද 'මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී මූල්‍යකරණය පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව - 2020' වාර්තාවට අනුව "දූෂිත විදේශීය ප්‍රභූන් විවිධ ස්වරූපයෙන් එක්සත් රාජධානියේ සහ සෙසු රටවල දේපල වෙළෙඳපොළ වෙත, විශේෂයෙන් ලන්ඩනය වෙත අඛණ්ඩව සංක්‍රමණය වෙමින් සිටී. අපරාධකරුවන් විසින් දේපළ වෙළෙඳාම්, වටිනා මැණික් හා ස්වර්ණාභරණ වැනි ඉහළ වටිනාකම් සහිත වත්කම් මිල දී ගැනීම සඳහා පාකිස්තානයේ සිට බ්‍රිතාන්‍යයට 'කළු සල්ලි' පොම්ප කරමින් සිටී. දූෂණය හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් ලැබෙන මුදල් ඊට ඇතුළත් ය.

පසුව එම මුදල් විවිධ මුදල් ජාවාරම් හා මූල්‍ය සේවා ව්‍යාපාර (MSBs) හරහා නැවත බ්‍රිතාන්‍යයේ සිට පාකිස්තානයට ගලා යමින් තිබෙන බවත්, දෙරට අතර පවතින ආර්ථික හා සංස්කෘතික සබඳතා මුවාවෙන් එම නීතිවිරෝධි කටයුතු සිදුවන බවත් එම වාර්තාවෙන් කියැවේ. එම මුදල් වැඩිපුරම සංසරණය වන රටවල් ලෙස පාකිස්තානය, චීනය, හොංකොං, රුසියාව සහ එක්සත් අරාබි එමිර් රාජ්‍යය හඳුනාගෙන ඇත.

බ්‍රිතාන්‍යය විසින් තම රට ත්‍රස්තවාදයට වැට බැඳීමට අසමත් ඉහළ අවදානමක් ඇති රටක් ලෙස ලැයිස්තුගත කිරීම සම්බන්ධව පාකිස්තානය මුරණ්ඩු ප්‍රතිචාරයක් දක්වනු ලැබ ඇතැයි ද දකුණු ආසියානු අධ්‍යයනයන් පිළිබඳ යුරෝපා පදනම සිය වෙබ් අඩවියේ පළ කළ ලිපියෙහි වැඩිදුරටත් සඳහන් වෙයි. එය යථාර්ථයක් ලෙස පිළිගැනීමට පාකිස්තානය අකමැත්තක් දක්වන බව ද එහි සඳහන්ය.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය සහිත අධි අවදානම් රටවල් ලැයිස්තුවට පාකිස්තානය ඇතුළත් කිරීමට බ්‍රිතාන්‍යය කටයුතු කිරීම නිසි තක්සේරුවක පදනම්ව සිදු වූවාක් නොවන බව පාකිස්තාන විදේශ කාර්යාලය කළ ප්‍රකාශයක් ද එම වෙබ් අඩවිය උපුටා දැක්වීය. පාකිස්තානය පෙර නොවූ විරූ අයුරින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් යෙදවීම වැළැක්විම සඳහා ව්‍යවස්ථාදායක, ආයතනික හා පරිපාලනමය වශයෙන් ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇතැයි ද පාකිස්තාන විදේශ කාර්යාලය අවධාරණය කර ඇතැයි දකුණු ආසියානු අධ්‍යයනයන් පිළිබඳ යුරෝපා පදනම සිය වෙබ් අඩවියේ පළ කළ ලිපියෙහි දැක්වෙයි.

එහෙත් මේ ප්‍රකාශය සම්බන්ධව ප්‍රශ්න කරන එම වෙබ් අඩවිය විමසා සිටින්නේ එවැනි 'පෙර නොවූ විරූ අයුරින්' ක්‍රියාමාර්ග ගත්තේ නම් මූල්‍යමය කටයුතු පිළිබඳ විශේෂ කාර්ය බළකාය මේ වසරේ පෙබරවාරි මාසයේ පැවැති ඔවුන්ගේ සම්මන්ත්‍රණ සැසියේදී නුසුදුසු මූල්‍ය පරිහරණය සහ අයෝජන සම්බන්ධ grey list ලැයිස්තුවෙන් පාකිස්තානය ඉවත් කිරීමට කටයුතු නොකරනු ලැබුවේ මන්ද කියාය.

## යුරෝපා පදනම

ත්‍රස්තවාදයට මුදල් යෙදවීම වැළැක්වීම සඳහා පාකිස්තානය විසින් අනුගමනය කරන ලදැයි කියනු ලබන ක්‍රියාමාර්ගවල බරපතළ අඩුපාඩු පවතින බව එම සම්මන්ත්‍රණයේදී දැඩි අවධානයක් යොමු කර ඇත. ත්‍රස්ත මූල්‍යකරණය හා මුදල් විශුද්ධිකරණය පිළිබඳ පාකිස්තානය වැඩි අවධානයක් යොමු නොකිරීමෙන් පැහැදිලි වන්නේ ඔවුන් සිය භූමියේ පෝෂණය වෙමින් සිටින ත්‍රස්තවාදී සංවිධාන විනාශ කිරීම ගැන බැරෑරුම්ව නොසිතන බව ඉන් පැහැදිලි වන්නේ යැයි දකුණු ආසියානු අධ්‍යයනයන් පිළිබඳ යුරෝපා පදනම අවධාරණය කරයි.

පාකිස්තාන ස්ථාවරයෙහි දෙබිඩි බව මෙන්ම මූලධර්මවාදයට හා ත්‍රස්තවාදයට සහාය දැක්වීමේ ප්‍රතිපත්තිය තුළ පවතින දුෂ්කරතා නිසා බ්‍රිතාන්‍යය විසින් තම ලැයිස්තුවට පාකිස්තානය ඇතුළත් කිරීම ඔවුන් යම් තරමකින් ප්‍රතික්ෂේප කිරීමකට උත්සාහ දරමින් සිටින බවට ද චෝදනා එල්ල වී තිබේ.

ඒ අනුව බැලීමේදී පාකිස්තානය හමුවේ ඇත්තේ සුළුපටු අභියෝගයක් නොවේ. අන්තර්ජාතික ප්‍රජාව අතර විනිවිදභාවයකින් යුතුව කටයුතු කරමින් සිය රටෙහි පෝෂණය වන ගෝලීය ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ කාර්යභාරය හා වගකීම ඇත්තේ පාකිස්තානයටම පමණි. ඒ සඳහා ඔවුන් විසින් ගත යුතු ප්‍රධානතම පියවර වන්නේ බ්‍රිතාන්‍ය ලැයිස්තුවෙන් සිය රට ඉවත් කරගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමය. බ්‍රිතාන්‍යය විසින් සිදු කරනු ලැබුවේ කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කියන පාකිස්තානයට නැවත සිය කීර්තිය විදහා දැක්වීමට අවස්ථාව ලබා දීමකි. ඉන් උපරිම ඵල නෙළා ගැනීම දැන් පාකිස්තානයට ඇති වගකීමකි. ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවල ව්‍යාප්ත වෙමින් තිබෙන ඉස්ලාම් අන්තවාදී ත්‍රස්තවාදයට වැට බැඳීමට ද එය විශාල සාධකයක් වනු ඇත. ඒ අනුව බැලීමේදී සිය භූමියේ පෝෂණය වන ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට පාකිස්තාන රජය ගන්නා ක්‍රියාමාර්ගවල සැබෑ ප්‍රතිඵල භුක්ති විඳීමට ලැබෙන්නේ බ්‍රිතාන්‍ය ප්‍රමුඛ බටහිර රටවලට නොව ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවලට බව ඉඳුරාම පැවැසිය හැකිය.

**ෆවුස් මොහොමඩ්**




# ඉන්දියාවේ සුසුම් රැලි අහිමි කළ කොවිඩ් රැල්ල



කොරෝනා වසංගතය ගැන කතා නොකරම බැරි තත්ත්වයක් මතුව තිබේ. එහිලා ඉන්දියාවේ මේ වන විට මතුව ඇති බරපතළ වසංගත තත්ත්වය වෙත අවධානය යොමු නොකළ හොත් විශාල අඩුවකි. පැය විසි හතරකට කොරෝනා ආසාදිතයන් 314,835ක් වාර්තාවන ඉතාමත් බරපතළ තත්ත්වයක් එහි මේ වන විට පවතී. කොරෝනා වසංගතය තදින් පැතිර යන රටවල් අතරේ, පැය විසිහතරකට වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වූ අවස්ථාව එය විණ. පැය විසිහතරකට කොරෝනා මරණ 2,104කට ආසන්න සංඛ්‍යාවක් ඉන්දියාවේ සිදුවන බව නවතම සංඛ්‍යා ලේඛනවලින් අනාවරණය වේ. එහි මිලියන 16කට අධික සංඛ්‍යාවකට කොරෝනා ආසාදනය වී ඇති බව ද වාර්තා වෙයි. ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල රෝහල් රෝගීන්ගෙන් පිරී ඉතිරී පවතී. රෝහල්වල පවත්නා සම්පත් ද ප්‍රමාණවත් නොවන අවස්ථා ද මතුව ඇත.

ඉන්දියාවේ දිල්ලි නුවර රෝහල් රැසකට ඔක්සිජන් පවා උග්‍ර ලෙස හිඟ වී ඇති බව බී.බී.සී. ප්‍රවෘත්ති සේවය ඊයේ වාර්තා කළේය. ඔක්සිජන් නොමැති වීම නිසා ආසාදිතයන් මිය යන තත්ත්වයක් ද දිල්ලි නුවර දක්නට ලැබෙයි. දිල්ලි නුවර රෝහල්වල දැඩි සත්කාර ඒකකවල ඉඩ පහසුකම්වලින් 99%ක්ම රෝගීන්ගෙන් පිරී ගොස් තිබේ. දිල්ලියේ රෝහල්වල පවත්නා වත්මන් පරිසරය ඉන්දීය දේශපාලනඥයකු වන සවුරබ් භාරද්වජ සිය ට්විටර් ගිණුමේ සටහනක් තබමින් විස්තර කර තිබිණ. ඔහු ද කොරෝනා ආසාදිතව දිල්ලියේ රෝහලක ප්‍රතිකාර ලබන බව සඳහන් වේ.

"... හුඟක් රෝගීන් ඔක්සිජන් මත යැපෙනවා. ඔක්සිජන් හිඟය නිසා මිනිස්සු මිය යන්නේ දියෙන් ගොඩට දාපු මාළුන් ඔක්සිජන් නැතිව මිය යනවා වගේ..." යැයි ඔහු එහි සඳහන් කර තිබුණි.

මේ අතර මෘත දේහ ආදාහනය කිරීම සඳහා දිල්ලියේ වැසියන් මහත් වෙහෙසක් ගන්නා අන්දම පිළිබඳව රොයිටර් පුවත් සේවය වාර්තා කර තිබිණ. දිල්ලියේ බොහෝ ආදාහනාගාරවල සේවකයෝ මෘත දේහ සමූහ වශයෙන් බහා ආදාහන කටයුතු සිදු කරති. ඔවුන්ට දිවා - රෑ දෙකෙහිම මෘත දේහ ආදාහන කටයුතුවල නිරත වන්නට සිදුව තිබේ.

"... කොරෝනා පළමු රැල්ල පැතිරිලා යන විට මේ සුසාන භූමියට ගෙන ආවේ සාමාන්‍යයෙන් මෘතදේහ 8ත් 10ත් අතර සංඛ්‍යාවක්. අද තත්ත්වය හුඟක් භයානකයි. ඊයේ රෑ පමණක් අපි දේහයන් 78ක් ආදාහනය කරන්න කටයුතු කළා... තැනින් තැන මළ කඳන් දකින්න ලැබෙනවා. ඒවා ආදාහනය කරන්න තැන් නැහැ. මේක හරිම නරක කාලයක්..." යනුවෙන් පවසන්නේ දිල්ලි නුවර ආදාහනාගාරයක සේවය කරන ජිතේන්ද්‍ර සිං ශුන්ටිය.

වෛද්‍ය ප්‍රතිකාර ඉතා හොඳින් කෙරෙන නගරයක් ලෙස සැලකෙන දිල්ලියේ තත්ත්වය එබඳුය. දකුණු ඉන්දියාවෙහි ඇත්තේ ද එයටම සමාන තත්ත්වයකි. දකුණු ඉන්දියාවේ, රජයට අයත් රෝහල්වල වෛද්‍යවරුන්ට සේවය කරන්නට සිදුව තිබෙන්නේ දැඩි මානසික පීඩනයන් මධ්‍යයේය. එහි වෛද්‍යවරයකු මාධ්‍යට පවසා තිබුණේ මෙවැන්නකි.

"... රෝගීන් වෛද්‍යවරුන්ට පහර දෙන තත්ත්වයක් මෙහි මතුව තිබෙන්නේ. රෝගීන් සහ ඔවුන්ගේ භාරකරුවන් හැම දෙයකටම දොස් නඟන්නේ වෛද්‍යවරුන්ට. ඒ විතරක් නොවෙයි, රෝහල් පාලනාධිකාරියත් චෝදනා නඟන්නේ වෛද්‍යවරුන් වෙත. ඒ නිසා වෛද්‍යවරුන්ට දැඩි මානසික පීඩනයක් යටතේ ප්‍රතිකාර කටයුතු කරගෙන යන්න සිදුව තිබෙන්නේ. අප සතුව ඇති ඔක්සිජන්වලින් 99%ක් පාවිච්චි කරලා තිබෙන්නේ. තවත් 1%ක් පමණයි ඉතිරිව ඇත්තේ. හරිම කනගාටුදායක තත්ත්වයක්..."

දිල්ලි නුවර ජීවත් වූ අනූ හැවිරිදි හර්බන්ස් කවුර් මාතාව කොරෝනා ආසාදිතව ජීවිතක්ෂයට පත් වූයේ කාත් කවුරුවත් නැතිව අසරණවය. ඈ සමඟ විසූ පවුලේ සාමාජිකයෝ හත්දෙනෙකුම ආසාදිත තත්ත්වයට පත්ව සිටියහ. හර්බන්ස් කවුර් මාතාව රෝහල් ගත කළ යුතු වුවත් රෝහල් බලධාරීහු ඈ අසල පවුලේ කෙනෙකු නවතා තැබිය යුතු බවට බල කළහ. හර්බන්ස් කවුර් මාතාවට රෝහලේදී ඇප උපස්ථාන කරන්නට පවුලේ කිසිවකුට හැකියාවක් නොතිබිණ. ඒ, ඔවුන් ද කොරෝනා ආසාදිතව සිටි බැවිනි. අවසානයේදී හර්බන්ස් කවුර් මාතාව ප්‍රතිකාරයක් තබා කිසිවකුගේ සැලකිල්ලක් ද නොලබා මෙලොව හැර ගියාය. පවුලේ අය ඇගේ දේහය ආදාහනය කරවා ගත්තේ මේ විපත්තිදායක අවස්ථාවේදී සමාජ සත්කාරක වැඩපිළිවෙළ සංවිධානය කරන ආයතනයක පිහිටෙනි.

දිල්ලි නගරයේ ස්ථාපිත රජයේ රෝහල්වල ඔක්සිජන්, අවශේෂ වෛද්‍ය මෙවලම් සහ ප්‍රතිකාර හිඟ වූවත් එහි පෞද්ගලික රෝහල්වලින් ආසාදිතයන්ට තවමත් ප්‍රතිකාර ගන්නට පහසුකම් ඇත. එහෙත් පැරසිටමෝල් පෙත්තක් ගන්නට මුදල් නැති අසරණයන්ට පෞද්ගලික රෝහල්වලින් ප්‍රතිකාර ගන්නට වාරුවක් නොවේ. එනිසා එළඹෙන තත්ත්පරය, බහුතරයක් දුගීන්ගේ සහ මධ්‍යම පන්තික ජනයාගේ ජීවත් වීම තීරණය කෙරෙන අතිශයින්ම භයානක මොහොතයි. භාරතීයයන් මේ වන විට අත්විඳිමින් සිටින තත්ත්වය මෙරට සිටින ඔබ මැනැවින් තේරුම් ගත යුතුම මොහොත දැන් එළඹ ඇත. කොරෝනා වයිරසයෙන් ඈත් වී සිටීමට ගත හැකි සෑම පියවරක්ම අනුගමන කරන මෙන් අපි මහත් ඕනෑකමින් ඔබට මතක් කර සිටිමු.

**මංජුලා විජයරත්න**
BBC ඇසුරෙනි

# මැති සබේ ගැටුම විමර්ශන කමිටුවේ සභාපති සියඹලාපිටිය

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සහ පරිශ්‍රය තුළ ඉකුත් 21දා වූ සිද්ධි පිළිබඳ සොයා බලා ඒවාට ගත යුතු පියවර කවරේද යන්න නිර්දේශ කිරීම සඳහා නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇත.

එමෙන්ම ඉදිරියේදී එවැනි සිද්ධීන් ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න නිර්දේශ කිරීමද එම කමිටුවට පැවරෙන වගකීමක් බව කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවට ඊයේ (23) දැනුම් දුන්නේය .

කැබිනට් ඇමැතිවරුන් වන චමල් රාජපක්ෂ, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල යන මහත්වරුන්ද, රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතාද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අනුර ප්‍රියදර්ශන යාපා, ඉම්තියාස් බාකීර් මාකාර්, ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර, එම්. ඒ. සුමන්තිරන් යන මහත්වරුන්ද මේ කමිටුව සඳහා ඇතුළත් බව කථානායක මහින්ද යාපා අබේඅවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.

## ප්‍රවීණ ඡායාරූප ශිල්පී සමන් චන්ද්‍රප්‍රිය මිය යයි



ප්‍රවීණ ඡායාරූප ශිල්පියකු හා නිදහස් මාධ්‍යවේදියකු වන සමන් චන්ද්‍රප්‍රිය මහතා (51) අභාවප්‍රාප්ත විය. අවසන් කටයුතු අද (24) සවස 5.00ට අක්මීමන ආදාහනාගාරයේදී සිදු කිරීමට නියමිතය. දේහය ගාල්ල, බටදූව, ශ්‍රී සුමංගල මාවතේ පිහිටි සිය නිවෙසේ තැන්පත් කොට ඇත.

# ගෙවුණු මාස 4ට අල්ලස් පැමිණිලි 917ක්

සුභාෂිණී සේනානායක

අල්ලස් ගැනීමේ සිද්ධීන්ට අදාළව පැමිණිලි 917ක් මේ වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ ලැබී ඇතැයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රකාශකයෙක් දිනමිණට ඊයේ (23) ප්‍රකාශ කළේය.

මාස හතරක කාලයක් තුළ කොමිසමට ලැබුණු පැමිණිලි අතරින් පැමිණිලි 337ක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පියවර ගෙන තිබෙන බවද හෙතෙම පැවසීය.

ඉන් 276ක්ම අල්ලස් හා දූෂණ චෝදනා සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පැමිණිලි වන බවත් සෙසු පැමිණිලි අතුරින් 61ක් වත්කම් සම්න්ධයෙන් ලැබී ඇති පැමිණිලි බවත් කොමිසමේ ප්‍රකාශකයා කීවේය.

අදාළ පැමිණිලි සම්බන්ධයෙන් කළ විමර්ශනවලදී ඊට සම්බන්ධ සැකකරුවන් 18 දෙනකු අත්අඩංගුවට ගෙන තිබෙන බවත් විමර්ශනයට ලක් කෙරෙන පැමිණිලිවලට අදාළව ගෙන ඇති අල්ලස් මුදල රුපියල් නව ලක්ෂ 42,500ක් ලෙස ගණනය කර ඇති බවත් අල්ලස් කොමිසමේ ප්‍රකාශකයා වැඩි දුරටත් සඳහන් කළේය.

# සහරාන්ගේ මාමණ්ඩිය ඇතුළු දෙදෙනෙක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සහ ප්‍රධාන අපරාධකරු වන සහරාන් හෂීම්ගේ බිරියගේ පියා ඇතුළු සහරාන් මෙහෙයවූ අන්තවාදී දේශන සඳහා සහභාගි වූ තවත් පුද්ගලයන් දෙදෙනකු ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් පෙරේදා (22) කුලියාපිටිය කැකුණගොල්ල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබේ.අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 40, 52 සහ 55ක් වන අය වෙති.

සහරාන් හෂීම් විසින් 2018 වසරේ සිට ඔහුගේ අනුගාමිකයන් යොදවා දිවයිනේ විවිධ ප්‍රදේශවල අන්තවාදී පන්ති පවත්වා ඇති අතර, අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනා ඒවාට සහභාගි වී ඇති අය බව විමර්ශනවලදී අනාවරණය වී ඇත.අත්අඩංගුවට ගත් සැකකරුවන් රඳවා තබා ගැනීමේ නියෝග ගෙන ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසයේ රඳවා ප්‍රශ්න කිරීමට නියමිතය.

# නව ප්‍රභේදයක් විද්‍යාත්මකව හඳුනාගෙන නෑ

## රවි කුමුදේශ්

උපාලි කරුණාරත්න

කොවිඩ් ප්‍රභේද හඳුනා ගැනීම පිළිබඳ පර්යේෂණ කිරීමේ හැකියාවක් මෙරට සෞඛ්‍ය අමාත්‍යාංශයේ රසායනාගාරවලට නොමැති බැවින් නව කොවිඩ් ප්‍රභේදයක් තිබෙන බවට පැවසීම විද්‍යාත්මක සත්‍යයක් නොවන බව වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ වෘත්තිය වේදීන්ගේ සංගමයේ සභාපති රවි කුමුදේශ් මහතා දිනමිණට ඊයේ (23) පැවසීය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පමණක් යම් තරමකට එවැනි පර්යේෂණ කර තිබුණත් එය ජාතික වශයෙන් කළ දෙයක් නොවන බවත් පැවසූ ඒ මහතා, ජනතාවට කොවිඩ් බෝ වන ප්‍රමාණ වැනි දේ බලා අලුත් ප්‍රභේදයක් හමු වූ බව පවසන බව කී ඒ මහතා, ප්‍රභේද හඳුනා ගැනීමේ පර්යේෂණයක් ජාතික වශයෙන් කරන තුරු අලුත් කොවිඩ් ප්‍රභේද පිළිබඳ අපට කතා කළ නොහැකි බවද කීවේය.

01 වැනි පිටුවෙන්...

## රට වහන්නේ නෑ...

අත්‍යවශ්‍ය හේතුවකට හැර දිස්ත්‍රික් අතර ගමනාගමනය සීමා කරන ලෙසද ජනතාව එක්රැස් වීමෙන් හැකිතාක් දුරට වැළකී නිවෙසට වී සිටින ලෙසද හමුදාපතිවරයා කීවේය.

එමෙන්ම විවිධාකරයේ උත්සව සහ විනෝද චාරිකා සංවිධාන කර ඇත්නම් ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් එම කටයුතු නවතා දමන ලෙසද හෙතෙම පැවසීය.

නමුත් රෝගීන් සැලකිය යුතු ප්‍රමාණයක් හමු වන ප්‍රදේශ පමණක් හුදෙකලා කිරීමට හෝ නිරෝධායන නීති පනවා රෝගය පාලනය කිරීමට කටයුතු කරන බවද හෙතෙම කීවේය.

ජනතාව බහුතරයක් මුඛ ආවරණ පැලඳ සිටියද එය අනුගමනය නොකරන පිරිස් දක්නට ලැබෙන බවත් අලුත් අවුරුදු සමය අවසන් වන තෙක්ම දිනකට හමු වන කොවිඩ් 19 ආසාදිතයන් සංඛ්‍යාව 150ත් 200ත් අතර ප්‍රමාණයකට පාලනය කිරීමට සෞඛ්‍ය අංශ පියවර ගෙන තිබූ බවත් ඒ මහතා කීවේය.

අවුරුද්ද නිමාවීමත් සමග ගත වූ දින කිහිපයේදී ආසාදිතයන් වාර්තාවීම ඉහළ අගයක් ගෙන ඇතැයි පැවසූ ඒ මහතා, කුලියාපිටිය, ගනේවත්ත, වත්තල, දිවුලපිටිය වැනි ප්‍රදේශවලින් වැඩි ප්‍රමාණයක් රෝගීන් හමු වූ අතර, කොළඹ ගම්පහ කුරුණෑගල, කළුතර, ගාල්ල, මහනුවර, පුත්තලම, යාපනය, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලින් අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව ආසාදිතයන් වැඩිවීමක් පෙනෙන්නට තිබෙන බවත් කීවේය.

එම තත්ත්වය සලකා බැලීමේදී ඉදිරි දින කිහිපයේ ආසාදිතයන් වැඩි වීමේ ප්‍රවණතාවක් ඇති බවත් ඊයේ (23) දින ශ්‍රී ලාංකිකයන් 1,100ක් විදේශවල සිට මෙරටට පැමිණි අතර, ඔවුන් අතරින් මේ රෝගීන් වාර්තා වුවත් ඔවුන් මෙරටට ගෙන්වීම වැළැක්විය නොහැකි බවත් කීවේය.

සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය,

මෙතෙක් ශ්‍රී ලංකාවේ පැවති කොවිඩ් ප්‍රභේදයට වඩා දරුණු වයිරසයක් පැතිරෙන බව සෞඛ්‍ය අංශ වාර්තා කර තිබෙනවා. ඔවුන් එම වයිසරය හඳුනා ගැනීමේ කටයුතු මේ වන විට කරමින් ඉන්නවා. මේ අවස්ථාවේ රටේ ජනතාවගෙන් කලින් අප රෝගය පාලනය කිරීමේදී ගත් උත්සාහයට දුන් සහයෝගය එලෙසින්ම බලාපොරොත්තු වෙනවා. වන්දනා ගමන්, පුද්ගලික සැමරුම් ඉදිරි සතියේදී පාලනය කරන්නැයි ඉල්ලා සිටිනවා. රෝගයට පාත්‍ර වූ මා එහි භයානකකම දැක්කා. අත්වින්දා, ලෝකය කුමන මගක ගියත් ඉදිරි මාස තුනක කාලය අප පාලනයකින් කටයුතු කරමින් ජාතික වගකීම ඉටු කරමු. රෝහල් පහසුකම් සැපයීම, එන්නත් කරණය, ඔක්සිජන් පහසුකම්, දැඩි සත්කාර පහසුකම් සැලසීම ආදියට කැපවීමට රජයක් ලෙස අප කටයුතු කරනවා.

**ජනමාධ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල මහතා,**

ලෝකයේ ඇති කොවිඩ් අවධානය පිළිබඳ අප විශ්ලේෂණාත්මක වැඩපිළිවෙළක සිටිය යුතු බව රජය විශ්වාස කරනවා. වර්තමානයේදී කොවිඩ්හි විවිධ ප්‍රභේද ඉස්මතු වෙමින් තිබෙනවා. මේ අභියෝගය තේරුම් ගෙන අපි අපේ වගකීම් ඉටු කර අභියෝගය ජය ගන්න කැප වෙමු. මේ දීර්ඝ සති අන්තයේ පුද්ගලික ගමන්බිමන් තාවකාලිකව නතර කර දමන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. රජයේ අවධානය නීති රීති නොයොදා යම් කිසි මට්ටමකට මෙය පාලනය කිරීමයි. රජයේ ඉලක්කය කොවිඩ් මර්දන එන්නත හැකි ඉක්මණින් ජනතාවට දීමයි. මේ රෝගය පාලනයට දැනට ඇති එකම විසඳුම එයයි. නමුත් එය විසඳුමක්ම නොවෙයි. පාසල් පද්ධතියෙන් පමණක් නොවෙයි සියලු පද්ධතිවල අවධානම් තත්ත්වයන් හඳුනාගෙන ඒවාට විසඳුම් දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් සිටිනවා.

**මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය,**

අනෙක් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ඉතා හොඳ මට්ටමකට සිංහල අවුරුද්දට පෙර තිබුණා. අවාසානාවට මේ වන විට රටට නව කොවිඩ් ප්‍රභේදයක් ඇවිත් තිබෙනවා. එය දරුණු විදිහට පැතිරෙනවා. එක් ආසාදිතයකුගෙන් පුද්ගලයන් 5කට 6කට එය බෝ වෙනවා. විශේෂයෙන් තරුණ අයට ඉක්මණින් බෝ වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. මේ රෝගය බිඳිතිවලට අමතරව වාතයෙන් බෝ වන බව ලෝක සෞඛ්‍ය සංවිධානයද කියා තිබෙනවා. විශේෂයෙන් කාර්යාල, පුද්ගලයන් බොහොමයක් එක් රැස් වෙන සංවෘත්ත ස්ථානවල වාතයේ මේ විෂ බීජය රැඳී තිබෙන බව සොයා ගෙන තිබෙනවා. එබැවින් රෝග කාරකයන් වැඩි පිරිසක් එම ස්ථානයක සිටියහොත් ඔවුන් සියලු දෙනාට රෝගය වැළඳිය හැකියි. එබැවින් මුඛ ආවරණය පැළඳීම, නියමිත දුරස්ත භාවය රඳවා ගැනීම, ඉතා වැදගත් වෙනවා.

**ජනාධිපති ජ්‍යෂ්ඨ උපදේශක ලලිත් වීරතුංග මහතා,**

මේ වන විට ඇස්ට්‍රාසෙනිකා එන්නත පුද්ගලයන් නව ලක්ෂ විසිපන්දහස් දෙසිය හතළිස් දෙකකට දී තිබෙනවා. එයින් බස්නාහිර කොළඹ කළුතර පළාත්වල පුද්ගලයන් පන් ලක්ෂ හැත්තෑ අට දහස් දෙසීය තුන් දෙනකුට මේ එන්නත දී තිබෙනවා. දෙවැනි මාත්‍රාව දීමට තව එන්නත් තුන් ලක්ෂ පනස් හය දහසක් ගබඩා කර තිබෙනවා. ඉන්දියාවේ ඇති වී තිබෙන තත්ත්වය නිසා මේ අස්ට්‍රාසෙනිකා දීම ප්‍රමාද වී තිබෙනවා. අප ඇණවුම් කළ ප්‍රමාණයෙන් තවත් ලක්ෂ 10ක් කෙටි කාලයක් තුළ අපට ලැබෙනු ඇතැයි සිතනවා. නමුත් අප ඒ ගැනම නොසිතා ඇස්ට්‍රාසෙනිකා නිෂ්පාදනය කරන වෙනත් රටවල් සමග සාකච්ඡා කර එය ගැනීමට කටයුතු කරමින් සිටිනවා. චීන එන්නතෙන් ලක්ෂ 6ක් අපට ලැබී තිබෙනවා. රජය දැඩි පියවර මේ අවස්ථාවේ නොගන්නේ ආර්ථිකයට මෙන්ම දෛනික ආදායම් මත යැපෙන ජනතාව එයින් පීඩනයට ලක් වෙන නිසයි. ඒ නිසා ජනාධිපතිවරයා උපදෙස් දුන්නා ජනතාව පීඩනයට ලක් නොකර ජනතාවට මෙහි අවධානම කියා දී ඔවුන් විසින්ම මෙය පාලනය කර ගන්නා ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියලා.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් අසේල ගුණවර්ධන, ඖෂධ සංස්ථාවේ සභාපති විශේෂඥ වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහත්වරුද මෙහිදී අදහස් දැක්වූහ. මේ අවස්ථාව ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය මොහාන් සමරනායක මහතා ද සහභාගි විය.

01 වැනි පිටුවෙන්...

## කොරෝනා එක්ක...

කොවිඩ් -19 වයිරසයට ප්‍රතිචාර වශයෙන් මහජන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒ අනුව සියලු විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතනය වසා තැබෙන අතර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ පෙර පාසල් සියයට 50ක ධාරිතාවකින් ක්‍රියාත්මක කළ හැකිය. උපකාරක පන්ති පැවැත්විය නොහැකි අතර, මංගල උත්සව වෙනුවෙන් ශාලාවේ ආසන ධාරිතාවකින් සියයට 50ක් නොඉක්මවන ලෙසට උපරිම වශයෙන් අමුත්තන් 150ක් දක්වා ආරාධනා කිරීමේ හැකියාව පවතියි. කොවිඩ් හේතුවෙන් මරණයට පත්වූවන් හැර අනෙක් අවමංගල්‍ය උත්සව සඳහා දී ඇති උපදෙස්වලට අනුව ඕනෑම වේලාවක උපරිම වශයෙන් පුද්ගලයන් 25 දෙනකුට පමණක් සහභාගි විය හැකිය. පොදු ප්‍රවාහන සේවාවලදී බස් රථවල මෙන්ම දුම්රියේ ආසන ධාරිතාව දක්වා මගීන් ප්‍රවාහනය කිරීමට පමණක් අවසර හිමි වේ. කුලී මෝටර් රථ සහ ත්‍රිරෝද රථ සඳහා උපරිම මගීන් සංඛ්‍යාව දෙකකට සීමා විය යුතු අතර වෙනත් වාහන සඳහා එය ආසන ධාරිතාව දක්වා සීමා වේ. රජයේ සහ පෞද්ගලික කාර්යාලවලට උපදෙස් දී ඇත්තේ අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සමග ක්‍රියා කිරීමට අවසර ඇති බවයි. හැකි සෑම විටම නිවෙසේ සිට වැඩ කිරීමට විකල්පයක් දිය යුතු බවටද මාර්ගෝපදේශ මාලාවේ සඳහන් වේ. එමෙන්ම බැංකු, රෙදිපිළි සාප්පු, කෘෂිකර්මාන්තයේ නියැළීමේදී, සිල්ලර වෙළෙඳසල්වලට ඇතුළුවීමේදී, සාප්පු සංකීර්ණවලට ඇතුළත්වීමේදී, සුපිරි වෙළෙඳසල්වලට අතුළුවීමේදී, සම්මන්ත්‍රණ වැඩමුළු, රැස්වීම් ආදියේදී ද හැසිරිය යුතු ආකාරය එම මාර්ගෝපදේශ මාලාවේ දක්වා තිබේ.

## වියළි මිදි යැයි කියා ...

ශ්‍රී ලංකා රේගු ආර්.සී.ටී. බහලුම් පර්යන්තයේ ගබඩා කර තිබෙන බහලුමකින් මේ කහ තොගය සොයා ගත් බවත් වියළි මිදි කිලෝ 10 බැගින් ඇතුළත් යැයි සඳහන් පෙට්ටි 1,965කින් පෙට්ටි 765ක මේ කහ තොගය සූක්ෂ්ම ලෙස සඟවා තිබූ බවත් රේගු මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

මේ ආකාරයටම සඟවා තිබූ වියළි කහ කිලෝ 7,110ක් සොයා ගැනීමට රේගුව ඉකුත් 21දා සමත් වූ අතර, තවත් කන්ටේනර් දෙකක් පරීක්ෂා කරමින් පවතින බව රේගු මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩි දුරටත් පැවසීය.

## නිරාවිය සහ ...

ප්‍රදේශයේ කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා එම තීරණය ගත් බවත් එම හුදෙකලා කිරීම නැවත දැනුම් දෙන තුරු බල පැවැත්වෙන බවත් හෙතෙම කීවේය.

එමෙන්ම පෙරේදා (22) මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය පොලිස් වසමද හුදෙකලා කර තිබේ.

## අවුරුදු සමයේ...

ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ, රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහත්වරුන්ගේ උපදෙස් අනුව යෙදූ විශේෂ බස් සේවාව මේ ආදායම උපයා ඇත්තේ අප්‍රේල් මස 10ත් 20ත් අතර කාලය තුළ බව කියා සිටි සභාපතිවරයා එම කාලය තුළ බස් රථ 5,000ක් පමණ ධාවනය වූ බව කියා සිටියේය.

## අලුත් කොරෝනාවේ...

මේ නිසා රෝගය උත්සන්න වන තුරුම රෝගය ආසාදනය වී තිබෙන බව දැන ගන්නට නොලැබෙන බව පැවසූ ඒ මහතා, මේ නිසා ජනතාව වඩාත් ප්‍රවේශම් විය යුතු බව ද කීවේය.

ඉදිරි නිවාඩු දින කිහිපය තුළ වඩාත් කල්පනාකාරීව ගත කරන ලෙසත් පවුලේ හෝ ප්‍රදේශයේ හෝ කොවිඩ් රෝගියකු සිටියේ නම් රෝග ලක්ෂණ ගැන අවධානයෙන් සිටින ලෙසත් පවසන ඒ මහතා, යන්තම් හෝ හුස්ම ගැනීමේ අපහසුතාවක් ඇත්නම් වහාම වෛද්‍ය උපදෙස් ගන්නැයිද ජනතාවට දැනුම් දෙයි.

රෝගයේ මූලික අවස්ථාවේ වෛද්‍ය උපදෙස් සහ ප්‍රතිකාර ගැනීමෙන් රෝගය උත්සන්න වී දැඩි සත්කාර ඒකකයට යෑමට තිබෙන අවධානම අඩු වන බවත් හෙතෙම කීවේය.

01 වැනි පිටුවෙන්...

## අත්අඩංගුවට ගැනීමේ ...

පාර්ලිමේන්තුව තුළ කර ඇති ප්‍රකාශයකට එරෙහිව මන්ත්‍රීවරයකු අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් නැති අතර පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවී අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙසද ඇමැතිවරයා පැවසීය. එබැවින් චණ්ඩියකු සේ විවිධ අසත්‍ය ප්‍රචාර කරමින් ජනතාව මුළා කර සැඟවී නොසිට පැමිණෙන ලෙස හරීන් ප්‍රනාන්දු මහතාගෙන් ඉල්ලා සිටින බවද ඇමැතිවරයා පැවසීය.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා අත්අඩංගුවට ගැනීමට උත්සාහයක් තිබෙන්නේ දැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා මතු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

ඔබතුමන්ලා හරියට ඒ කාලයේ වැඩ කටයුතු කළා නම් මේ පාස්කු ප්‍රහාරය සිද්ධ වෙන්නේ නැහැ. ඒ වගේම පාස්කු ප්‍රහාරය වුණායින් පසුවත් නීතිය හරියට ක්‍රියාත්මක කළා නම්, ඔබතුමන්ලා ඡන්දෙන් පරදින්නේ නැහැ. ඒවා නොකරපු නිසා තමයි ඡන්දයෙන් තමුන්නාන්සේලා පැරදුණේ. ඒක හොඳට දන්න අගමැති කෙනෙක් ජනාධිපති කෙනෙක් ඉන්න ආණ්ඩුවක් තමයි දැන් තියෙන්නේ. හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාව පාර්ලිමේන්තුවේ කරපු ප්‍රකාශයකට අත්අඩංගුවට ගන්නේ නැහැ. මම දන්නවා මට සිද්ධ වුණ දේවල්. අනුර දිසානායකත් ඒකට එකඟ වෙයි. කිසිම මන්ත්‍රීවරයකුට අසාධාරණයක් වෙනවට මම එකඟ වෙන්නේ නැහැ. ඒක මම බොහොම පැහැදිලිව කියන්න කැමතියි. නමුත් පාස්කු ප්‍රහාරයේ කොමිසම් වාර්තාවේ ඉංග්‍රීසි පිටපත ආවයින් පසු දවස් 22කට පස්සෙ සිංහල පරිවර්තනය කරලා චමල් රාජපක්ෂ මහතාගේ කොමිටිය පත් කරද්දිම ජනාධිපතිවරයා මෙය නීතිපතිවරයාටත්, ඒ වගේම සී.අයි.ඩී.යටත්, ටී.අයි.ඩී.යටත් නීතිපතිටත් නීතිය පැත්තෙන් ප්‍රශ්න කිරීම් කරන්න ඉදිරියට ප්‍රශ්න කිරීම් කරන්න ජනාධිපතිවරයා භාර දුන්නා. නමුත් තමුන්නාන්සේලා එතකොටත් එතුමාට මඩ ගැහුවා. අපි තමුන්නාන්සේලා වගේ අඩබෙර ගහන්නේ නැහැ. මාධ්‍ය සාකච්ඡා තියන්නේ නැහැ. බොහොම සද්භාවයෙන් මේ කටයුතු රජය විසින් කරගෙන යනවා. යැයිද හෙතෙම කීවේය.

## ත්‍රිකුණාමලයට ...

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ කොවිඩ් - 19 වයිරසය පැතිර යෑමේ අවදානම වැඩි විය හැකි බව සෞඛ්‍ය අංශ හඳුනා ගෙන ඇති බැවින් අත්‍යවශ්‍ය කාරණාවකට හැර එහි සංචාරය කිරීමෙන් වළකින්නැයිද නැගෙනහිර පළාත් ආණ්ඩුකාරිනි අනුරාධා යහම්පත් මහත්මිය ජනතාවගෙන් ඉල්ලීමක් කළාය.

මාර්ග බාධක පනවමින් ජනතාව අත්‍යවශ්‍යය කාරණාවකට හැර සෙසු ගමන් බිමන්වල නිරත වීම වළක්වන්නැයිද ආණ්ඩුකාරවරිය ඊයේ (23) පෙරවරුවේ ආරක්ෂක අංශ වෙත උපදෙස්දී තිබේ.

මේ අතර ඉදිරි කාලය තුළ ත්‍රිකුණාමලය නගරයේ විශේෂ ආරක්ෂිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙසද ආණ්ඩුකාරවරිය ආරක්ෂක අංශ වෙත උපදෙස්දී තිබෙන අතර, නිරෝධානය පනත උල්ලංඝනය කරන කවර හෝ පුද්ගලයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කරන ලෙසද ආණ්ඩුකාරවරිය ආරක්ෂක අංශවලින් ඉල්ලා ඇත.

දැනට වකුගඩු රෝගීන් බොහෝ ප්‍රමාණයක් වාර්තා වී ඇති ගෝමරන්කඩවල සහ පදවි ශ්‍රීපුර යන ප්‍රදේශවලින් ත්‍රිකුණාමලයට පැමිණෙන ජනතාව හැකිතාක් සීමා කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසද ආණ්ඩුකාරවරිය අදාළ බලධාරීන්ට උපදෙස්දී තිබෙන අතර, වකුගඩු රෝගීන්ට කෝවිඩ්-19 ආසාදනය වීම ඉතා ඉක්මනින් වන බවට සෞඛ්‍ය අංශ ආනාවරණය කර ගෙන ඇති හෙයින් ආණ්ඩුකාරවරිය මේ පියවර ගැනීමට හේතුවවී තිබේ.

## වරාය නගර ...

එම පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ගොනු කළ පෙත්සම් 19ක, අතරමැදි පෙත්සම් දෙකක සහ පනතට පක්ෂව ඉදිරිපත් කළ අතරමැදි පෙත්සම් 11ක විභාගය අවසන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය මේ බව ප්‍රකාශ කළේය.

පෙත්සම් සම්බන්ධ ලිඛිත දේශන අඟහරුවාදා පෙරවරු 10.00ට පෙර ගොනුකරන ලෙස පාර්ශ්වයන්ට නියම කරන ලදි.

අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, ප්‍රියන්ත ජයවර්ධන, මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා යන පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවෙහි දින 5ක් පුරා මෙම පෙත්සම් විභාගය පැවැත්විණි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ජී. එල්. ආර්. පෙරේරා, පුරවැසි බලය සංවිධානයෙහි කැඳවුම්කරු ගාමිණී වියන්ගොඩ, එක්සත් ජාතික පක්ෂ මහලේකම් පාලිත රංගෙ බණ්ඩාර එහි සභාපති වජිර අබේවර්ධන, සමගි ජනබලවේගයේ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර එහි තරුණ පෙරමුණේ හර්ෂණ රාජකරුණා, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික වසන්ත සමරසිංහ, වෘත්තීය සමිති නායක ලෙස්ලි දේවේන්ද්‍ර, ජී. එස්. ශ්‍යාමලී, මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, නීතිඥ රජිත කොඩිතුවක්කු, ආචාර්ය අජන්තා පෙරේරා, ආර්ථික විශේෂඥ බන්දුල චන්ද්‍රසේකර, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්, නාගානන්ද කොඩිතුවක්කු, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති ජනාධිපති නීතිඥ සාලිය පීරිස් එහි ලේකම් නීතිඥ රජීව් අමරසූරිය, නීතිඥ රවීනා ගයේන්ද්‍රි ද සිල්වා විසින් මෙම පෙත්සම් ගොනුකර තිබුණි.

දුමින්ද නාගමුව, ඩබ්ලිව්. ඒ. එච්. කුමාර, ආර්. රාජපක්ෂ විසින් අතරමැදි පෙත්සම් ද ගොනු කර තිබුණි.

මෙම පනත් කෙටුම්පතෙහි වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට තීන්දු කර එය පාර්ලිමේන්තුවේ 3/2 බහුතර ඡන්දයෙන් සහ ජනමත විචාරණයකදී සම්මත කළ යුතු බවට තීන්දු කරන ලෙස ඉල්ලා ගොනු කළ මෙම පෙත්සම් වෙනුවෙන් නීතිවේදීහු 19 දෙනකු කරුණු ඉදිරිපත් කළහ.

මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස්, ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර, ලක්ෂ්මන් සිරිවර්ධන, මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල, කැබිනට් මණ්ඩල ලේකම් ඩොනල්ඩ් ප්‍රනාන්දු, චමින්ද විදානගම, එච්. එම්. විජිත හේරත්, ඊ. ඩබ්ලිව්. නලින් සමරකෝන්, පී. බී. කරුණාතිලක විසින් අතරමැදි පෙත්සම් 11ක් ගොනුකර තිබුණි. ඔවුන් වෙනුවෙන් නීතිඥවරු 08 දෙනකු විසින් කරුණු ඉදිරිපත් කළහ.

නීතිපතිවරයා විසින් අතිරේක සොලිසිටර් ජනරාල් ෆර්සානා ජමීල් මහත්මිය පෙනී සිටිමින් කමිටු අවස්ථාවේදී මෙහි ඇතැම් වගන්ති සංශෝධනය කිරීමට යෝජිත බව සඳහන් කළාය.

මෙම පනත් කෙටුම්පතෙහි වගන්ති ව්‍යවස්ථාවට පටහැණි නොවන අතර එය නීතියක් බවට පත් වීමට සරල බහුතරයෙන් සම්මත වීම ප්‍රමාණවත් බවට ඇය කරුණු ඉදිරිපත් කළාය.

## මැලේසියාවේ සිට ...

පොලිස් බල ප්‍රදේශ 16ක් තුළ ඉකුත් 19දා සිට පසුගිය සඳුදා දක්වා කරන ලද මෙහෙයුම්වලදී මේ මහා පරිමාණ මත්ජාවාරම හඳුනා ගෙන තිබෙන අතර, එය මොරටුව සොයිසාපුර මහල් නිවාස සංකීර්ණයේදී පවත්වා ගෙන ගොස් තිබෙන බව බුද්ධි කොට්ඨාසය පවසයි.

සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකු වන රත්මලානේ රොහා නමැත්තාගේ සහායකයකු වන මැලේසියාවේ සිටින ධනුෂ්ක නොහොත් සයිමා නැමැත්තාගේ මෙහෙයවීමෙන් ගල්කිස්ස පොලිස් වසමේ මොරටුව සොයිසාපුර මහල් නිවාස සංකීර්ණයේ දෙවැනි මහලේ රහසිගත ස්ථානයක සිට හෙරොයින් පැකට් කර බෙදා හරින බවට ලද තොරතුරකට අනුව ඉකුත් 22 වැනිදා මේ වැටලීම කර තිබේ.

රත්මලානේ සංවිධානාත්මක අපරාධ ජාවාරම්කරුවකු වන ෂේන් නමැති මත්ද්‍රව්‍ය ජාවාරම්කරු සහ ඔහු සමග තවත් සැකකරුවන් තිදෙනකු හෙරොයින් ග්‍රෑම් 361.910ක් සමග මෙහිදී අත්අඩංගුවට ගෙන වැඩි දුර විමර්ශන සඳහා මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත භාර දී තිබේ.

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන කරනච්චාරිගේ ෂේන් යොහාන් රාජපක්ෂ නොහොත් ෂේන් (39) නමැති මත්ද්‍රව්‍ය ජාවාරම්කරු සන්තකයේ හෙරොයින් ග්‍රෑම් 250.640ක්ද ගුරුසිංහ ආරච්චිලාගේ පැතුම් සමීර (27) සන්තකයේ ග්‍රෑම් 47.290ක්ද ලියනගේ රසික සම්පත් පෙරේරා (48) සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 45.510ක බරින් යුතු හෙරොයින් පැකට් 503ක්ද අලුත්ගම හේවගේ මංජුල විදුරංග හේවාවිතාරණ (21) සන්තකයේ තබා ගෙන සිටි හෙරොයින් ග්‍රෑම් 18.470ක බරින් යුතු හෙරොයින් පැකට් 202ක්ද අත්අඩංගුවට ගෙන තිබේ.

හෙරොයින් ජාවාරම් කළ බව කියන නිවෙස සෝදිසි කිරීමේදී හෙරොයින් බර කිරීමට භාවිත කරන විද්‍යුත් තරාදියක්, හෙරොයින් පැකට් කිරීමට ගන්නා විශේෂිත උපකරණයක්, මත්ද්‍රව්‍ය තැවරීම තිබූ විවිධ ප්‍රමාණයේ වීදුරු කැබලි මත්ද්‍රව්‍ය ඇසිරීම භාවිත කරනු ලබන Levis ලෙස මුද්‍රණය කර ඇති සමචතුරස්‍රාකාර හැඩයේ මුද්‍රිත කඩදාසි කැබලි 5,200ක්, මත්ද්‍රව්‍ය කොටස් කිරීමට ගන්නා, හෙරොයින් තැවරී තිබූ බ්ලේඩ් තල කිහිපයක් සොයා ගෙන ඇත.

පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි කොට්ඨාසයට ලද බුද්ධි තොරතුරක් මත එහි ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක නදීක සිල්වා මහතා සහ නිලධාරීන් කණ්ඩායමක් විසින් මේ වැටලීම කර ඇත.

01 වැනි පිටුවෙන්...

## ආණ්ඩුව හරීන්ට...

පාර්ලිමේන්තුවේදී පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කළ ප්‍රකාශය හේතුවෙන් මෙසේ අත්අඩංගුවට ගැනීමට යන බවට ආරංචි වී තිබෙන බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද අනුව එසේ කළ නොහැකි බවත් ප්‍රේමදාස මහතා කීවේය.

ත්‍රස්තවාදී පනත යටතේ කළ යුතු වන්නේ ප්‍රහාරයේ මොළකරු ඇල්ලීම බවත් වරප්‍රසාද පනතේත් සඳහන් වන පරිදි භාෂණයේ නිදහස තිබිය යුතු බවත් හෙතෙම කීවේය.

හරීන් ප්‍රනාන්දු මහතා යම් තොරතුරක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළ පමණින් අත්අඩංගුවට ගන්නේ කොහොම දැයි ප්‍රශ්න කළ විපක්ෂ නායකවරයා මේ සම්බන්ධයෙන් මැදිහත් වන්නැයි කථානායකවරයාගෙන් ඉල්ලීමක් කළේය.

# මුම්බායි රෝහලක ඇති වූ ගින්නකින් ආසාදිතයෝ 13ක් මරුට

බුද්ධි කරුණාරත්න

කොවිඩ් වසංගතයේ දෙවැනි රැල්ල ඉන්දියාවේ වේගයෙන් හිස ඔසවද්දී කොවිඩ් -19 රෝගීන් ප්‍රතිකාර ලබමින් සිටි මුම්බායිහි රෝහලක දැඩි සත්කාර ඒකකයේ හදිසි ගින්නක් ඇති වීමෙන් රෝගීන් 13කට අධික පිරිසක් මිය ගොස් ඇතැයි ඉන්දීය පුවත් වාර්තා කර තිබේ.

ඊයේ (23) පූර්වභාගයේදී ඇති වූ ගින්න නිවා දමා ඇති අතර, එයින් දිවි බේරා ගත් රෝගීන් සිව් දෙනකු වෙනත් රෝහලක් වෙත මාරු කර යවා තිබේ. ගින්න හට ගෙන ඇත්තේ මුම්බායි සිට කිලෝමීටර් 70ක් උතුරට වන්නට පිහිටි බටහිර මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ වීරර් ප්‍රදේශයේ විජායි වල්ලබ් රෝහලේය. එරට රෝහල් රෝගීන්ගෙන් පිරී ඉතිරී ගොස් ඇති අතර, උග්‍ර ඔක්සිජන් හිඟයත්, දැඩි සත්කාර ඒකක ඇඳන් හිඟයත්, ස්වසන ආධාරක (වෙන්ටිලේටර්) හිඟයත් නිසා රෝගීන්ට ප්‍රතිකාර කිරීම ඉතා අසීරු කාර්යයක් වී ඇතැයි වාර්තා වේ. එක් දිනක වාර්තා වූ ඉහළම කොරෝනා රෝගීන් ගණන වන 332,730 ඊයේ (23) ඉන්දියාවෙන් වාර්තා වූ අතර, එය පිට පිට දෙවැනි වතාවටත් වාර්තා වූ ඉහළම කොවිඩ් රෝගීන් ගණන වේ. එරටින් ගෙවුණු පැය 24 ඇතුළත කොවිඩ් මරණ 2,263ක් වාර්තා වී තිබේ. මහා රාෂ්ට්‍රයේ නෂික් නගරයේ පිහිටි සකීර් හුසේන් රෝහලේ ඔක්සිජන් සැපැයුම් ගබඩා ටැංකියේ ඇති වූ කාන්දුවක් නිසා දැඩි සත්කාරයේ ප්‍රතිකාර ලබමින් සිටි රෝගීහු 24 දෙනකු මිය ගියහ.

## බංග්ලාදේශය පළමු ඉනිම ලකුණු 541කින් නවතයි

# ශ්‍රී ලංකා පිල කඩුලු 3කට ලකුණු 229යි


විශ්ව ප්‍රනාන්දු

සංචාරක බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායම සමග පල්ලේකැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පැවැත්වෙන පළමු ටෙස්ට් තරගයේ පළමු ඉනිම ක්‍රීඩා කරන ශ්‍රී ලංකා කණ්ඩායම තෙවැනි දිනයට ක්‍රීඩාව නතර කරන විට කඩුලු 3ක් දැවී ලකුණු 229ක් රැස් කර ගෙන සිටියේය.

සංචාරකයන් සිය පළමු ඉනිම ලකුණු 541කින් නතර කළ අතර, ඒ අනුව කඩුලු 7ක් අතැතිව සිටින ශ්‍රී ලංකා පිල බංග්ලාදේශ පළමු ඉනිමට වඩා තවත් ලකුණු 312ක් පසුපසින් සිටී. දිනය නිමා වන විට දිමුත් කරුණාරත්න ලකුණු 85ක් සහ ධනංජය ද සිල්වා ලකුණු 26ක් රැස් කරමින් නොදැවී කඩුල්ලේ රැඳී සිටියේ සිව්වැනි කඩුල්ලට ලකුණු 39ක සබඳතාවක් ද සමගිනි.

පන්දු 211කට මුහුණ දුන් කරුණාරත්න හතරේ පහර 8ක් එල්ල කර තිබූ අතර, ඔහු ඊයේ රැස් කළේ 26 වැනි ටෙස්ට් අර්ධ ශතකයයි. ධනංජය පන්දු 30කදී හතරේ පහර 4ක් වාර්තා කර තිබිණි.

ශ්‍රී ලංකා ඉනිමට සාර්ථක අඩිතාලමක් දැමීමට නායක දිමුත් කරුණාරත්න සහ ළහිරු තිරිමාන්න සමත් වූයේ පළමු කඩුල්ලට ශතක සබඳතාවක් ගොඩනගමිනි. ඊයේ සිය 10 වැනි ටෙස්ට් අර්ධ ශතකය රැස් කළ තිරිමාන්න මුළු ලකුණු 114දී ඉනිමේ පළමු කඩුල්ල ලෙස දැවී ගියේ මෙහෙදි හසන්ගේ පන්දුවකට කඩුල්ල මුවා කිරීමේ වරදට හසු වීමෙනි. පන්දු 125කට මුහුණ දුන් ඔහු හතරේ පහර 8ක් සමගින් ලකුණු 58ක් රැස් කළේය. තිරිමාන්නගේ දැවී යෑමත් සමග තරගය සවස තේ පානය සඳහා නතර කෙරිණි. ඕෂධ ප්‍රනාන්දු (20) සහ ඇන්ජෙලෝ මැතිව්ස් (25) අඩු ලකුණු සංඛ්‍යාවකට දැවී යෑම ශ්‍රී ලංකා පිලට විශාල පාඩුවක් වුවත් නායක දිමුත් කරුණාරත්න කඩුල්ල රැක ගනිමින් ඉනිම ගොඩනැගීමේ නිරත විය.

ඊයේ දිවා විවේකයට ඕවර කිහිපයක් තිබියදී පළමු ඉනිමට අත්හිටුවීමට බංග්ලාදේශ පිල තීරණය කරන විට කඩුලු 7ක් දැවී ලකුණු 541ක් රැස් කර තිබිණි.

බංග්ලාදේශය ටෙස්ට් ඉනිමකදී ලකුණු 500 ඉක්මා ගිය 11 වැනි අවස්ථාව මෙන්ම ශ්‍රී ලංකාවට එරෙහිව රැස් කළ දෙවැනි ඉහළම ලකුණු සංඛ්‍යාව ද මෙයයි. 2013 ගාල්ලේදී ඔවුන් රැස් කළ ලකුණු 638 ටෙස්ට් ඉනිමක ඉහළම ලකුණු ලෙස වාර්තා වෙයි.

දෙවැනි දිනය නිමා වන විට නොදැවී සිටි මුෂ්ෆිකූර් රහීම් සහ ලිටන් දාස් ඊයේ අර්ධ ශතක රැස් කිරීමට සමත් වූහ. මුළු ලකුණු 474කින් දිනය ඇරඹූ බංග්ලාදේශ පිලට තවත් ලකුණු 37ක් එක් වෙද්දී දිනයේ පළමු කඩුල්ල ලෙස දාස් පිටියෙන් ඉවත් කිරීමට විශ්ව ප්‍රනාන්දු සමත් වූයේ ඕෂධ ප්‍රනාන්දු උඩ පන්දුවක් රැක ගැනීමෙනි. බංග්ලාදේශයට 6 වැනි කඩුල්ල අහිමි කරමින් මෙහෙදි හසන් (3) සුරංග ලක්මාල්ගේ පන්දුවක් හමුවේත්, විශ්වට සිව්වැනි කඩුල්ල හිමි කර දෙමින් ටයිජුල් ඉස්ලාම් (2) 7 වැනි කඩුල්ල ලෙසත් දැවී ගියේ නිරෝෂන් දික්වැල්ල උඩ පන්දු රැක ගැනීමෙනි. ඉනිම අත්හිටුවන විට රහීම් නොදැවී ලකුණු 68ක් සහ ටස්කින් අහමඩ් ලකුණු 6ක් රැස් කර තිබිණි. වේග පන්දු යවන ක්‍රීඩක ළහිරු කුමාර ඊයේ පන්දු යැවීමට එක් නොවූ අතර, ඔහු පාදයක ආබාධයකට ලක්ව ඇතැයි ආරංචි මාර්ග සඳහන් කර තිබිණි.

අද තරගයේ සිව්වැනි දිනය වන අතර, හෙට (25) තරගය නිමා වීමට නියමිතය.

බංග්ලාදේශ පළමු ඉනිම - 541/7යි. (ඉනිම අත්හිටුවන ලදි) නජ්මුල් හොසේන් 163, මොමිනුල් හක් 127, ටමීම් ඉක්බාල් 90, මුෂ්ෆිකූර් රහීම් නොදැවී 68, ලිටන් දාස් 50 (විශ්ව ප්‍රනාන්දු 96/4, සුරංග ලක්මාල් 81/1, ළහිරු කුමාර 88/1, ධනංජය ද සිල්වා 130/1)

**ශ්‍රී ලංකා පළමු ඉනිම**

| | |
|---|---|
| ඩී. කරුණාරත්න නොදැවී | 85 |
| එල්. තිරිමාන්න ක.මු.ක. ප.මෙහෙදි | 58 |
| ඕ. ප්‍රනාන්දු ඇ.දාස් ප.අහමඩ් | 20 |
| ඒ. මැතිව්ස් ප.ඉස්ලාම් | 25 |
| ඩී. සිල්වා නොදැවී | 26 |
| අතිරේක | 15 |
| **එකතුව කඩුලු 3ක් දැවී (ඕවර 73)** | **229** |

**කඩුලු බිඳ වැටීම:** 1-114, 2-157, 3-190

**පන්දු යැවීම:** ජයඩ් 7-1-25-0, අහමඩ් 12-3-35-1, ඊ.හොසේන් 10-1-44-0, මෙහෙදි 24-6-60-1, ඉස්ලාම් 20-5-56-1.


තිරිමාන්න සහ කරුණාරත්න

## පල්ලේකැලේ පිටියේ කම්කරුවකුට කොරෝනා

**අසේල කුරුළුවංශ**

මේ දිනවල පල්ලේකැලේ අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන ශ්‍රී ලංකා - බංගලාදේශ පළමු ටෙස්ට් ක්‍රිකට් තරගය සඳහා යොදවා සිටි ක්‍රීඩා පිටි කම්කරුවකුට කොරෝනා වයිරසය ආසාදනය වී තිබෙන බව රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණයකින් තහවුරු වී තිබේ.

වර්ෂාව අවස්ථාවලදී සහ තරගයෙන් පසු ක්‍රීඩා පිටියේ විකට්ටුව වැසීම සඳහා ආවරණ යෙදීමට යොදා ගන්නා තාවකාලික කම්කරුවන් පිරිසක් අතුරින් මේ රෝගියා හමුව ඇත. ඔහු සමග සිටි ආශ්‍රිතයන් 10ක් සේවයෙන් ඉවත් කිරීමට බලධාරීන් පියවර ගෙන තිබෙන අතර, ක්‍රීඩා පිටියේ සුළු සේවකයන් ඇතුළු පිරිස ඊයේ (23) පීසීආර් පරීක්ෂණවලට යොමු කර තිබේ. කොරෝනා ආසාදිත පුද්ගලයා තෙල්දෙණිය කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයට යොමු කර ඇති අතර, ඔහුගේ ආශ්‍රිතයන් නිවෙස්වල ස්වයං නිරෝධායනයට යොමු කළ බව සෞඛ්‍ය අංශ පවසයි.

# ආණ්ඩුකාර කුසලානය දිනූ ජයරත්න අශ්වගාලෙන් අද නුවරඑළියේදී අභියෝග රැසක්

**ප්‍රින්ස් ගුණසේකර**

රාජකීය තුරඟ තරඟ සමාජය සංවිධානයෙන් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ පැවැති ආණ්ඩුකාර කුසලාන තරගයේ ජය වාර්තා කළ විවේක් මෙහෙයවන වෙස්ටන් වින්ඩ් අසු ඇතුළු ජයරත්න අශ්වගාලෙන් අද වසන්ත සමයේ පවත්වන අවසන් තරගාවලියේදී අභියෝග රැසක් අනෙක් තරගකරුවන්ට මතු වනු ඇත.

පිට පිටම දෙවරක් ආණ්ඩුකාර කුසලානය දිනා සිටි අල්කසබා වෙළඹ සහ අවසන් වරට ශූරතාව දිනා සිටි ස්පිරිටඩ් ටච් අසු දෙවැනි හා තෙවැනි තැනට පත් කරමින් ගාමිණී ජයරත්න මහතාට සහ එම මහත්මියට අයත් වෙස්ටන් වින්ඩ් දැක්වූ දක්ෂතාව හේතුවෙන් අද අවසන් තරගාවලිය වඩාත් උණුසුම් මුහුණුවරක් ගනු ඇතැයි සියලු දෙනාගේ විශ්වාසය වේ.

වසර 5 කට පසු යළිත් ආණ්ඩුකාර කුසලානය තමන් සතු කර ගැනීමට ජයරත්න අශ්වගාල සමත් වූ අතර, එඩ්වර්ඩ්ස් අශ්වගාලට අයත් ජේ. විනෝයි මෙහෙයවූ අල්කසබා වෙළඹ හා පියර්ලස් අශ්වගාලේ කේ. අනීල් මෙහෙයවූ ස්පිරිටඩ් ටච් ජයග්‍රාහී වෙස්ටන් වින්ඩ් අසුට සටන්කාමී අවසානයක් දීමෙන් තරගයේ උණුසුම වැඩි විය. මීටර් 1800ක දුරකින් සමන්විත ආණ්ඩුකාර කුසලාන තරගයට අසුන් 9ක් එක්ව සිටියහ.

මීටර් 2000ක දුරකින් යුත් රැජින කුසාලන තරගයේදී ජයරත්න අශ්වගාලට තවත් ජයක් හිමි වූ අතර, හසංග ජයරත්න මහතාට අයිති අනදර් ඒස් අසු එම ජය වාර්තා කළේය. වෙනදා ජය පිට ජය වාර්තා කළ එඩ්වර්ඩ්ස් අශ්වගාලට මෙවර තරගාවලියේදී හිමි වූ එකම ජයග්‍රහණය මීටර් 1600 දුරකින් සමන්විත වූ නගරාධිපති කුසලාන තරගයේදී පමණක් හිමි වීම කැපී පෙනිණි. එම ජයග්‍රහණය ලබාදීමට ජේ. විනෝයි මෙහෙයවූ ග්ලිටරින් අසු සමත් විය.

මීටර් 1400ක දුරකින් සමන්විත වූ වෙජිබෙස්ට් අන්තර්ජාතික කුසලාන තරගයේ පළමු හා දෙවැනි ස්ථාන දෙකම පියර්ලස් අශ්වගාලට හිමි විය. මීටර් 1400ක දුරකින් සමන්විත වූ ක්‍රීඩා අමාත්‍යංශ අභියෝග කුසලාන තරගයේ ජය අත් කර ගැනීමට කෝසල සේනාරත්න මහතාට අයත් කේ. සංජීවන් විසින් මෙහෙයවූ මිස් අයිවරි වෙළඹ සමත් විය.



නුවරඑළිය තුරඟ තරගාවලියේ ප්‍රධාන ආරාධිතයා ලෙස එක් වූ අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ මහතා අතින් ආණ්ඩුකාර කුසලානය පිරිනැමීමෙන් පසු.


## 42 වැනි OBSERVER – SLT - MOBITEL
## වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සම්මාන උළෙල

"ප්‍රතිභාව හඳුනාගනිමින් - ශ්‍රේෂ්ඨත්වය කරා..."





2021 අප්‍රේල් මස 20 වැනි දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්වුණු 42 වැනි ඔබ්සවර් - එස්.එල්.ටී - මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සම්මාන උළෙල 2021 අප්‍රේල් මස 25 වැනි දින ඉරිදා රාත්‍රී 10.15 ට ස්වාධීන රූපවාහිනී සේවයෙන් විකාශනය කෙරේ.



1979 වසරේ සිට සියලුම පසුගිය ජයග්‍රාහකයින් පිළිබඳ මතක සටහන් රැසක් සමග ඔප කඩදාසියේ මුද්‍රිත වර්ණ පිටු 16 ක සුවිශේෂ සැමරුම් අතිරේකය 42 වැනි ඔබ්සවර් - එස්.එල්.ටී - මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උළෙලේ උත්කෘෂ්ඨ අවස්ථා සැමරුම් රැසක්ද සමගින් 2021 අප්‍රේල් මස 25 වැනි දින සන්ඩේ ඔබ්සවර් පුවත්පත සමග නිකුත් වේ.
ඔබේ පිටපත දැන්ම වෙන් කරවා ගන්න!

LAKE HOUSE SUNDAY OBSERVER SLTMOBITEL The Connection ITN SriLanka

# පාපන්දු සම්මේලනයේ සභාපති නොපැමිණීමෙන් කෝප් කමිටුවේ කටයුතු අතරමඟ අත්හිටුවයි

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවට ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපතිවරයා සහභාගි නොවීම හේතුවෙන් කෝප් රැස්වීම අත්හිටුවීමට කමිටුවේ සභාපති, මහාචාර්ය චරිත හේරත් මහතා පියවර ගත්තේය.

ඒ අනුව මැයි මස 06 වැනි දින ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපති ඇතුළු නිලධාරීන්ද එහි හිටපු සභාපති මනිලාල් ප්‍රනාන්දු මහතාද කැඳවීමට කටයුතු කරන බව කෝප් සභාපතිවරයා පැවසීය.

පාපන්දු සම්මේලනයේ විධායක සභාවට ඡන්දයෙන් සාමාජිකයන් 10ක් පත් කළ ද සභාපතිවරයා විසින් තවත් සාමාජිකයන් 18ක් පත් කිරීම සිදු කරන බව මෙහි දී අනාවරණය විය. මෙය විශාල ගැටලුවක් බව කමිටුව පෙන්වා දුන් අතර සම්මේලනයේ ව්‍යවස්ථාව අනුව මෙසේ සිදු වුවත් එය විශාල ගැටලුවක් බවද සභාපතිවරයා පැවසීය. එබැවින් මේ සඳහා වහාම මැදිහත් වන ලෙස ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාට කෝප් කමිටුව උපදෙස් දුන්නේය. මෙසේ සභාපතිවරයා විසින් 18 දෙනකු පත් කිරීම වළක්වාලීමට නියෝගයක් නුදුරු දිනකදීම නිකුත් කරන බව මෙහිදී ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජේකෝන් මහතා පැවසීය.

මේ ක්‍රීඩා සංගම්වල නිලවරණ පැවැත්වීමට නිලවරණ කමිටු ස්ථාපිත කිරීම මේ සංගම් මගින්ම සිදු වීම නිසා විනිවිද බවකින් තොරව මේ කටයුතු සිදු වන බව කමිටුව පෙන්වා දුන්නේය. එසේම පාපන්දු සම්මේලනයේ එළඹෙන නිලවරණයට නිලවරණ කමිටු සභාපතිට රුපියල් 750,000ක මුදලක් ද අනෙකුත් සාමාජිකයන් දෙදෙනාට සහ රුපියල් 600,000 බැගින්ද දෙන බව මෙහිදී අනාවරණය වූ අතර මෙය කමිටුවේ දැඩි දෝෂදර්ශනයට ලක්විය. සභාපතිවරයා විසින් පත් කරන 18 දෙනකු සිටින බැවින් මෙවැනි තීරණ ගැනීමේදී සභාපතිවරයාගේ තීරණ අභිබවා යෑමට නොහැකිවීම නිසා මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබෙන බවද මෙහිදී හෙළි විය.

තවද කළුතර පාපන්දු ක්‍රීඩාංගණය ඉදිකිරීමට ඉතාලි පාපන්දු ක්‍රීඩකයන්ගේ සංගමය මගින් පරිත්‍යාග කළ යුරෝ 40,400ක් (රු. මිලියන 6කට ආසන්න මුදලක්) හිටපු සභාපතිවරයා විසින් සිය පෞද්ගලික ගිණුමකට බැරකර තිබීම පිළිබඳව ද ආසියානු පාපන්දු සම්මේලනය මගින් තරග පැවැත්වීමට දුන් ඩොලර් 60,000ක් (රු.මිලියන 6කට ආසන්න මුදලක්) ද පෞද්ගලික සමාගමක් මගින් සුනාමියෙන් විපතට පත් අයට නිවාස 20ක් ඉදිකිරීමට දුන් රු මිලියන 10ක මුදලක් හා ආසියානු පාපන්දු සම්මේලනය විසින් පරිත්‍යාග කරන ලද ඩොලර් 200,000ක් පාපන්දු සම්මේලනයේ හිටපු සභාපති මනිලාල් ප්‍රනාන්දු මහතා විසින් අවභාවිත කිරීම පිළිබඳ කමිටුවේ අවධානය යොමු විය.

ඇමැතිවරුන් වන මහින්දානන්ද අලුත්ගමගේ, සරත් වීරසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රවුෆ් හකීම්, නලින් බණ්ඩාර, එස් .එම් මරික්කාර් සහ එස්. රාසමානික්කම් යන මහත්වරු ද ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයා, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු රාජ්‍ය නිලධාරීහු පිරිසක්ද ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ නියෝජිතයෝද මෙම අවස්ථාවට සහභාගී වූහ.

# වෙළෙඳපොළ පිවිසුම් බාධක ඉවත් කරන්න

## ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන චීනයෙන් ඉල්ලයි

**මහින්ද අලුත්ගෙදර**

චීනයට කරන අපනයන සඳහා තීරු බදු නොවන බාධක ඉවත් කරන්නැයි ශ්‍රී ලංකාව චීනයෙන් ඉල්ලීමක් කරයි.

අපනයන සඳහා වන තීරුබදු නොවන බාධක අවම කරගත හැකි නම්, සංවර්ධනය වෙමින් පවතින රටවලට ඉමහත් ප්‍රයෝජන අත්කර දෙන අතර චීනයේ සමෘද්ධිය සඳහා හවුල් විය හැකි බව චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන මහතා සඳහන් කරයි.

පසුගිය 16 සිට 18 දක්වා ජිනාන් හි පැවති 20 වැනි චීන අන්තර් ජාතික ආසියාවේ අන්තර් ක්‍රියාකාරිත්වය සහ විශ්වාසය ගොඩනැඟීමේ පියවර පිළිබඳ සමුළුවේ (CICA) මූල්‍ය සහයෝගීතාවය පිළිබඳ සම්මන්ත්‍රණයට සම්පත් දායකයකු ලෙස සහභාගි වෙමින් තානාපතිවරයා මේ බව සඳහන් කෙළේ යැයි විදේශ අමාත්‍යාංශය ප්‍රකාශ කරයි.

ලාභදායී චීන පාරිභෝගික වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා පවතින තීරුබදු නොවන බාධක පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් තානාපතිවරයා සම්මන්ත්‍රණය අමතමින් විශේෂ දේශනයක් ද පවත්වා තිබේ. චීනයට කෙරෙන අපනයන සඳහා පවතින තීරුබදු රහිත බාධක අවම කළහැකි නම් සහ මෙම බාධකවල සංකීර්ණතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී සහාය දෙන්නේ නම්, සංවර්ධනය වෙමින් පවතින රටවලට එමඟින් ඉමහත් ප්‍රයෝජන අත්කර දෙන බවත් චීනයේ සමෘද්ධිය සඳහා හවුල් විය හැකි බවත් හෙතෙම යෝජනා කර තිබේ.

# ජනතාවට දුන් පොරොන්දු ඉටු කර, ශක්තිමත් රටක් ගොඩනැඟීම රජයේ උත්සාහයයි

## ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ




**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් - 19 වසංගතය පැවතිය ද විදේශ විනිමය ආරක්ෂා කරගත හැකි වැඩපිළිවෙළකට යෑමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජයට හැකියාව තිබෙන බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා ප්‍රකාශ කරයි.

රටේ ආර්ථිකය කඩා වැටුණොත් හොඳයි කියන තැන එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ සිටිය ද වත්මන් රජය උත්සාහ කරන්නේ ජනතාවට දුන් පොරොන්දු අනුව ශක්තිමත් රටක් ගොඩනැඟීමට බවද පෙන්වා දෙයි.

බත්තරමුල්ල, නෙළුම් මාවතේ පිහිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මාධ්‍ය මධ්‍යස්ථානයේ දී ඊයේ (23දා) පැවැති මාධ්‍ය හමුවට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් පළකළ ඇමැති ගාමිණී ලොකුගේ මහතා, අද ලොකුම ප්‍රශ්නය තියෙන්නේ වරාය නගරය සම්බන්ධවයි. රජයේ ප්‍රතිපත්තිය පැහැදිලි කර තිබෙනවා. වරාය නගරය එදා BIO එක ආරම්භ කරපු ආකාරයට වඩා සුළු වෙනස්කම් කිහිපයක් තිබෙනවා. ලෝකයේ මේ වගේ වරාය නගර විශාල ලෙස තිබෙනවා. අප වරාය නගරය ආරම්භ කරන කොට ඒවාට ආයෝජනය කරපු අයට ආකර්ෂණයක් තිබෙන්න ඕනෑ. වරාය නගර ආරම්භ කිරීම තුළින් සියයට සියක්ම අපනයන භාණ්ඩ නිෂ්පාදනය වෙන්නේ. කිසිම තහනමක් නෑ දේශීය ව්‍යාපාරකයන්ට ඒ ඒ ගැලපෙන විදිහයට ඇතුළු වෙන්න පුළුවන්කමක් තිබෙනවා.

අද එක්සත් ජාතික පක්ෂයටත් ජනතා විමුක්ති පෙරමුණටත් ඕනෑ මේ රටේ ආර්ථිකය කඩා වැටුණොත් හොඳයි කියලා. අපේ රජයේ ජනාධිපතිවරයා, අගමැතිවරයා, අපේ මන්ත්‍රීවරු ඇමතිවරු උත්සහ කරන්නේ ජනතාවට දුන්නු පොරොන්දු අනුව ශක්තිමත් ව්‍යාපාරයක් බවට පත් කරන්නයි.

මේ කන්නේ තමයි ගොවින්ට වැඩිපුර විශාලා ආදායමක් ලැබුණේ. ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත්වෙලා කොවිඩ් රෝගයත් එක්ක අපේ රටේ විදේශ විනිමය ආරක්ෂා කරගන්න වැඩපිළිවෙළක් සකස් කර දුන්නා. අද විපක්ෂයට වෙලා තිබෙන්නේ ආණ්ඩුව ගෙනියන වැඩපිළිවෙළ කඩාකප්පල් කරන්නේ කොහොම කියලා කල්පනා කරන එක. අද අප හැම කටයුත්තක්ම නිවැරදි කරගෙන ඉස්සහරහට යන වැඩපිළිවෙළක සිටින්නේ.

## වරාය නගර ප්‍රදේශය රටේ මූලික නීතියට යටත්

### රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතා** - අද දවසේ ප්‍රධාන මාතෘකාව වෙලා තිබෙන්නේ කොළඹ වරාය නගර ආර්ථික කොමිසම පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව මතුවෙලා තිබෙන සංවාදයයි. දැන් මේ පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ක්‍රමයකට අනුවයි. මුලින්ම ඒකට අවශ්‍ය ප්‍රතිපත්තිය ඇමැතිය මණ්ඩලයෙන් අනුමත කිරීමයි. එයින් අනුමත කර ප්‍රතිපත්තිය නීති කෙටුම්පත් සම්පාදකයාට යැව්වට පස්සේ ඔවුන් ඒ අදාල අමාත්‍යංශය හෝ නිතිඥයන් රැස්වෙලා ඒක කෙටුම්පත් කරනවා. එය නැවත කැබිනට් එකට එනවා.

එය කැබිනට් මණ්ඩලය අනුමත කරාට පස්සේ පාර්ලිමේන්තුවට යවනවා. එසේ ඇතුළත් කළාට පස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව දින 14 තුළ මේ කෙටුම්පතේ යම් කරුණු පිළිබඳ අතෘප්තියට පත්වන පාර්ශවයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120 වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කරුණු දක්වන්න පුළුවන්. ඒ අනුව මේ පනත් කෙටුම්පනතට පෙත්සම් කරුවන් 19 දෙනෙක් පෙත්සම් ගොනුකර තිබෙනවා. නිතිපතිවරයා විසින් ඔවුන්ගේ අදහස් විමසනවා.

මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ වරාය නගරය හෙක්ටයාර් 446.6 ක් අපේ මුහුදු තීරයෙන් ගොඩකරනු ලැබුවා. මෙහි සීමාවන් පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා. ප්‍රධානම ප්‍රශ්නය තමයි මීට පෙර ගොඩකළ ඉඩම් කොටස කොළඹ දිස්ත්‍රික්කයේ කොටස් හැටියට ගැසට් කර තිබෙනවා. මේක නැවතත් පනතක් හැටියට කොළඹ දිස්ත්‍රික්යේ කොටසක්. නිශ්චිත භූමි ප්‍රමාණයක් තිබෙනවා. මායිම් තිබෙනවා. ඒ නිසා වෙනම රටක් කියන්න බෑ. මේ පනත ක්‍රියාත්මක වන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්වයි. මේ පනත සම්මත කරන්න 2/3 අවශ්‍ය වන්නේ මේ කෙටුම්පතේ තිබෙන සමහර වගන්ති අභියෝගයට ලක් කරලා තියෙනවා කියා ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා නම් විතරයි. මේක නැත්නම් සාමාන්‍ය බහුතරයෙන් සම්මත කර ගත හැකිය. දැන් මේක අපේ රටේ මූලික නීතියට යටත්. අපරාධ නීතියට යටත්. මේ පනතේ ගිණුම් කටයුතු අන්තර් ජාතික විගණන ආයතනයක් මඟින් විගණනය කරලා තිබන්නේ.

මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියට යටත්වයි සිදු කරන්නේ. මෙය ගෙන එනු ලැබුවේ අපේ ආණ්ඩුව භාර ගනිද්දි ආර්ථිකය සංවර්ධනය 2.4 යි. එහෙම තිබ්බ රටක් භාර ගත්තේ ජනාධිපතිතුමා. මේ පාලන මාස 04 හැර ඉතිරි කාලය තුළ කොවිඩ් - 19 එක්ක සටන් කරා. පාසල් වසන්න වුණා. මාස 02 ක්ම මුළුරටම වහන්න වුණා. නමුත් උපාධිධාරින්ට රැකියා දුන්නා. මේ වරාය නගරය ආපුවහාම සියලුම ප්‍රශ්නවලට පිළිතුරු තියෙනවා කියලා හිතන්නේ. එහෙම නෑ. මෙතන ආයෝජකයන් ආකර්ශණය කරගන්න ඕනෑ. ආයෝජකයන්ට ඒ පහසුකම් දෙන්න ඕනෑ. රටේ නීතියයි, සංස්කෘතියයි ආරක්ෂා කරගෙනයි මේක අරගෙන යන්නේ. අප මේ රටේ මුලික නීතියට අවැඩක් වෙන විදිහට සිදු කරන්නේ නෑ.

## මැයි දිනය තිබුණා නම් අපත් ශක්තිය පෙන්වනවා

### මන්ත්‍රී කේ.පී.එස්. කුමාරසිරි

**පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.පී.එස්. කුමාරසිරි මහතා** - 2013 වසරේ වරාය නගරය නිර්මාණය කරන්න බජට් ප්‍රපොසල් එක ගෙනවිත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එදා ඒ නගරය ආරම්භ කිරීමෙන් පසු 2015 යහපාලන ආණ්ඩුව මේ වරාය නගරයේ වැඩ කටයුතු නවත්තන්න කටයුතු කළා. මේකට හේතුව තමයි මහින්ද රාජපක්ෂ මහතා ආරම්භ කිරීම. වසර 02ක් වරාය නගර අත්හිටුවීමෙන්, අපට සහ චීනයට අමෙරිකන් ඩොලර් මිලියන 75ක් පාඩු ලැබුවා. රටක් විදිහට අපට පාඩුව ගෙවන්න සිදු වුණා. අක්කර 1,116 තිබෙන භූමි ප්‍රමාණය හෙක්ටයාර් 02ක් නැවත අලුතින් භූමි ප්‍රමාණය වැඩි කරන්න වුණා. ඒ මුදල ගෙව්වේ ඒ ආකාරයටයි රනිල් වික්‍රමසිංහ මහතා එදා හිටපු යහපාලන ආණ්ඩුව.

අද වර්තමාන විපක්ෂය කරපින්නාගෙන යන්න හදන කාරණාවක් බවට පත්වෙලා තිබෙනවා. මම දැක්කා ඔවුන් කියනවා මේ මුදල් චීනයට යන්නේ කියලා. පනතේ තිබෙනවා මේක ඒකාබද්ධ අරමුදලට යන්නේ. සියයට 1 ප්‍රමාණයක් පමණයි ඒ ව්‍යාපෘතියේ අවශ්‍යතා සඳහා යන්නේ.

වගකීමෙන් ජනතාවට කියනවා මේ නගරය ඉතාමත් අත්‍යවශ්‍යයි. විපක්ෂය කරන්න ඕනෑ අකුල් හෙලන එක නොවේ. මේකට ආයෝජකයෝ ගේන්න උදව් කරන්නයි. වර්තමාන විපක්ෂ 21 වැනිදා පාර්ලිමේන්තුවේ නටපු නාඩගම ඉතාමත් පහත් එකක්.

# ත්‍රෛභාෂා පාසල් ජාතීන් අතර සහෝදරත්වයට පිටිවහලක්

## අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස්



ත්‍රෛභාෂා පාසල් ඇති කිරීමෙන් අධ්‍යාපනයේ ප්‍රගමනයක් මෙන්ම සියලු ජාතීන්ට අයත් දූ දරුවන්ට සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සිතුම් පැතුම් අවබෝධ කර ගැනීමට විශාල පිටිවහලක් වෙනවා. ඒ සඳහා කෝට්ටේ රාහුල විද්‍යාලය ත්‍රෛභාෂා පාසලක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වෙනවා යැයි අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසී ය.

ඇමැතිවරයා මේ බැව් පැවසූයේ කෝට්ටේ රාහුල විද්‍යාලයේ අභිනවයෙන් ඉදිකරන ලද පිහිනුම් තටාකය විවෘත කිරීමේ උත්සවයට සහභාගී වෙමිණි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීවේය. මේ රටේ සිංහල දරුවන්ට දමිළ භාෂාව කතා කිරීමට සහ අවබෝධ කර ගැනීමට නොහැකි වීම විශාල ගැටලුවක් බව අප දන්නවා. ඒවගේ ම දමිළ දරුවන්ට සිංහල භාෂාව කතා කිරීමට සහ අවබෝධ කර ගැනීමට නොහැකිවීම විශාල ගැටලුවක්. තමන්ගේ මවු භාෂාවෙන් පමණක් අධ්‍යාපන කටයුතු කිරීම නිසා ඉංග්‍රීසි භාෂාව පවා ඔවුනට මගහැරෙනවා. ඒ තුළින් සන්නිවේදන භාෂාවක් අහිමි වෙනවා. ඒක අනෙකා හඳුනා ගැනීමට සහ අනෙකාගේ සිතුම් පැතුම් අවබෝධ කරගැනීමට විශාල බාධාවක්.

මේ අඩුව ඉක්මනින් පිරවීමට ත්‍රෛභාෂා පාසල් ඇති කිරීම ඉතා ම වැදගත්. ඒ අනුව කෝට්ටේ රාහුල විද්‍යාලය සම්බන්ධ යෝජනාව ඉතා හොඳ එකක්. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ සහයෝගය දෙන්නට අප බලාපොරොත්තු වෙනවා. අපේ රජයේ ප්‍රමුඛ අරමුණ දරුවන්ට අංග සම්පූර්ණ සහ කාලෝචිත අධ්‍යාපනයක් දීමයි. පන්ති කාමරයට ගිහින් ගුරුවරයාට ඇහුම්කන් දීලා සටහන් ලියාගෙන විභාගයට පෙනී සිට කටපාඩම් කරපු ඒවා ලියලා ලකුණු ගැනීම නෙමෙයි අධ්‍යාපනය කියන්නේ.

ජීවිතයේ අභියෝගවලට ප්‍රායෝගික පුහුණුවක් දෙන අධ්‍යාපනයක් අපේ දරුවන්ට දීම තමයි අරමුණ වෙන්නේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සමස්ත පෞරුෂය වර්ධනය කිරීම කළ යුතුයි. ක්‍රීඩා සංවර්ධනය කිරීම කියන්නේත් එවැන්නක්. ඒ නිසා මෙය ඉතා ම වටිනා අවස්ථාවක් එසේ ම පාසල් අතර පවතින විෂමතාව මේ ආකාරයෙන් ක්‍රමක්‍රමයෙන් අඩු කරන්නටත් සමාජ අවශ්‍යතා, ප්‍රමුඛතා හඳුනාගෙන ඒ අනුව රටේ අධ්‍යාපනය දිශානුගත කරන්නට ත් අපි කටයුතු කළ යුතුයි යැයි ඇමැතිවරයා පැවසී ය.

මෙම අවස්ථාව සඳහා විදේශ කටයුතු ඇති දිනේෂ් ගුණවර්ධන, හිටපු ගුවන් හමුදාපති සහ බස්නාහිර පළාත් ආණ්ඩුකාර රොෂාන් ගුණතිලක, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ජයන්ති විජේතුංග මහත්මිය, බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් සිරිසෝම ලොකුවිතාන, විද්‍යාලයේ විදුහල්පතිවරයා ඇතුළු පිරිසක් ද එක් වූහ.

# ඇවන්ගාඩ් නඩුවේ විත්තියේ දේශන 27දා

**රෝෂන් තුෂාර**

ඇවන්ගාඩ් සමාගමේ සභාපති මේජර් නිශ්ශංක සේනාධිපති මහතා ඇතුළු විත්තිකරුවන්ට එරෙහි නඩුවේ විත්තියේ දේශන ලබන 27 වැනි දින ඉදිරිපත් කරන ලෙස කොළඹ මහාධිකරණ ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ල ඊයේ (23) දන්වා සිටියේය.

නඩුවට අදාළ පැමිණිල්ලේ දේශන ඊයේ (27) රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ජනක බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කළ අතර පැමිණිල්ලේ දේශන ඊළඟ නඩු විභාග දිනයේ දි අවසන් කළ හැකි බවද සඳහන් කළේය.

මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ, මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න හා මහාධිකරණ විනිසුරු මහේන් වීරමන් මහත්වරුන් ඉදිරියේ නඩුව විභාග කෙරිණි.

ගාලු වරායේ පාවෙන අවි ගබඩාවක් පවත්වාගෙන යාම ඇතුළු චෝදනා යටතේ නිශ්ශංක සේනාධිපති මහතා ඇතුළු හත් දෙනෙකුට එරෙහිව නීතිපතිවරයා මේ නඩුව පවරා ඇත.

නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ජනක බණ්ඩාර මහතා පැමිණිල්ලේ දේශන ඊයේ(23) දීර්ඝ වශයෙන් ඉදිරිපත් කළේය.

විත්තිකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ සම්පත් මෙන්ඩිස්, නීතිඥ අජිත් පී. පතිරණ මහත්වරුන් ඇතුළු නීතිඥ පිරිසක් පෙනී සිටියහ. නඩුවේ වැඩිදුර විභාගය ලබන 27වැනි දින සිදු කිරීමට නියමිතය.

# "පාරමී දම්" පෝදා නාට්‍ය 26දා ජාතික රූපවාහිනියෙන්



අනුර වරාගොඩ තිර රචනය සහ අධ්‍යක්ෂණය කළ පාලිත සිල්වා, මොරීන් චාරුනී ඇතුළු රංගන ශිල්පීන් රඟ පාන "පාරමී දම්" පෝදා නාට්‍ය මේ මස 26 වැනිදා සවස 6 ට ජාතික රූපවාහිනියෙන් විකාශය වේ .

# යාපනය සරසවියට ධීවර හා ජලජීවී පීඨයක්

**බුද්ධිකා ඉඹුලාන**

යාපනයේ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ධීවර හා ජලජීවී වගාව පිළිබඳ පීඨයක් මුලතිව් ප්‍රදේශයේ ඉදිකිරීමට ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා විසින් ඇමැති මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත.

ධීවර කටයුතු හා ජලජීවී වගාව පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන්ට අධ්‍යයනය කිරීමට දකුණේ රුහුණු විශ්ව විද්‍යාලයට අනුබද්ධව පිහිටුවා ඇති නමුත් උතුරු ප්‍රදේශයේ සිසුන්ට එම අවස්ථාව අහිමිව ඇත. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන යාපනය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව මුලතිව් ප්‍රදේශයේ ධීවර හා ජලජීවී වගා පීඨයක් ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉකුත් 19 වැනිදා පැවති කැබිනට් මණ්ඩල රැස්වීමට මේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

මේ සඳහා රුපියල් මිලියන 3400ක මුදලක් වැය වන අතර අක්කර 100ක ඉඩමක මේ පීඨය ඉදි කෙරෙනු ඇත.

උතුරු පළාතේ ධීවර හා සාගර සම්පත් පීඨයක් පිහිටුවීමට 90 දශකයේ දී එවකට යාපන විශ්ව විද්‍යාලයේ උපකුලපතිව සිටි මහාචාර්ය තුරේ රාජා ගත් උත්සාහය ද සාර්ථක කර ගැනීමට නොහැකි විය. නමුත් 2007 වසරේ සිට යාපනය විශ්වවිද්‍යාලයේ විසින් විෂයක් ලෙස ධීවර කටයුතු ඉගැන්වීම සිදු වේ. මේ තත්ත්වය තුළ මුලතිව් මුල්ලිවයික්කාල් වට්ටුවාවල් ප්‍රදේශයේ නවීන පහසුකම් සහිත පීඨයක් ඉදිකිරීමට අදාළව සැලසුමක් විශ්වවිද්‍යාලය පාලනාධිකාරිය විසින් සකසා ධීවර ඇමැතිවරයාගේ අවධානයට ලක් කිරීමෙන් පසු ඇමැතිවරයා මේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලාංකික ආර්ථිකයට ධීවර කර්මාන්තය මගින් විශාල දායකත්වයක් ලබා දිය හැකි අතර එම කර්මාන්තය දියුණු කිරීමට නවීන තාක්ෂණය ලබාදීමට මෙවැනි පීඨ බිහි විය යුතු බව ඇමැතිවරයා කියයි.

දිසත
දස අත ම එක තැන



බෙලිවත්ත සමූහ

# ගැබිනි මව්වරුන් 50කට අවශ්‍ය බඩු කට්ටල



මවටත් පියාටත් ස්ථිර රැකියාවක් නොමැති ගැබිනි මව්වරුන් 50 දෙනෙක් වෙනුවෙන් බඩු කට්ටල ලබා දීමේ පින්කමක් පසුගියදා මාතර කෝට්ටේගොඩ බෙලිවත්ත ශ්‍රී සුධර්මාශ්‍රමයේ දී පැවැත්විණි.

මෙම පින්කමේ ප්‍රධාන දායකත්වය විහාරාධිපති රාජකීය පණ්ඩිත බුද්දියාගම ධම්මසේන හිමිපාණ්ගේ විදෙසගත හිතමිතුරන්ගේ ධන පරිත්‍යාගයෙන් සිදු කෙරිණි. මෙහිදී ගැබිනි මවක් රෝහල් ගතවීමෙදී හා දරුවාට අවශ්‍ය කරන රු 7,500ක බඩු කට්ටලය බැගින් පරිත්‍යාග කෙරිණි.

සමීර අබේසිංහ - නුගේගොඩ සමූහ

## ලේ බිඳක් දන් දී වටිනා ජීවිතයක් බේරා ගනිමු



බොරලැස්ගමුව, බෙල්ලන්විල මහජන ආරක්ෂක කමිටුව හා බොරලැස්ගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සංවිධානය කරනු ලබන ලේ දන්දීමේ කඳවුර (අනිද්දා) 26 වැනි පසළොස්වක පොහොය දිනයේ දී උදෑසන 08.30 සිට පස්වරු 04.00 දක්වා බෙල්ලන්විල විහාරස්ථානය අසල පිහිටි එක්සත් අවමංගල්‍ය අවමංගල්‍යාධාර සමිති ශාලාවේදී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇති බව සංවිධායක මණ්ඩලයේ පවසයි.

මෙම පින්කම පැවැත්වෙන අතරතුර මහරගම අපේක්ෂා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා අවශ්‍ය කරන ඖෂධ හා මූල්‍ය පරිත්‍යාගයක් සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ලේ දන්දීමේ කඳවුරට සහභාගී වී ලේ දන් දෙන සියලුම පුද්ගලයන් සඳහා සමරු තිළිණයක් ප්‍රදානය කිරීමටත් සංවිධායක කමිටුව තීරණය කර ඇති බවද ඔවුහු පවසති.

## සාම විනිසුරු පදවි ලබයි



අංක 44/4, දෙවන සැතපුම, පස්සර පාර, බදුල්ල ලිපිනයේ පදිංචි ඩී.එම්.ආර්. රත්නසේකර මහතා බදුල්ල දිසා අධිකරණයේදී මුළු දිවයිනටම බලපාන පරිදි 2020.02.17 දින සිට සාමවිනිසුරු පදවියෙහි දිවුරුම් දෙන ලදී. බදුල්ල පොලිස් අධිකාරී කාර්යාලයේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ලෙස සේවය කරන ඒ මහතා බදුල්ල සහ බණ්ඩාරවෙල මධ්‍ය මහ විද්‍යාලයන්හි ආදි ශිෂ්‍යයෙක් ද වේ.

ඒ මහතා බදුල්ල දෙවන සැතපුමේ 'එකමුතු' සුභ සාධක සමිතියේ භාණ්ඩාගාරික ලෙස ද කටයුතු කරනු ලබයි.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

# හම්බන්තොට කුකුළු මස් ගිනි ගණන්

## පාලන මිල ඉක්මවා මස් අලෙවි කළත් වගකිවයුත්තෝ නිහඬයි

හම්බන්තොට හා අවට ප්‍රදේශවල කුකුළු මස් ව්‍යාපාරිකයන් රජය විසින් ලබා දී ඇති පාලන මිලද ඉක්මවා කුකුළු මස් අලෙවි කිරීම හේතුවෙන් පාරිභෝගිකයන් දැඩි අපහසුතාවට පත්ව ඇතැයි ජනතාව පවසති.

රජය විසින් කුකුළු මස් සඳහා පාලන මිලක් පනවා ඇතත් හම්බන්තොට හා අවට කුකුළු මස් අලෙවි කරන ව්‍යාපාරිකයන් කුකුළු මස් කිලෝවක් රුපියල් 800ත් 850ත් අතර මුදලකට අලෙවි කිරීම හේතුවෙන් පාරිභෝගිකයන් දැඩි අපහසුතාවට පත්ව තිබේ. ජනතාව පවසන්නේ කුකුළු මස් අලෙවිසල් හිමිකරුවන් දිනෙන් දින කුකුළු මස් විවිධ මිල ගණන්වලට අලෙවි කරන බවත් වගකිවයුතු කිසිදු පාර්ශ්වයක් මේ සම්බන්ධයෙන් මෙතෙක් සොයා බලා නොමැති බවත් ව්‍යාපාරිකයෝ ඔවුන්ට හිතු හිතු පරිදි විවිධ මිල ගණන් යටතේ කුකුළු මස් අලෙවි කරන බවත් ජනතාව චෝදනා කරති.

කෙසේ වෙතත් අප මේ සම්බන්ධයෙන් හම්බන්තොට කුකුළු මස් අලෙවිකරුවන්ගෙන් සිදුකළ විමසීමකදී ඔවුන් පැවසුවේ ජනතාවගේ ඉල්ලුමට සරිලන පරිදි ලබාදීමට තරම් සතුන් නොමැති බවත් මේ වන විට අලෙවිය සඳහා ලැබෙන සතුන් ප්‍රමාණයද කුකුළු ගොවීන්ගෙන් ලැබෙන්නේ අධික මුදලකට බවත් ඒ හේතුව නිසා රජය විසින් ලබා දී ඇති පාලන මිලට කුකුළු මස් අලෙවි කිරීමට නොහැකි වී ඇති බවත්ය.

සමේලා රාජපක්ෂ - ගම්පහ

## ශාන්ත මරියා මහා විද්‍යාලයේ තවත් සමාජ සත්කාරයක්



ගම්පහ වේයන්ගොඩ ශාන්ත මරියා මහා විද්‍යාලයේ 13 වැනි වසරේ කලා අංශයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යාවක වන කේ.අයි.ජේ. චාතුල්‍යා ශිෂ්‍යාවගේ නිවෙස සහ ඉඩම රුපියල් ලක්ෂ 10ක මුදලක් වැය කර විකුණුම්කරයෙන් නිදහස් කිරීම විද්‍යාල පරිශ්‍රයේදී සිදු වූ බව එම විද්‍යාලයේ විදුහල්පති බී.ඩී.අයි.කේ. කරුණාරත්න මහතා ප්‍රකාශ කළේය.

චාතුල්‍යා ශිෂ්‍යාවගේ පියාණන්ගේ හදිසි අභාවයත් සමඟ දැඩි මූල්‍ය අර්බුදයකට පත්ව සිටි ඔවුන් සිය පියාණන් විසින් තමා ජීවත් වන ඉඩම සහ නිවෙස පවා විකුණා තිබීම හේතුවෙන් සහෝදර සහෝදරියන් තිදෙනා සහ මව සමඟ යන එන මන් නොමැති ව අසරණ ව සිටි අවස්ථාවේ දී ශාන්ත මරියා මහා විද්‍යාලයයේ විදුහල්පති බී.ඩී. අයි.කේ. කරුණාරත්න මහතාගෙත්, නියෝජ්‍ය විදුහල්පති එච්.පී.එස්. එම්. සෝමරත්න මහතාගේ උපදෙස් මත 13 - A පන්තියේ පන්ති භාර ගුරුතුමිය වන ඩී.එම්.එන්.යූ. දිසානායක මහත්මිය, ජපන් භාෂාව භාර ඩී.ඒ.එස්. මදුෂිකා මිය, ක්‍රීඩා භාර බී.එල්.එස්.එල්. බස්නායක මිය ඇතුළු ආචාර්යය මණ්ඩලයේ දැඩි උත්සාහය මත විද්‍යාලයේ සුභ සාධක සංගමයෙත් ආදිශිෂ්‍ය සංගමයේ මවුපියන්ගේ ආධාර ඇතිව රුපියල් ලක්ෂ 10ක මුදලක් වැය කොට අදාළ නිවෙස සහ ඉඩම විකුණුම්කර නිදහස් කොට වේයන්ගොඩ, වල්ගම්මුල්ල, අලිවලපල්ල, නිල්දිය සෙවණ අංක 133/4/7 පදිංචි එස්.ඩබ්.ජී. චමිලා කුමාරි මහත්මිය සහ ඇගේ දරුවන් වෙත භාරදීම පසුගියදා සිදු කෙරිණි.

ඩබ්.ඒ. සරත් - ගිරිඋල්ල සමූහ

## පරණගම මහ විදුහලේ සිසු නියමුවන්ට පදක්කම්

ගිරිඋල්ල පරණගම මහා විද්‍යාලයේ 2021 වසර සඳහා ශිෂ්‍ය නායක නායිකාවන් 50කට නිල ලාංඡන පැලඳවීම, ගිරිඋල්ල අධ්‍යාපන කලාප අධ්‍යක්ෂිකා එන්.එච්. ප්‍රේමාවතී මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා එළිමහන් වේදිකාවදී සිදු කෙරිණි.මෙම අවස්ථාවට විදුහල්පති අතුල මුණසිංහගේ අරාධනයෙන් පුහුලේ විහාරාධිපති මැද්දෙපොළ සෝමරතන හිමියන්, බටපොත ඇළ විද්‍යාලයේ විදුහල්පති ප්‍රදීප් විජේසුන්දර, පරණගම ප්‍රාථමික විදුහලේ විදුහල්පති සමරජීව ඇතුළු ආරාධිත අමුත්තෝ රැසක් සහභාගී වී සිටියහ.



බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## හෙල්මට් නැතුව ගිය තරුණයෙක් අනතුරකට ලක් වී මරුට

ආරක්ෂිත හිස්වැසුම් (හෙල්මට්) නොමැතිව යතුරුපැදියක පදවාගෙන ගොස් සිදුවූ අනතුරකින් බරපතළ තුවාල ලැබූ අවිවාහක තරුණයකු පසුගියදා (21) ජීවිතක්ෂයට පත්වී ඇති බව තිරප්පනය පොලීසිය පවසයි.අනතුරෙන් ජීවිතක්ෂයට පත්වී ඇත්තේ කැලෑ තිරප්පනය ඉහළගම මිහින්තලය ලිපිනයේ පදිංචිව සිටි 22 හැවිරිදි සෞම්‍ය ශාන්ත කුමාර නමැත්තායි. ඔහු තවත් මිතුරන් දෙදෙනකු සමඟ යතුරුපැදියෙන් ගල්කුලම දෙසට ගොස් නැවතත් නිවෙස දෙසට ගමන් කරද්දී අනතුර සිදුවී ඇති බව පොලීසිය පවසයි. තිරප්පනය පොලිස් වසමේ යකල්ල මාර්ගයේ ඔරුන්මාන්කුලම ප්‍රදේශයේ පිහිටි වංගුවකදී අනතුර සිදුවී ඇති බවත් පැදිකරුට රථයේ වේගය පාලනය කර ගැනීමට නොහැකිව ඉදිරියට ධාවනයවී පැදිය මාර්ගයෙන් ඉවතට පැන කුඩා මයිල ගසක ගැටී මාරක අනතුර සිදුවී තිබෙනා බව පොලීසිය පවසයි. ඔහු සමඟ යතුරුපැදියේ ගමන් කළ මිතුරන්ටත් සුළු තුවාල සිදුවී ඇති බව ද පැවසීය.

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## කට්ටයිකුලම් වැව් ඉස්මත්තේ කසිප්පු පෙරලා



"මුතූර් සාම්පූර් පොලිස් වසමට අයත් කෝන් අඩි පිහිටි "කට්ටයිකුලම් වැව්" ඉස්මත්තේ කසිප්පු පෙරූ පුද්ගලයකු සමඟ කසිප්පු තොගයක් පසුගියදා (21) අත්අඩංගුවට ගැනීමට සාම්පූර් පොලීසිය සමත් වූහ.

වැඩබලන පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ටී.එම්.ටී.වී. දයාරත්න මහතාගේ මෙහෙය වීම යටතේ ලද තොරතුරකට අනුව වැටලීම සිදු කරමින් සිටියදී එක් සැකකරුවකු අත්අඩංගුවට පත් වූ අතර තවත් සැකකරුවන් දෙදෙනකු පැනගොස් ඇතැයි පොලීසිය කියයි.

කසිප්පු ලීටර් 100ක් ගෝඩා ලීටර් 1,222ක් දඟර හතරක්, යතුරුපැදි දෙකක්, බැරල් අටක් මෙලෙස අත්අඩංගුවට ගැනීමට පොලීසිය සමත් වූහ. අත්අඩංගුවට පත් සැකකරු වයස අවුරුදු 43ක් වන එම ප්‍රදේශයේම පදිංචිකරුවකු වන අතර කසිප්පු, ගෝඩා ඇතුළු පෙරුම් උපකරණ සමඟ සැකකරු මුතූර් මහෙස්ත්‍රාත් අධිකරණටයට ඉදිරිපත් කිරීමට නියමිතය.

කේ.එස්. හැන්නදි - රාගම සමූහ

## පාතාල කල්ලික සාමාජිකයාගේ බිරිය මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරමක

පෑලියගොඩ ප්‍රදේශයේදී සිදු කරන ලද ත්‍රිත්ව ඝාතනයක් සම්බන්ධයෙන් සිරගතවී වසර හතක් සිර දඬුවම් විඳ ඇප මත නිදහස් වී සිටි පුද්ගලයකු මට්ටක්කුලිය ප්‍රදේශයේ ප්‍රසිද්ධ පාතාල කල්ලික සාමාජිකයකුගේ බිරියගේ සහාය මත සිය බිරිය ලවා සිදු කරගෙන ගිය මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරමක තොරතුරු සහ ජාවාරමේ නිරතවූ කාන්තාවද කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් විසින් අයිස් විෂ මත්ද්‍රව්‍යද සමඟ අත්අඩංගුවට ගෙන ඇත. 21 වැනිදා දහවල් කැලණිය වනවාසල ප්‍රදේශයේ දූෂණ මර්දන රාජකාරියේ යෙදී සිටි පෑලියගොඩ පොලීසියට අනුයුක්ත කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් වන වාසල වැල්ඩින් වැඩපළක් අසල ගැවසෙමින් සිටි සැකකටයුතු කාන්තාවක් අත්අඩංගුවට ගත් අවස්ථාවේ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 35යි මිලි ග්‍රෑම් 300ක් සොයාගෙන ඇත.

ඒ.පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## නිල්වලා අතු ගඟකට ගසක් කපා දැමූ අයෙක් අත්අඩංගුවට



පස්ගොඩ ගම හරහා ගලා බසින නිල්වලා ගඟේ අතු ගංගාවකට පස්ගොඩ ප්‍රදේශයේ ලී මෝල් හිමියකු විසින් ගඟට ගසක් කපා දමා ගසේ කඳ කොටස ගොඩට ගෙන අතු ඇතුළු කොටස් ඉතුරු කර දැමීම හේතුවෙන් දැඩි පරිසර හානියක් කිරීම සම්බන්ධයෙන් පුද්ගලයකු රොටුඹ පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පස්ගොඩ ප්‍රදේශයේ පදිංචි 40 හැවිරිදි ලී මෝලක් පවත්වාගෙන යන පුද්ගලයෙකි.ගඟ ආසන්නයේ තිබූ ගසක් ගඟට කපා දමා එහි කඳ කොටස ගෙන ගසේ අතු ඇතුළු ඉතුරු කොටස් සියල්ලම ගඟේ තැබීමට සලැස්වීම හේතුවෙන් එම ස්ථානයෙන් ගඟ දෙපස ඉවුරු ඛාදනය වී විශාල පරිසර හානියක් සිදුව තිබෙන බවට පොලීසියට ලැබුණු තොරතුරකට අනුව මෙම වැටලීම සිදු කර ඇත. එහිදී පොලිස් නිලධාරීන්ට දැක ගැනීමට ලැබී ඇත්තේ ගඟ සිරවී වතුර ගොඩට ගලා එම ප්‍රදේශයේ ගඟ දෙපස ඉවුරු කැඩී ඇති බවයි. ස්ථානාධිපති ප්‍ර.පො.ප. බන්දුල ප්‍රියන්ත මහතාගේ උපදෙස් අනුව අපරාධ දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උ.පො.ප කේ.ආර්.ජී.කේ. මුණසිංහ මහතා සමඟ පො.කො.76971 ප්‍රභාත්චන්ද්‍ර, පො.කො.රි. 16273 වීරසූරිය යන නිලධාරීන් විසින් වැටලීම සිදු කර ඇත.

## දේශීය ආහාර ප්‍රදර්ශනයට සියලු කටයුතු සූදානම්

සිවිල් අයිතිවාසිකම් සහ සත්ත්ව හිංසනයට එරෙහිව වසර විසිපහක පමණ කාලයක ජාත්‍යන්තර ක්‍රියාකාරිකයකු හා "Danna for animals" සංවිධානයේ නිර්මාතෘ මෙන්ම සභාපතිවරයා ද වන බොබ් අයිසැසන් "Bob Issason" මහතා අත්තනගල්ල ප්‍රාදේශීය සභා ශාලාවේ අද (24) පැවැත්වෙන දේශීය ආහාර (නිර්මාංශ) ප්‍රදර්ශනය නැරඹීමට නියමිතය. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ද සහභාගී වීමට නියමිත වන අතර මෙම ආහාර ප්‍රදර්ශනය අද පෙරවරු 8ට ආරම්භ වීමට සියලු කටයුතු සූදනම් කොට තිබේ.

පී.පී.පී. සුගතදාස - තිහගොඩ සමූහ

## අභාවයට යන දකුණේ බට කර්මාන්තය

මාතර දිස්ත්‍රික්කයේ බට ආශ්‍රිත කර්මාන්තවල යෙදී සිටින ජනතාවට අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟය නිසා එම කර්මාන්ත පවත්වා ගෙන යෑම දුෂ්කර වී ඇතැයි ඔවුහු මැසිවිලි නගති. එම දිස්ත්‍රික්කයේ තිහගොඩ, මුලටියන, අකුරැස්ස හා කඹුරුපිටිය ආදී ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාස රැසක ග්‍රාමීය දරු පවුල් දහසකට ආසන්න සංඛ්‍යාවකගේ ප්‍රධාන ජීවනෝපායවී ඇත්තේ බට ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත වේ.බට කැපීම හා ඒවා ප්‍රභාහනයට නීතිමය ගැටලු බලපා ඇති බවත් එම තත්ත්වය එකී කර්මාන්ත සාර්ථකව කරගෙන යෑමට අහිතකර ලෙස බලපා ඇතැයි ඔවුහු පවසති. බට ප්‍රයෝජනයට ගනු ලබනුයේ එකී භාණ්ඩ නිෂ්පාදනය සඳහා පමණි. වෙනත් කිසිදු කර්මාන්තයක් සඳහා අමු ද්‍රව්‍යයක් ලෙස ඒවා ප්‍රයෝජනයට නොගන්නා බවද එම කර්මාන්තකරුවෝ පවසති.

මහානාම විතානගේ - මල්වාන සමූහ සහ දෙල්ගොඩ සමූහ

## සිසුසරණී ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය 27

දම්සවිය ජාත්‍යන්තර පදනමේ "බොදු උදාන" ජාතික වැඩසටහනට වසර අටක් පිරීම නිමිත්තෙන් අම්පාර අධ්‍යාපන කලාපයේ සිසු සිසුවියන් වෙත සිසු සරණී ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් (27) පෙ.ව. 9.00ට අම්පාර ඩී.එස්. සේනානායක මධ්‍ය විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්වේ. මෙහිදී අම්පාර අධ්‍යාපන කලාපයේ අම්පාර, ලාහුගල, උහන හා දමන අධ්‍යාපන කොට්ඨාසවල පාසල් සිසු සිසුවියන් 2,700කට පාසල් උපකරණ පිරිනැමීම හා එම දරු දැරියන්ට අ.පො.ස. සා.පෙළ දක්වා අදාළ විෂය සමගාමීව ඉගැන්වීම් සිදු කිරීමද ඊට අවශ්‍ය මූල්‍යාධාර ලබාදීමද මෙම ශිෂ්‍යත්ව ප්‍රධානයට අයත් වේ.

### දවසේ රාහු කාලය

උදේ 09.03 සිට 10.36 දක්වා / රාත්‍රී 09.13 සිට 10.41 දක්වා

### දින තත්ත්වය

මේෂ රවි 11 භාග බක් පුර දොළොස්වක තිථිය ලත් ශනි දින ඉර උදාව 05.59ට ඉර බැසීම 06.18ට පුවපල් නැකත උදේ 06.22න් ගෙවී, උත්‍රපල් නැකත උදාවේ. පුර දොළොස්වක තිථිය රාත්‍රී 07.14න් ගෙවී පුර තෙළෙස්වක තිථිය ලබා පවතී. ධෘම යෝගය දහවල් 11.39න් ගෙවී ව්‍යාඝාත යෝගය ලබයි. බවකරණය උදේ 08.36න් ගෙවී බාලවකරණය ලබා එය රාත්‍රී 07.14න් ගෙවී කෞලවකරණය උදා වේ.

විෂ කලාව - බැම / අමෘත කලාව - කන

යෝගිනී - නිරිත / සුබ දිසාව - දකුණ



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යෙතිෂවේදී අජිත් ධර්මසිරි

### දවසේ හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**
05.59 සිට 06.59 දක්වා - සෙනසුරු හෝරාව
06.59 - 07.59 දක්වා - ගුරු හෝරාව
07.59 - 08.59 දක්වා - කුජ හෝරාව
08.59 - 09.59 දක්වා - රවි හෝරාව
09.59 - 10.59 දක්වා - සිකුරු හෝරාව
10.59 - 11.59 දක්වා - බුධ හෝරාව

**සවස**
11.59 -12.59 දක්වා - සඳු හෝරාව
12.59 - 01.59 දක්වා - සෙනසුරු හෝරාව
01.59 - 02.59 දක්වා - ගුරු හෝරාව
02.59 - 03.59 දක්වා - කුජ හෝරාව
03.59 - 04.59 දක්වා - රවි හෝරාව
04.59 - 05.59 දක්වා - සිකුරු හෝරාව

**රාත්‍රී**
05.59 - 06.59 දක්වා - බුධ හෝරාව
06.59 - 07.59 දක්වා - සඳු හෝරාව
07.59 - 08.59 දක්වා - සෙනසුරු හෝරාව
08.59 - 09.59 දක්වා - ගුරු හෝරාව
09.59 - 10.59 දක්වා - කුජ හෝරාව
10.59 - 11.59 දක්වා - රවි හෝරාව

**අලුයම**
11.59 -12.59 දක්වා - සිකුරු හෝරාව
12.59 - 01. 59 දක්වා - බුධ හෝරාව
01.59 - 02.59 දක්වා - සඳු හෝරාව
02.59 - 03.59 දක්වා - සෙනසුරු හෝරාව
03.59 - 04.59 දක්වා - ගුරු හෝරාව
04.59 - 05.59 දක්වා - කුජ හෝරාව

**බබාට නමක්**

මෙදින උදේ 06.22 දක්වා පුවපල් නැකත උදාව පවතින නිසා ටො, ට, ටි, ටු අකුරුද ඉන්පසු උදා වන උත්‍රපල් නැකත අනුව ටෙ, ටො, ප, පි අකුරුද දිනට අනුව ප, බ, හ, ම අකුරුද මුල්කොට බබාට නමක් දැමීම සුබයි.



## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - ව්‍යාපාර කටයුතු සාර්ථක වේ**

මේෂ ලග්නයට අනුව අද ඔබට තම දූ පුතුන් වෙනුවෙන් වැඩි කැපවීමක් දරන්නට සිදු වේ. ආර්ථික ප්‍රතිලාභ උසස් වේ. තම ව්‍යාපාරික කටයුතු සංවර්ධනය කර ගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වන අතර, ගෘහ ජීවිතයේ යම් යම් කටයුතු අඩාළ වීමට පුළුවන. වියදම මඳක් වැඩි වන නිසා සකසුරුවම් ලෙස කටයුතු කරන්න හිසට උරහිසට අගුණයි.

**වෘෂභ ලග්නය - සිතේ අධිෂ්ඨානය දැඩි වේ**

වෘෂභ ලග්නයට අනුව අද ඔබට සිතට දැඩි ශක්තියක් ඒම නිසා එදිනෙදා කටයුතු ඉතා අධිෂ්ඨානයෙන් ප්‍රසාදයෙන් කරගෙන යාමට හැකිවේ. රැකියාගත අභිවෘද්ධිය ඇති කෙරේ. වාහන, නිවාස, ඉඩම්, ප්‍රතිලාභ හිමිවන දිනකි. මූත්‍ර දෝෂ, ශරීරයේ උෂ්ණය දැඩි වීම නිසා පැමිණෙන උවදුරු නිසා පීඩා විඳීමට සිදුවේ. සැර උෂ්ණ ආහාරපාන අවම කර ඇඟ නිවෙන ආහාරපාන ගැනීම සුබවනු ඇත.

**මිථුන ලග්නය - බොහෝ හිතවතුන්ගේ ඇප උපකාර**

මිථුන ලග්නයට අනුව අද ඔබට තමා අපේක්ෂා කර සිටි පරිදි රැකියාගත ස්ථානමාරු දුරබැහැර ගමන් බිමන් යෙදෙන දිනකි. පිටරට ගමන්වලට බාධා පැමිණේ. නමුත් වෙළෙඳ ව්‍යාපාර දියුණුවේ. බොහෝ හිතවතුන්ගෙන් ඇප උපකාර ලැබෙනු ඇත. තම කාලය පොදු ජනතාව වෙනුවෙන් කැප කිරීමට සිදු වන අතර අධික වෙහෙස මහන්සිය නිසා පෞද්ගලික කටයුතු මගහැරෙනු ඇත.

**කටක ලග්නය - අභූත චෝදනා එල්ලවේ**

කටක ලග්නයට අනුව අද ඔබට විවාහගත ගැටලු ඒමට පුළුවන. තම සමීපතමයකු විසින් ගෙන එන අභූත චෝදනා නිසා සිත් තැවුලට පත් වීමට පවා සිදුවේ. රැකියා ස්ථානගත අභිවෘද්ධිය ඇතිවේ. රැකියා ස්ථානමාරු පවා ඒමට පුළුවන. දුර බැහැර රාජකාරිවලට යාමට සිදු වීම නිසා තම කටයුතුවල අවහිරතා ඇතිවේ. යුගදිවියේ අවුල්සහගත තත්ත්වයක් මතු කිරීමට ඉඩ ඇති නිසා කල්පනාකාරී වන්න.

**සිංහ ලග්නය - රැකියා යහපත**

සිංහ ලග්නයට අනුව අද ඔබට සුබයි. චන්ද්‍රයා ලග්නගත වී සිටීම තම කලාකාමී අදහස් මතු කෙරෙන අතර, නිර්මාණකරණයට යොමු වන දිනකි. රැකියාගත යහපත උදා වේ. උසස් නිලතල උරුමවේ. ගුරු 7ට විවාහ දිවියේ සතුට සැනසුම උදාවේ. පපුවේ වියළි ගති දණහිස ආශ්‍රිත ආපදා ඇති වීමට ඉඩ ඇති නිසා උඩ නැගීම් බිම පැනීම්වලදී පරිස්සම් වන්න..

**කන්‍යා ලග්නය - හිතවතුන්ගේ සහාය**

කන්‍යා ලග්නයට අනුව අද ඔබට තම හිතවතුන්ගේ සහාය නොඅඩුව ලැබෙන දිනකි. පිංමහිමය මත බොහෝ ලැබීම් මතු කළ ද ඒ සඳහා පවතින නීති ගැටලුවක් නිසා ප්‍රමාද වීම් සහිත වෙයි. ශාරීරික වශයෙන් වෙහෙස මහන්සිය නිසා තමා යාමට සිටි දුර ගමනක් නවතාලීමට සිදුවේ. ඒ නිසාම තම හිතවතකු ඒ වෙනුවට පිටත් කර හැරීමට ඔබට සිදු වේ.

**තුලා ලග්නය - නව ව්‍යාපාර ආරම්භයක්**

තුලා ලග්නයට අනුව අද ඔබට හදිසි ධන ලාභ පෙන්වයි. තමා කලක් පාඩුපිට කරගෙන ආ ව්‍යාපාරයක ලාභයක් එකවර ලැබීමට හේතුවේ. නව ව්‍යාපාර ආරම්භ කිරීම හා තම රැකියා ස්ථානගත නවීකරණ කටයුතු සිදු කරගන්නා දිනකි. වියදම හා ආදායම සමබර වන නිසා සකසුරුවම්ව කටයුතු කරන්න. නැත හොත් ඉහත කී පරිදි ලැබෙන දේ ප්‍රතිඵල සහගත නොවනු ඇත. තුනටියේ ආපදා පෙන්වයි. උඩ නැගීම් සීමා කරන්න.

**වෘශ්චික ලග්නය - සිතේ ව්‍යාකූල තත්ත්වයක්**

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට තම සිතේ පවතින ව්‍යාකූල තත්ත්වයක් නිසා එදිනෙදා කටයුතුවල ප්‍රමාදයක් අපිළිවෙළක් දක්නට ලැබේ. තම සමීපතමයින් දුරස්වන ලකුණු පෙනේ. පිය පාර්ශ්වයේ අයගෙන් දෝෂාරෝපණ අසන්නට ලැබෙන අතර ආරාධනා කර තිබූ ප්‍රිය සම්භාෂණ ආදිය කල් දැමීමට සිදුවේ. තම යුගදිවියේ ගැටලුවලට හේතුවනු ඇත.

**ධනු ලග්නය - උරුමකම් රැසක්**

ධනු ලග්නයට අනුව අද ඔබට ඉතා සුබ දිනක්. කලක් බලාපොරොත්තුව සිටි ණය මුදලක් තමාට ලැබේ. මහපොළොව ආශ්‍රිත ආදායම් උරුමකම් හිමිවේ. තම දරුවන්ගේ කටයුතු නිසා කාර්යබහුල වන දිනයක් වුව ද එදිනෙදා ජීවිතයේ ලැබීම් බහුලවේ. තමා කෙනකුට දී තිබූ මුදලක් යළි ඔබ අතට පත් වන දිනකි. පියාගේ ව්‍යාපාරය තමාට හිමි වන ලකුණු පෙනේ.

**මකර ලග්නය - ලැබීම් අතින් උසස් වේ**

මකර ලග්නයට අනුව අද ඔබට කිසියම් කලකිරුණු ස්වභාවයෙන් කාලය ගත කිරීමට සිදුවේ. ඒ නිසාම අන් වැඩ කටයුතු කල් දමන ස්වරූපයක් පෙනෙන්නට තිබේ. තමා අදහන ආ ගම තම රැකවරණයට සිටින බව දැන ආගමික කටයුතු කෙරෙහි දවසේ වැඩි කාලයක් කැප කරනු ඇත. කුස ආශ්‍රිත රෝග, කෑම අජීර්ණ හා විවිධ ශාරීරික අපහසුතා, නිදිබර ගතිය නිසා ද වැඩ අතපසු කෙරෙනු ඇත.

**කුම්භ ලග්නය -යුගදිවියේ සතුටුදායක සැමරුම්**

කුම්භ ලග්නයට අනුව අද ඔබට තම යුගදිවියේ සතුටුදායක සැමරුම් කීපයක් නිසා සිතේ සතුට සැනසුම උදාවේ. අවිවාහක අයට මංගල සීනු හැඬවේ. තම සහකරු හෝ සහකාරියගේ පාර්ශ්වයෙන් උසස් ලැබීම් හා ප්‍රසාදය හිමි වනු ඇත. නව නිවසට පදිංචියට යාමට හැකිවන අතර වාහනයක උරුමය පෙන්වන දිනකි. රැකියාවේ සතුටුදායක තත්ත්වයකි. දණහිසට අගුණයි. පරිස්සම් වන්න.

**මීන ලග්නය -තුති පැසසුම් ලැබේ**

මීන ලග්නයට අනුව අද ඔබට තම පියාට වන්නට තිබූ තනතුරක් මඟහැරී ගියද පවතින තත්ත්වයට අනුව නිතර නිතර සිතට බිය සැක සංකා මතු කෙරේ. ආර්ථික ප්‍රතිලාභ රැසක් හිමි වන අතර, මග තොට වැටී තිබෙන මුදල් පසුම්බියක් එහි නියමිත අයිතිකරු කවුදැයි සොයායාමට ඔබට සිදුවේ. ඒ ක්‍රියාව නිසා ඔබට ඉතා ප්‍රසාදාත්මක තුති පැසසුම් ලැබෙනු ඇත.

# වරාය නගර භූමිය පාලනය කරන්නේ ලංකාවේ නීතියට අනුව මෙරට ආණ්ඩුවෙන්

## බල ශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල

**උපාලි කරුණාරත්න**

වරාය නගර භූමිය පාලනය වන්නේ ලංකාවේ නීතියට අනුව ලංකා ආණ්ඩුවෙන් බව පිවිතුරු හෙළ උරුමයේ නායක, බල ශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල මහතා පැවැසීය.



ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ පෙරේදා (22) පිටකෝට්ටේ පිවිතුරු හෙළ උරුමය මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවේදීය.

එහිදී වැඩිදුරටත් ඇමැති උදය ගම්මන්පිල මහතා මෙසේද කීය.

මොන්ටෙවිඩේයෝ සම්මුතියේ සඳහන් වෙනම රාජ්‍යයක් සඳහා වන ලක්ෂණ හතරම වරාය නගරයට තිබෙන බව මා උගත් මිත්‍ර ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ මහතා පවසනවා. ඒක වැරදියි. සම්මුතියට අනුව වෙනම රාජ්‍යයක් වෙන්නට නම් නිශ්චිත ජනගහනයක්, නිශ්චිත භූමියක්, ආණ්ඩුවක්, වෙනත් රාජ්‍යයන් සමඟ සබඳතා ගොඩ නැගීමේ හැකියාවක් තිබිය යුතුයි. මේ ලක්ෂණ හතරින් වරාය නගරයට තිබෙන්නේ නිශ්චිත භූමියක් පමණයි.

මේ භූමියේ සිටින්නේ ලංකාවේ පුරවැසියන් සහ ලංකා ආණ්ඩුව වීසා ලබා දුන් විදේශිකයන්. මේ භූමිය පාලනය වන්නේ ලංකාවේ නීතියට අනුව ශ්‍රී ලංකා ආණ්ඩුවෙන්. එහි එදිනෙදා කටයුතු මෙහෙයවන්නේ මේ රටේ ජනතාව තෝරාගත් ජනාධිපතිවරයා විසින් පත්කරන කොමිසන් සභාවේ සාමාජිකයන්. ඒ වගේම මේ කොමිසමට වෙනත් රාජ්‍යයන් සමඟ ගිවිසුම්වලට එළැඹීමට බලයක් දී නෑ.

මොන්ටෙවිඩේයෝ සම්මුතිය අනුව වරාය නගරය වෙනම රාජ්‍යයක් බවට පත් කරන්නේ පනතේ කුමන වගන්තිවලින්දැයි විජයදාස මන්ත්‍රීවරයා රටට කිව යුතුයි. මුදල් විශුද්ධිකරණ තිප්පළක් වන්නේ පනතේ කුමන වගන්තිවලින්දැයි අමෙරිකානු තානාපතිනිය රටට කියන්න ඕනෑ. ලංකාව චීන කොළනියක් වන්නේ කෙසේදැයි ඕමල්පේ සෝභිත නාහිමියන් රටට කිවයුතුයි. බුදු හාමුදුරුවන් නම් කාලාම සූත්‍රයේ දේශනා කළේ කරුණු සොයා නොබලා අනුන් කියන පලියට පිළිගන්න එපා කියලා. අපේ ස්වාමීන් වහන්සේට කාලාම සූත්‍රය පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙන බව අප දන්නා කාරණයක්.

වරාය නගර කොමිෂන් සභා පනතට අද විපක්ෂය විරුද්ධ වුණත් 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතත් බොහෝ දුරට මීට සමානයි.එම පනත අනුව සමාගම්වලට විදේශ විනිමය මත බැංකු ගිණුම් විවෘත කර ගනුදෙනු කරන්න පුළුවන්. එදා පනත් 11ක් මහ කොළඹ ආර්ථික කොමිසමේ භූමියට අදාළ නොවුණා. අද පනත් හතක් පමණයි අදාළ නොවන්නේ.

# පාර්ලිමේන්තුවේදී මා කියූ බොහෝ කරුණු සුරාබදු දෙපාර්තමේන්තුව පිළිගෙන තිබෙනවා

## පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික පතිරණ

**සුභාෂිණී සේනානායක සහ පහන් විජේසේකර**

මත්පැන් බෝතල්වල ආරක්ෂිත ස්ටිකර් ඇලවීම සම්බන්ධයෙන් සිදු විය හැකි අක්‍රමිකතා පිළිබඳ පාර්ලිමේන්තුවේදී තමා අනාවරණය කළ බොහොමයක් කරුණු සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මේ වන විට පිළිගෙන ඇති බව මාතර දිස්ත්‍රික් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික පතිරණ මහතා පවසයි.

මේ කාරණාවට අදාළව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාධ්‍ය නිවේදනයක් උපුටා දක්වමින් මන්ත්‍රීවරයා මේ බව සඳහන් කළේය.

මත්පැන් බෝතල් මත ස්ටිකර් කේත ඇලවීම සම්බන්ධයෙන් පවතින අක්‍රමිකතා රැසක් පිළිබඳ තමා අනාවරණය කළත් සුරාබදු දෙපාර්තමේන්තුව එම නිවේදනය මගින් පිළිතුරු දී ඇත්තේ අදාළ ස්ටිකර් කේතය ජනතාවට ජංගම දුරකතන මගින් කියවීමට නොහැකිය යන කාරණාව පිළිබඳව පමණක් බවද මන්ත්‍රීවරයා මෙහිදී සඳහන් කළේය.

පාර්ලිමේන්තුවේදී සිය කතාවේදී මේ කටයුත්තට අදාළ ටෙන්ඩර් පටිපාටියේ අක්‍රමිකතා,දූෂණ චෝදනා එල්ල වූ සමාගමකට මේ ගනුදෙනුව ලබාදෙන්නේ කෙසේද වැනි කරුණු රැසක් පිළිබඳ තමා ප්‍රශ්න කළ බව කියා සිටි බුද්ධික පතිරණ මහතා එහෙත් සුරාබදු දෙපාර්තමේන්තුව සිය නවතම නිවේදනය මගින් ඒ කිසිදු කරුණක් පිළිබඳ පිළිතුරු නොදීමෙන් ඔවුන් ඒවා පිළිගෙන ඇති බවට තමා විශ්වාස කරන බවද අවධාරණය කළේය.



බුද්ධික පතිරණ මහතා මේ බව සඳහන් කළේ විපක්ෂ නායක කාර්යාලයේදී ඊයේ (23) පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි.

මත්පැන් බෝතල් මත ස්ටිකර් හෝ කේත මුද්‍රා තැබීමෙන් විශාල ජාවාරමකට පසුබිම නිර්මාණය වන බවයි හැඟීම. ඊට හේතු වී ඇත්තේ නිසි පටිපාටියෙන් තොරව මේ ටෙන්ඩරය ලබාදී ඇති MSP (Madras Security Printers) ඉන්දියානු ආයතනය ඉන්දියාව තුළ ද අසාදු ලේඛන ගත වී ඇති සමාගමක් බවත් මත්පැන් නිෂ්පාදන සමාගම් සමඟ එක්ව සිදු කළ බරපතළ වංචා නිසා එරට ප්‍රමිති ආයතන නිලධාරින්, මේ සමාගමේ ප්‍රධානියා ඇතුළු 17ක් කෙන්යාවේදී අත්අඩංගුවට පත් වී ඇති බවත් මෙහිදි පෙන්වා දුන් මන්ත්‍රීවරයා ශත 25ක් වැයවන එක ස්ටිකරයක් වෙනුවෙන් රුපියල් දෙකක මුදලක් වංචා සහගතව අයකර ගන්නා බව සඳහන් කළේය.

මසකට ලංකාවේ මත්පැන් බෝතල් මිලියන 04ක ප්‍රමාණයක් පරිභෝජනය කරන අතර මේ අනුව මේ ඉන්දියානු සමාගමට වසරකට රුපියල් බිලියනයක මුදලක් වංචා කරන්නට මුදල් අමාත්‍යාංශ සහ සුරාබදු දෙපාර්තමේන්තු නිලධාරින් ඉඩ සලසා තිබෙනවා.අදාළ නිලධාරින් මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ මහතා සහ අජිත් නිවාඩ් කබ්රාල් මහතා නොමග යවා මේ දූෂිත ව්‍යාපෘතියට අනුමැතිය ලබාගෙන ඇති අතර යහපාලන රජය සමයේ යෝජනා කළ දූෂිත ව්‍යාපෘතියක් වන මෙය නව රජය මගින් ද ක්‍රියාත්මක කිරීම පිළිබඳ තමා විමතියට පත්වන බව ද ඔහු මේ මාධ්‍ය හමුවකට එක්වෙමින් වැඩිදුරටත් කීය.

## මගීන්ට ඵලදායි සේවාවක්:

# ප්‍රවාහන පෙරගෙවුම් කාඩ්පත හඳුන්වා දීමේ ගිවිසුම්වලට අත්සන්



**සුභාෂිණී සේනානායක**

මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රය භාවිතා කරන මගී ජනතාවට වඩා ඵලදායී සේවාවක් ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රවාහන පෙරගෙවුම් කාඩ්පත හඳුන්වාදීමට ප්‍රවාහන අමාත්‍යාංශය විසින් පියවර ගෙන තිබේ.

ප්‍රවාහන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කරමින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් තවත් එක් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා ප්‍රවාහන පෙරගෙවුම් කාඩ්පතට අදාළ ගිවිසුම් අත්සන් කිරීම ප්‍රවාහන අමාත්‍යාංශයේදී පෙරේදා (22) සිදු කෙරිණි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති නීතිඥ කිංස්ලි රණවක, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති ශෂී වෙල්ගම, ලංකා ක්ලියර් පෞද්ගලික ආයතනයේ සාමාන්‍යාධිකාරී, ප්‍රධාන විධායක නිලධාරි චන්න ද සිල්වා, සහ මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කේ. බී. රාජපක්ෂ මහත්වරු අදාළව ගිවිසුමට අත්සන් තබනු තිබුණා.

කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව නීතිපතිවරයාට යොමු කළ මේ ව්‍යාපෘතිය මහ බැංකුවේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

මහබැංකුවේ නියෝජිත ආයතනයක් වන ලංකා ක්ලියර් පෞද්ගලික ආයතන විසින් කිසිදු මූල්‍යමය ප්‍රතිපාදනයක් නැතිව මේ සඳහා දායකත්වය ලබාදෙන අතර මහජන බැංකුව රුපියල් මිලියන 350ට අධික මුදලක් වැය කර තිබේ.

දිවයින පුරා පෙරගෙවුම් කාඩ්පත හඳුන්වා දෙන අතර මහබැංකුවේ අනුමත බැංකු මූල්‍ය ආයතන මගින් පෙරගෙවුම් කාඩ්පත මිල දී ගත හැකි අතර කාඩ්පත හෝ කාඩ්පතක් ලෙස භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ද භාවිතා කිරීමට හැකි වනු ඇත.

මුදල් ගනුදෙනු කිරීම හරහා කොවිඩ්- 19 වයිරසය ව්‍යාප්තිය අවම කරගැනීමට මේ කාඩ්පත හඳුන්වාදීමෙන් සිදු කෙරෙනු ඇති අතර මේ සඳහා අවශ්‍ය යන්ත්‍ර ලංගම බස් රථ සතුව පවතින අතර යන්ත්‍ර නැති පෞද්ගලික බස් රථ සඳහා බැංකු හරහා රුපියල් 50000 සහන ණය මුදලක් පිරිනැමෙනු ඇත.

ශ්‍රී ලංකාවේ එක් ප්‍රවාහන විද්‍යුත් ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා දුන් උපදෙස්වලට අනුව මේ ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කළ බව මේ අවස්ථාවට එක් වූ ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා පැවැසීය.

මේ පෙරගෙවුම් කාඩ්පත සඳහා රටේ සියලුම ප්‍රවාහන මාධ්‍ය නැඹුරු කරගැනීම ඉදිරියේදී සිදු කරන බව කියා සිටි ප්‍රවාහන ඇමැතිවරයා මේ සඳහා දුම්රියද එක්කර ගන්නා බවද කියා සිටියේය.

# ලංසු සඳහා ආරාධනය
## ශ්‍රී ලංකා ජාතික රෝහල
(සෞඛ්‍ය අමාත්‍යාංශය)
## රෙදිපිළි මිලදී ගැනීම

2021-05-17 වන දින පෙ.ව. 10.00 දක්වා ශ්‍රී ලංකා ජාතික රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දැක්වෙන රෙදිපිළි සැපයීම සඳහා සුදුසුකම්ලත් ආයතන හා පුද්ගලයින් වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු භාර ගනු ලැබේ.

| අයිතම අංක | අයිතමය | යොමු අංකය | අයිතම ප්‍රමාණය | 1-4 දක්වා අයිතම සඳහා ආපසු නොගෙවන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| 1 | 36" පළල සුදු අමුරෙදි | SF/01/2021 | 5000 මීටර | 3,000.00 |
| 2 | 72" පළල නිල් පාට අමු රෙදි | | 10000 මීටර | |
| 3 | 72" සුදු පාට අමු රෙදි | | 10000 මීටර | |
| 4 | 58" කොළ පාට ෂීට්න් රෙදි | | 5000 මීටර | |


02. ශ්‍රී ලංකාව තුළ රෙදිපිළි නිෂ්පාදනය කරන හා ශ්‍රී ලංකා වෙළඳ පොළට රෙදිපිළි සපයන බලය ලත් නියෝජිතයින් පමණක් මෙම ලංසු ආරාධනය සඳහා සහභාගි වීමට සුදුසුකම් ලබයි.

03. ලංසු ලියවිලි, සතියේ වැඩ කරන දිනයන් තුළදී 2021-04-27 දින සිට 2021-05-13 දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 2.00 දක්වා ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉහතින් දක්වා ඇති නැවත නොගෙවන ගාස්තු ගෙවා කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැක. (දුරකථන අංකය : 011-2691111 දිගුව : 2722)

04. මුද්‍රා තබන ලද ලංසු 2021-05-17 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන්නේ න ම් ශ්‍රී ලංකා ජාතික රෝහලේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිම කළ හැක ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

**වෛද්‍ය ඩබ්.කේ. වික්‍රමසිංහ,**
**සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ 10.**

# රැකියා ඇබෑර්තු



## කාර්මික ඇබෑර්තු
**ප්‍රවාහන ආයතනයකට අශෝක් ලේලන්ඩ් වාහන අලුත්වැඩියා කිරීම සඳහා පළපුරුදු කාර්මිකයන් අවශ්‍යව ඇත.**
නවාතැන් පහසුකම් ලබාදෙන අතර, වැටුප් සම්බන්ධයෙන් පැමිණ කථා කරගත හැක.
පළපුරුද්ද සම්බන්ධ සහතික සහ ග්‍රාම සේවක සහතිකය සමග සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පැමිණෙන්න.
**නො. 95, ඥාණවිමල පාර. දෙමටගොඩ, කොළඹ 09.**

## ප්‍රධාන පෙළේ ප්‍රවාහන ආයතනයකට බර වාහන (රෝද 10) සහ ප්‍රයිම් මුවර් රියදුරන් සහ සහායකයින් සඳහා ඇබෑර්තු

1. හොඳ වැටුප්
2. කොමිෂන්
3. නවාතැන් පහසුකම්

සම්මුඛ පරීක්ෂණ සඳහා සඳුදා සිට සිකුරාදා දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට 12.00 දක්වා පොලිස් හා ග්‍රාම සේවක වාර්තා සමග සියලු සහතික රැගෙන එන්න.

**නො. 95, ඥාණවිමල පාර, කොළඹ 09.**
**දෙමටගොඩ.**


දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න

නුගේගොඩ
සවිසිරි වෙළඳ සංකීර්ණය
4 වන මහල, හයිලෙවල් පාර,
011 282 8114
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949


## සී/ස පූජාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය - පූජාපිටිය
## තනතුරු පුරප්පාඩු

මෙම සමිතියේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුර සඳහා 2021.05.08 දින දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

**කළමනාකරු (සුපිරි වෙළෙඳසැල්) II & I**

- **වැටුප් පරිමාණ අංකය** - M.M.L. 03 : 06
- **වැටුප් පරිමාණය** - 17500-360 x 10 - 460 x 10 - 610 x 10 = 31,800/-
  - 01. සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත රු. 5,000.00 දීමනාව
  - 02. අනුමත අනෙකුත් පහසුකම්
  - 03. විශ්‍රාම වැටුප් ක්‍රමයටද දායක කෙරේ
- **වයස් සීමාව** - අවුරුදු 18 – 45 දක්වා (සමුපකාර සේවයේ නියුතු වූවන්ට වයස් සීමාව බල නොපැවැත්වේ)
- **පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 04**
- **සුදුසුකම්**
  - අ. අ.පො.ස (උසස් පෙළ) විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 04 කින් / විෂයයන් 01 කට සම්මාන සහිතව විෂයයන් 03 කින් සමත්වීම

    **හෝ**
  - ආ. සමුපකාර උසස් පෙළ සමත්වීම සමග පිළිගත් ආයතනයක සුපිරි වෙළෙඳසැල් කළමනාකරු තනතුරක වසරකට නොඅඩු සේවා පළපුරුද්ද හෝ සමුපකාර වෙළෙඳසැල් කළමනාකරණය පිළිබඳ මාස 09 ක අධ්‍යයන කාලයකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාව හදාරා තිබීම

    **හෝ**
  - ඇ. සමුපකාර වෙළෙඳසැල් කළමනාකරණය පිළිබඳ මාස 09 ක අධ්‍යයන කාලයකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාව සමග මධ්‍යය කළමනාකරණ iii මට්ටමේ පරිපාලක (වෙළෙඳසැල්) තනතුරක වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

සමිතිය විසින් පිළියෙල කර ඇති අයදුම්පතක් මගින් ඉල්ලුම් කළ යුතුය. අයදුම්පත සමග අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් සහ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් අමුණා තිබිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ තනතුරු නාමය සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2021.05.08 දින දහවල් 12.00** ට පෙර එවිය යුතුය. මූලික සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, ලිඛිත දැනුම් දීමක් සිදු නොකෙරේ.

**සභාපති,**

**අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය,**
**ගරු සභාපති,**
**සී/ස පූජාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය,**
**පූජාපිටිය.**

# REGIONAL DIRECTORATE OF HEALTH SERVICES, JAFFNA
## INVITATION FOR BIDS (IFB)
## PROCUREMENT OF OFFICE EQUIPMENT & ELECTRONIC ITEMS

A. The Regional Procurement Committee invites sealed bids from eligible and qualified bidders for the Supplies, goods as specified in the following Tables.
   01. Office Equipment
   02. Electronic Items

   Bidding will be conducted through National Competitive Bidding Procedure

B. To be eligible for contract award the successful bidder shall not have been blacklisted and shall fulfill the following requirements
   01. Bidders shall have valid business registration and
   02. Business registration for supply of respective Supplies and Services
   03. Regional preference and CIDA grade preference will be applicable as stipulated in Public Finance circular No 4/2016(11)

C. Interested eligible bidders may obtain further information from the Regional Director of Health Services, Jaffna Contact No. (021 2222278/4557 Ext: 20), during the office hours and inspect the Bidding Documents at the same address on any working days from 9.00 am to 3.00 pm except 12.30 to 13.30 hours

D. A complete set of Bid documents in English may be purchased by interested bidders on the submission of "Application for Bid Documents" available in this office and upon payment of a **non refundable fee as** specified in the table by cash on working days from 27.04.2021 to 11.05.2021 from 09.00 Hours to 15.00 Hours.

E. Bids shall be delivered to Chairman, Regional Procurement Committee , Regional Directorate of Health Services, No.572/3, Hospital Road, Jaffna at or before 10.00 Hours on 12.05.2021. Late bids will be rejected. Bids will be opened soon after closing in the presence of bidder's representatives who choose to attend.

F. Bids shall be valid for a period of 90 days from the last date fixed for receiving of Bids or any extended period and Bid Security should be valid for 118d ays from the bid opening date.

G. Pre-bid Conference will be held at Conference Hall, Office of the Regional Director of Health Services, Jaffna commencing at 10.00am on 05.05.2021.
   01. Table I – 10.00 a.m.
   02. Table 11 -10.30 a.m

I. Procurement committee will have the right to make the final decision in regard to this procurement.

| Reference No | Item | Qty | Non refundable fees | Bid Security |
|---|---|---|---|---|
| NP/RDHS/PSDG/OE/2021/01 | Office Table | 20 | 1,000.00 | 30,000.00 |
| | Computer Table | 05 | | |
| | Executive Table | 05 | | |
| | Plastic Table | 05 | | |
| | Office Chair (Revolving) | 60 | | |
| | Executive Chair | 04 | | |
| | Visitors Chair | 04 | | |
| | Filing Cabinet | 10 | | |
| | Drawer Steel Four | 04 | | |
| | Revolving Adjustable Stool | 02 | | |
| | Almirah Steel | 12 | | |
| | Dispenser Table | 01 | | |
| NP/RDHS/CBG/OE/2021/03 | Front Glass Almirah | 09 | 1000.00 | 16,000.00 |
| | Conference Table (Capacity 20 Persons) | 01 | | |
| | Conference Table (Capacity 09 Persons) | 01 | | |
| | Reception Table (Office Table Large) | 05 | | |
| | Conference Chair | 70 | | |
| | Plastic Chair with Arm | 250 | | |
| | Plastic Chair Without Arm | 20 | | |

| Reference No | Item | Qty | Non refundable fees | Bid Security |
|---|---|---|---|---|
| NP/RDHS/PSDG/OE/2021/02 | Bed | 03 | 1,000.00 | 11,000.00 |
| | Bed side Locker | 05 | | |
| | Benches with Backrest | 10 | | |
| | Wooden Bed | 02 | | |
| | Mattress | 23 | | |
| | Glass Pad | 03 | | |
| | Almirah Wooden | 02 | | |
| | Stool | 05 | | |
| | Stool ( Small) | 04 | | |
| | Stool Wooden | 05 | | |
| NP/RDHS/PSDG/OE/2020/04 | Waste Bin With Colour Coading | 01 | 1,000.00 | 1,000.00 |
| | Waste Collection and Transport Trolley (3 Big Bucket) | 02 | | |
| | Plastic Bucket | 03 | | |
| | Plastic Bucket 25 Lit | 05 | | |
| | Plastic Bucket 30 Lit | 05 | | |
| | Plastic Bucket 50 Lit | 05 | | |
| | Plastic Bucket 09 Lit | 05 | | |
| | Plastic Bucket 05 Lit | 10 | | |

**Table -11**

| Reference No | Item | Qty | Non refundable fees | Bid Security |
|---|---|---|---|---|
| NP/RDHS/PSSP/PSDG/EI/2020/01 | Laptop Computer | 23 | 1,000.00 | 65,000.00 |
| | Desktop Computer | 07 | | |
| | Photocopy Machine | 02 | | |
| | Printer | 02 | | |
| | Scanner | 02 | | |
| | Dot Matrix Printer | 01 | | |
| | Laminating Machine | 02 | | |
| NP/RDHS/PSSP/PSDG/EI/2020/02 | Air Conditioner 9000BTU | 02 | 1,000.00 | 7,000.00 |
| | Television | 02 | | |
| | Pedestal Fan | 05 | | |
| | Ceiling Fan | 14 | | |

**Chairperson,**
**Regional Procurement Committee,**
**RDHS Office,**
**Jaffna.**

# ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
## පුරප්පාඩු

ලේක්හවුස් නමින් ප්‍රචලිත ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යයේ මහගෙදර සහ හදවතයි.

වසර 100 කට අධික ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ පුරෝගාමී මුද්‍රිත මාධ්‍ය ආයතනය මාර්ගගත ප්‍රකාශනයේ වසර 25 ක් නිරත වී ඇති අතර, මුද්‍රිත මාධ්‍ය කර්මාන්තයේ තවදුරටත් අංක එක ස්ථානය දරයි.

පහත සඳහන් තනතුරු සඳහා මතු දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්ද සතු තරුණ හා ක්‍රියාශීලී අයවළුන් හට අපි විසින් ආරාධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| **ග්‍රැෆික් නිර්මාණකරු (තනතුරු 01)** | | |
| අධ්‍යාපනික සුදුසුකම් | ★ | සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස. සා.පෙළ සමත් විය යුතුය. |
| වෘත්තීය සුදුසුකම් | ★ | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක ග්‍රැෆික් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම. |
| සේවා පළපුරුද්ද | ★ | පිළිගත් මුද්‍රණ ආයතනයක ග්‍රැෆික් නිර්මාණකරුවකු ලෙස වසර 03 ක පළපුරුද්ද. |
| **පොත් බැඳුම්කරු (තනතුරු 02)** | | |
| අධ්‍යාපනික සුදුසුකම් | ★ | සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ සමත්විය යුතුය. |
| වෘත්තීය සුදුසුකම් | ★ | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක පොත් බැඳීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිමා කිරීම |
| සේවා පළපුරුද්ද | ★ | පිළිගත් මුද්‍රණ ආයතනයක පොත් බැඳුම්කරුවකු ලෙස වසර 03 ක පළපුරුද්ද. |
| **CTP ක්‍රියාකරු (තනතුරු 01)** | | |
| අධ්‍යාපනික සුදුසුකම් | ★ | සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා. පෙළ සමත්විය යුතුය. |
| වෘත්තීය සුදුසුකම් | ★ | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක CTP ක්‍රියා කිරීම සම්බන්ධයෙන් සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිමා කිරීම |
| සේවා පළපුරුද්ද | ★ | පිළිගත් මුද්‍රණ ආයතනයක CTP ක්‍රියාකරුවෙකු ලෙස වසර 03 ක පළපුරුද්ද. |
| **ගිලටින් කටර් (තනතුරු 01)** | | |
| අධ්‍යාපනික සුදුසුකම් | ★ | සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා. පෙළ සමත්විය යුතුය. |
| සේවා පළපුරුද්ද | ★ | පිළිගත් මුද්‍රණ ආයතනයක ගිලටින් කටර් ලෙස වසර 03 ක පළපුරුද්ද. |
| **ලෙටර් ප්‍රෙස් මැෂින් මයින්ඩර් (තනතුරු 01)** | | |
| අධ්‍යාපනික සුදුසුකම් | ★ | සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ සමත්විය යුතුය. |
| සේවා පළපුරුද්ද | ★ | පිළිගත් මුද්‍රණ ආයතනයක ලෙටර් ප්‍රෙස් මැෂින් මයින්ඩර්වරයෙකු ලෙස වසර 03 ක පළපුරුද්ද තිබිය යුතුය. |

**වයස** : අවුරුදු 35 ට අඩු විය යුතුය.
**වැටුප** : සාකච්ඡා කරගත හැකිය

කරුණාකර ඔබගේ ජීවදත්ත ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා විමසීම් විස්තර සමග මෙම දැන්වීම පළවී වැඩකරන දින 7 ක් ඇතුළත පහත ලිපිනයට හෝ විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු අතර, විද්‍යුත් තැපෑලේ විෂයය යන තීරයේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

LAKE HOUSE

**ප්‍රධානී / මානව ප්‍රාග්ධන,**
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,**
**නො. 35, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.**
**dgm.hc@lakehouse.lk**

## ග්‍රාමීය හා ප්‍රාදේශීය ජල සම්පාදන ව්‍යාපෘති රාජ්‍ය අමාත්‍යංශය

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

### ප්‍රසම්පාදන ලියකියවිලි භාර ගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

2021.03.29 දින පළ වූ ප්‍රසම්පාදන දැන්වීමෙහි ප්‍රසම්පාදන ලියකියවිලි භාර ගන්නා අවසාන දිනය 2021.05.05 පෙ.ව. 10.00 දක්වා දීර්ඝ කරන ලදී.

අනෙකුත් කොන්දේසි හා නියමයන් නොවෙනස්ව පවතී.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,**
**නො. 1114, පන්නිපිටිය පාර,**
**තලවතුගොඩ.**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියේ ප්‍රකාරව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම
**එක්ස්පර්ට්ලැබ්ස් (පීවීටී) එල්ටීඩී**
සමාගමේ අංකය : පීවී 00237715
ලියාපදිංචි දිනය : 05 අප්‍රේල් 2021
ලියාපදිංචි ලිපිනය
නො. 724/4, මැදවල පාර,
ඇරැව්වල, පන්නිපිටිය.
**සමාගම් ලේකම්**

---

### නම වෙනස් කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 531/77 හලාවත පාර, මීගමුව ලිපිනයේ පදිංචි **මොහොමඩ් සාතික්** වන මා විසින් මගේ දියණිය වන **ෆාතිමා රුකයියා සාදික්** මෙතැන් පටන් **ෆාතිමා රුකයියා** යනුවෙන් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා රජයටත් මහ ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට, පියා වන,
මොහොමඩ් සාතික්

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මඩකලපුව, ඒරන්ස් පටුමඟ, නො.18 හිදී පදිංචි නාගප්පර් මුරුගුප්පිල්ලෙයි කන්දසාමි යන අයට වත්තල, හැඳල, නායකකන්ද, ශාන්ත මේරිස් පාර,නො.12/7-B හි පදිංචි වර්තමාන ලිපිනය 6415, 23rd Avenue, Montreal (Quebec), H1T3N2, Canada හි පදිංචි නාගරාජා විවේකානන්දරාජා වන මා ප්‍රසිද්ධ නොතාරිස්/ නීතිඥ මේරිස් පෙකුයින් තොටරි 3250 east jean-Taloni, Montreal Quebec Canda H2A 1W1) ඉදිරිපිටදී අත්සන් කරන ලද 27-03-2017 දිනැති මඩකලපුව, නැගෙනහිර කොට්ඨාස, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 05-05-2017 දිනැති 300 වන අනු අංකයේ 25 වැනි පොතින් 18 වැනි ඡේදයේ ලියාපදිංචි කර තිබූ විශේෂ ඇටෝනි බලය අවලංගු කරන බව ශ්‍රී ලංකා රජයටත් මෙන්ම මහජනතාවට ද මෙයින් දැනුම් දෙමි. මින් පසු ඉහත අයගේ කිසිම ක්‍රියාවකට මා වග කියන්නේ නැති බව ද වැඩිදුරටත් දැනුම් දෙමි.

**නාගරාජා විවේකානන්දරාජා**

---

## බේරා නොගත් උකස් රන් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

සී/ස වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ උකස් නියෝජිතයින් වන සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිතියේ

**අඹකඳවිල/ වැල්ල / මයික්කුලම / වැලිහේන / දිනපොල / ජයබිම / මුගුනුවටවන / මුන්නේශ්වරම / කුමාරකට්ටුව / බංගදෙනිය / හලාවත / මානුවන්ගම**

ශාඛාවන්හි 2019.12.31 දිනද ඇතුළත්ව එදින දක්වා උකස් තබන ලද එහෙත්, 2021.05.21 දක්වා බේරා නොගත් රන් භාණ්ඩ 2021 මැයි 22 සෙනසුරාද දින පෙ.ව. 9.00 යේ සිට සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිති ප්‍රධාන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබයි.

**මෙයට, සමුපකාරික,**
**සාමාන්‍යාධිකාරී,**
**සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිතිය,**
**අංක 41, කොළඹ පාර, හලාවත.**
**දු. ක. 032-2222364**

---

## ප්‍රසම්පාදන දැන්වීමයි

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවට අයත් 53 - 6111 කැබ් රථය හා 43 - 4450 වෑන් රථය අලුත්වැඩියා කිරීම සඳහා 2021-05-17 වෙනි දින ප.ව. 3.00 දක්වා මා විසින් මිල ගණන් භාරගනු ලැබේ. අදාළ මිල ගණන් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"53-6111 කැබ් රථය හා 43 - 4450 වෑන් රථය අලුත්වැඩියා කිරීම"** යනුවෙන් සඳහන් කර ලේකම්, ප්‍රාදේශීය සභාව, කොබෙයිගනේ යන ලිපිනයට තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. වැඩි විස්තර සභාවට පැමිණ හෝ 037-2293076 දුරකථනයෙන් ලබාගත හැකිය.

**සභාපති,**
**ප්‍රාදේශීය සභාව, කොබෙයිගනේ**

**2019-10-14 දින**
**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේදීය.**

---

# දැන්වීමයි

## පන්විල ප්‍රාදේශීය සභාව - පන්විල

පන්විල ප්‍රාදේශීය සභාවට අයත් හුළුගහ නගරයේ පිහිටි පොල භූමියේ පළමු මහලයේ කඩ කාමර 05 ක් බදු කරුවන්ගෙන් සම්පූර්ණ මුදල් අයකර ඉදිකිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| කඩ කාමර අංකය | ප්‍රමාණය | අවම ලංසු මිල |
|---|---|---|
| 01 | 14' - 16" x 10' - 11" | 1,470,695.34 |
| 02 | 14' - 9" x 10' - 11" | 1,496,052'16 |
| 03 | 17' - 2" x 9' - 11" | 1,581,039.30 |
| 04 | 14' - 9" x 10' - 11" | 1,496,052.16 |
| 05 | 14' - 6 x 10' - 11" | 1,470,695.34 |

ඉහත කඩ කාමර ඉදිකර බදු පදනම මත ලබා ගැනීම සඳහා 2021.04.27 දින සිට 2021.05.19 දක්වා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. 2021.04.27 දින සිට 2021.05.19 දක්වා කාර්යාල වේලාවෙන් (පෙ.ව. 8.30 – ප.ව. 4.00) තුළ පහත පරිදි ගාස්තු ගෙවීමෙන් පසු ටෙන්ඩර් අයදුම්පත් කාර්යාල දිනයන්හිදී කාර්යාලයෙන් ලබාගත හැකිය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අනු පිටපත සහිත අයදුම්පත් **"ලේකම්, පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල"** යනුවෙන් වෙන් වෙන්ව මුද්‍ර, තබා 2021.05.19 දින පෙ.ව. 10.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර් විවෘත කිරීම 2021.05.19 දින පෙ.ව. 10.30 ට සිදුකරන අතර ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ අදළ බදු දේපලේ නම සඳහන් කර මුල්පිටපත හා අනු පිටපත අයදුම්පත යනුවෙන් සඳහන් කළ පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පෝරම ගාස්තු (රු.) 500.00
ආපසු නොගෙවන ටෙන්ඩර් තැම්පත් ගාස්තුව (රු.) 3,500.00
ආපසු ගෙවන ටෙන්ඩර් තැම්පත් ගාස්තුව (රු.) 5,000.00
විමසීම් : දුරකථන අංකය – 0812472028

**ලේකම්,**
**පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල.**

---

# ප්‍රසම්පාදන දැන්වීමයි

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## දකුණු පළාත් සභාව

### කැකණදුර සත්ත්ව ගොවිපළ සඳහා සත්ත්ව ආහාර මිලදී ගැනීම

දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කැකණදුර සත්ත්ව ගොවිපළ සඳහා 2021 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා අවශ්‍ය සත්ත්ව ආහාර ප්‍රවාහනය කර සැපයීමට දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන .... අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ලංසු පත් කැඳවනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් සත්ත්ව ආහාර වර්ගයන් මසකට අවශ්‍ය ප්‍රමාණය වර දෙකකට වන පරිදි කැකණදුර සත්ත්ව ගොවිපළ වෙත ප්‍රවාහනය කර සැපයිය යුතුය.

| මාසය | සත්ත්ව ආහාර වර්ගයන් අනුව මසකට සැපයිය යුතු ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගව ආහාර | චික් ස්ටාටර් | කාෆ් ස්ටාටර් | ග්‍රෝවර් ෆීඩ් | ලේයර් ෆීඩ් | කැල්සයිට් |
| ජුනි | 3000 | 50 | 50 | 2100 | 8800 | - |
| ජූලි | 3150 | 50 | 50 | - | 12250 | - |
| අගෝස්තු | 3150 | 550 | 50 | - | 12000 | - |
| සැප්තැම්බර් | 3000 | 900 | 50 | 250 | 12050 | 1500 |
| ඔක්තෝබර් | 3150 | 50 | 50 | 1450 | 12500 | - |
| නොවැම්බර් | 3000 | 50 | 50 | 1500 | 12100 | - |
| දෙසැම්බර් | 3150 | 50 | 50 | 900 | 13900 | - |

ඉහත සඳහන් සත්ත්ව ආහාර සැපයීම සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඒ සඳහා නියමිත ලංසු ආකෘති පත්‍ර මගින් තම ලංසු ඉදිරිපත් කළ යුතු අතර, එම ලංසු ආකෘති පත්‍ර, ආපසු නොගෙවනු ලබන රු. 1,000/- මුදලක් දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන . . . . අමාත්‍යාංශ කාර්යාලය වෙත ගෙවා 2021 මැයි මස 07 දින දක්වා සතියේ වැඩ කරන දින වලදී ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පත් 2020 මැයි මස 10 දින ප.ව. 4.30 ට පෙර **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන . . . . අමාත්‍යාංශය, 2 වන මහල, "දක්ෂිණපාය" ලබුදුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් බාර දිය හැකි අතර, එදින එම වේලාවේදීම ලංසු පත් විවෘත කරනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන . . . . අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

**සභාපති,**
**ප්‍රසම්පාදන මණ්ඩලය,**
**දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන . . . . අමාත්‍යාංශය,**
**2 වන මහල,**
**"දක්ෂිණපාය", ලබුදුව, ගාල්ල.**
**දු. ක. 091-2246621**

---

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### කුඩා වැව්වලට ජලය සැපයීම සඳහා සහ කාර්ය මණ්ඩලයේ හා වන උද්‍යානයට පැමිණෙන අමුත්තන්ගේ භාවිතයට ජලය සැපයීම සඳහා යාල වන උද්‍යානයේ පීවීසී පයිප්ප (4") සැපයීම සහ ඇතිරීම අදියර I සහ II (කිමී 20 ක්)

**කොන්ත්‍රාත් අංක :** **LK-ESCAMP-DWC-117577-CW-RFB**
**LK-ESCAMP-DWC-124033-CW-RFB**

01. බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82 පිහිටි වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ESCAMP ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය යටතේ පහත සඳහන් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

    ප්‍රමාණ පත් අනුව අගල් කැණීම, පීවීසී පයිප්ප ඇතිරීම, මනු බිල (මැන්හෝල්) සෑදීම, අගල් නැවත පිරවීම මෙම කර්මාන්තයේ අඩංගු වේ.

02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ජල සම්පාදන හා ජලාපවහන ක්ෂේත්‍රයේ සී 4 හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) (කලින් ICTAD) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවන්ට මෙය ද ඇතුළත්වේ.
    - පසුගිය වසර පහ තුළ ඉටුකළ ජල සම්පාදන හා ජලාපවහන කර්මාන්තවල වාර්ෂික ධාරිතාවේ සාමාන්‍ය අවම වශයෙන් රු. මිලියන 130 විය යුතුය.
    - පසුගිය වසර පහ තුළ මෙම ජල සම්පාදන හා ජලාපවහන කර්මාන්තයට සමාන ස්වභාවය හා සංකීර්ණත්වයෙන් යුත් අවම වශයෙන් කොන්ත්‍රාත් 02 ක් ඉදිකිරීමේ පළපුරුද්ද. (මෙම අවශ්‍යතාවට අනුකූල වීම සඳහා සඳහන් කරනු ලබන කර්මාන්තය අවම වශයෙන් 70% ක් සම්පූර්ණ කර තිබිය යුතුය)
    - පත්කරනු ලබන තාක්ෂණික හා කළමනාකරණ කාර්ය මණ්ඩලයට මෙය ද අතුළත් විය යුතුය. සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී - ඉංජිනේරු උපාධිය සමත් හෝ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ සමාන සුදුසුකම් සමග වසර පහක (05) පළපුරුද්දක් එයින් අවම වශයෙන් සමාන කර්මාන්ත පිළිබඳ පළපුරුද්දක් සහිත නේවාසික ඉංජිනේරුවෙක්.
    - අනෙකුත් කොන්ත්‍රාත්මය වගකීම් හැර හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදු කරන අත්තිකාරම් ගෙවීම් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් රුපියල් මිලියන 50 ට අඩු නොවිය යුතුය.
    - ලංසු දත්ත 4.3 වගන්තියේ ලයිස්තුගත කර ඇති අත්‍යවශ්‍ය උපකරණ තමන් සතු බව හෝ / හා කාලෝචිතව අත්පත් කර ගැනීම (සතුවීම, බදු ගැනීම, කුලියට ලබා ගැනීම යනාදිය) සඳහා වන යෝජනා.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82 පිහිටි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ESCAMP ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් (දුරකථනය : 011-2888428, ෆැක්ස් 011-2888577) ලබාගත හැකි අතර 2021 මැයි 20 වෙනි දින දක්වා සතියේ දිනවල පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

05. ආපසු ගෙවනු නොලබන රු. 35,000.00 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2021 මැයි 20 වෙනි දින 15.00 පැය දක්වා බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82 පිහිටි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ESCAMP ප්‍රසම්පාදන අංශය වෙතින් ඉංග්‍රීසි බසින් සකස් කර ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

06. ලංසු, 2021 මැයි 21 වෙනි දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පිටපත් දෙකකින් යුතුව ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

07. සියලුම ලංසු සමග රු. 1,600,000.00 ක වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.

08. යාල ජාතික වන උද්‍යානයේ වනජීවී කාර්යාලයේ 2021 මැයි 10 වෙනි දින පෙ.ව. 10.00 ට වැඩ බිම් පරීක්ෂා කිරීමේ සංචාරයක් පැවැත්වෙන අතර, එම ස්ථානයේදී 2021 මැයි 11 වෙනි දින පෙ.ව. 10.00 ට පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වේ.

09. ලංසුකරුවන්, ලංසු සමග PCA 3 ආකෘතිය (1987 පොදු කොන්ත්‍රාත් පනත) ඉදිරිපත් කළ යුතුය. (http://www.drc.gov.lk)

10. ඕනෑම ලංසුවක් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව සතුය. ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.


ඉහත සඳහන් කරන ලද ලිපිනය නම්,

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - ESCAMP,**
**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දුරකථනය: 011-2888426 / 011-2888427**
**ෆැක්ස් : 011-2888577**
**දිනය : 2021 අප්‍රේල් 24**


BE BETTER INFORMED! News you can trust now free on your mobile phone.

Dinamina | Daily News | Thinakaran

AVAILABLE AT



Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!

LAKE HOUSE

**පොල් මිල**
**පොල් සංවර්ධන අධිකාරිය**
**ප්‍රකාශිත දිනය 2021/04/23**

1. පොල් මිල

(අ) වෙළෙඳ පොළ මිල ගණන් 2021.04.02 -2021.04.08 (මූලාශ්‍රය - HARTI)

| | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|
| ලොකු ප්‍රමාණය ගෙඩියක මිල රු. | 70.00 - 72.00 | 80.00 - 90.00 |
| කුඩා ප්‍රමාණය ගෙඩියක මිල රු. | 60.00 - 65.00 | 60.00 - 75.00 |

(ඇ) දේශීය ගොවිපළ මිල රු/ගෙඩි 1000ක් (ලෙලි නොගසන)
රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද)

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 60, 000 - 70, 000 | 107, 000 -116, 000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 60, 000 - 65, 000 | 108, 000 -114, 000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 57, 000 - 60, 000 | 110, 000 -115, 000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 60, 000 - 70, 000 | 105, 000 - 112, 000 |

2. දිසිඳි පොල් -

සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශිය) (රු./කි.ග්‍රෑ.1 ක්) 530 - 540 සා
(රු./කි.ග්‍රෑ.1 ක්) 535 - 550 සා
ශ්‍රී ලංකා - නැවතෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්)

3. පොල් තෙල් (තොග මිල)

දේශීය මිල (රු./මෙ.ටො.1ක්) 650, 000 - 700, 000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.04.15) (රු./මෙ.ටො.1ක්) 316, 150

| | | |
|---|---|---|
| 5. පුන්නක්කු | (රු./මෙ.ටො.1ක්) | 65, 000 - 80, 000 වි |
| 6. ගුදිරි කොහු | (රු./කි.ග්‍රෑ.50 ක්) | 950 - 1, 400 වි |
| 7. ඕමැට් කොහු | (රු./කි.ග්‍රෑ.50 ක්) | 3, 750 - 5, 000 වි |
| 8. මිශ්‍ර කොහු | (රු./කි.ග්‍රෑ.50 ක්) | 1, 500 - 1, 750 වි |
| 9. බ්‍රිස්ටල් කොහු බැමි 1 | (රු./කි.ග්‍රෑ.50 ක්) | 5, 000 - 7, 000 වි |
| 10. බ්‍රිස්ටල් කොහු බැමි 2 | (රු/කි.ග්‍රෑ. 50ක්) | 7, 500 - 8, 500 වි |
| 11. පොල් ලෙලි මිල | (16-03-2021) | |

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) |
|---|---|
| පුත්තලම | 4, 500 - 5, 000 |
| ගම්පහ | 4, 500 - 5, 000 |
| මාතර | 4, 500 - 5, 000 |
| කුරුණෑගල | 4, 500 - 5, 500 |

තෙතමනය 50% වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.00
තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.50
තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 8.50
තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 9.50
තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 10.50
තෙතමනය 10% අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 13.00

12. පොල් කටු (රු/මෙ. ටො. 1ක්) 29, 500 - 30, 500 වි

13. පොල් කටු අඟුරු (2021-03-19 - 2021-03-25) (රු/මෙ.ටො. 1ක්) 110, 000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)

14. පොල් ඉරටු (රු./මෙ.ටො. 1ක්) 43, 000 - 45, 000 වි

**වි - විකුණුම් මිල** **සා.- සාමාන්‍ය මිල**

## වසරේ කාන්තා ව්‍යවසායිකා සම්මානය වික්‍රමාරච්චි රසායනාගාරයට



ආයුර්වේද නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් වන වික්‍රමාරච්චි රසායනාගාරය ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL)සංවිධාන කළ වසරේ ව්‍යවසායකයා සම්මාන උලෙළේදී ජාතික මට්ටමේ, මධ්‍ය පරිමාණ කාණ්ඩයේ, වසරේ විශිෂ්ටතම කාන්තා ව්‍යවසායිකාව සහ බස්නාහිර පළාතේ, මධ්‍ය පරිමාණ කාණ්ඩයේ, වසරේ විශිෂ්ටතම කාන්තා ව්‍යවසායිකාව යන සම්මාන ද්විත්වයෙන් පිදුම් ලැබීය.

සම්මාන උලෙළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස BMICHහිදී පැවැත්විණි. වික්‍රමාරච්චි රසායනාගාරයේ ව්‍යාපාර හවුල්කාරිනී රුවිනි ඉරෝෂා වික්‍රමාරච්චි මහත්මිය එහිදී සම්මානය ලබා ගත්තාය. "මෙය සැබැවින්ම තනි පුද්ගලයකුගේ ජයග්‍රහණයක් නොව කණ්ඩායමක් වශයෙන් ලැබූ ජයග්‍රහණයක්. මේ ජයග්‍රහණයට දායකත්වය දැක්වූ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම ස්තූතිවන්ත වන අතර, අපගේ නිෂ්පාදන විශ්වාස කළ පාරිභෝගිකයන්ට හදවතින්ම ස්තූතිවන්ත වෙනවා." රුවිනි ඉරෝෂා වික්‍රමාරච්චි මහත්මිය පැවසුවාය.

සෞඛ්‍ය සම්පන්න ජාතිකයක් ගොඩ නැඟීමේ අරමුණින් 1972දී ඇරැඹූ වික්‍රමාරච්චි රසායනාගාරය වර්තමානයේදී ආයුර්වේද නිෂ්පාදන 200කට වැඩි ප්‍රමාණයක් දේශයට දායාද කර ඇති සාර්ථක සමාගමක් බවට පත් වී ඇත. මුහුණ පැහැපත් කරන රුව සම්පත හා අන්ජනාලේප ක්‍රීම්, සමෙහි සුවතාව සඳහා වන සුවේගා ක්‍රීම්, වික්‍රමාරච්චි දියවැඩියා සුවය, කප්රුක සුවඳ කුඩු, පාවට්ටා තල් සූකිරි පැණිය, ඕරල් කෙයා මවුත්වොෂ්, දස පංගුව කුඩු, ශක්ති කුරුඳු තේ සහ මුරුංගා කැප්සියුල් වැනි නිෂ්පාදන සමාගමේ ජනප්‍රිය නිෂ්පාදන අතර වේ. නවීනතම යන්ත්‍ර අනුසාරයෙන් මෙන්ම දක්ෂ වෘත්තිකයන් රැසකගේ සහයෝගයෙන් සෞඛ්‍ය සම්පන්න නිෂ්පාදන සකසන වික්‍රමාරච්චි රසායනාගාරය ඉතා සාර්ථක ව්‍යාපාර ගමන තුළ එළදායිතා, ශිල්ප, ව්‍යවසායකත්ව හා SMIDEX ආදී සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. එසේම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව ව්‍යාපාර කටයුතු මෙහෙයවීම නිසා GMP,
Cosmetic GMP, ISO 14001:2015, ISO 22000:2018 සහ ISO 9001:2015 යන තත්ත්ව සහතිකද ලැබී ඇත.

## DSI සමාගමෙන් PVC වෙලින්ටන් බූට් සපත්තු පෙළක්



ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ISO 20346:2014 ප්‍රමිතිකරණය යටතේ, PVC වෙලින්ටන් බූට් සපත්තු පෙළක් දේශීයව නිෂ්පාදනය කිරීමට DSI සමාගම පියවර ගෙන තිබේ. DSI පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් නිර්මාණය කරන ලද මේ නවතම නිෂ්පාදනය, Kebellawa සන්නාමය යටතේ පසුගියදා එළිදැක්විණි. "මේ නව බූට් සපත්තු පෙළ අපගේ පාරිභෝගිකයන්ට නවතම අත්දැකීමක් ගෙනෙනවා.

ඉදිරියේදී ලෝහමය ආවරණයක් ඇඟිලි ප්‍රදේශයට යෙදූ සහ ලෝහමය තහඩු සවි කළ පාවහන් නිෂ්පාදනයක් හඳුන්වා දීමටත් බලාපොරොත්තු වෙනවා. මේ නිෂ්පාදන අන්තර්ජාතික වෙළෙඳපොළට යැවීමත් අපගේ අරමුණක්. අනෙක් අතට බූට් සපත්තු ආනයනයට වැය වන විදේශ විනිමය රට තුළ ඉතිරි කර ගැනීමටත් මෙය උපකාරී වෙනවා" යනුවෙන් DSI සමාගමේ විධායක අධ්‍යක්ෂ දිල්ෂාන් රාජපක්ෂ මහතා පැවසීය.

"වැඩ බිමේදී විය හැකි අනතුරුවලින් දෙපා ආරක්ෂා කර ගැනීම අතිශය වැදගත්. මේ නවතම නිෂ්පාදනය හරහා බරැති වස්තූන් පෙරළීමෙන්, අධික තෙහෙට්ටුවෙන්, පිළිස්සීම්, කැපීම්, විදුලි අනතුරු ආදියෙන් දෙපා ආරක්ෂා කරන අතරම වර්තමාන සෞඛ්‍යාරක්ෂණ මාර්ගෝපදේශවලටත් එය අනුකූලයි" යනුවෙන් DSI සමාගමේ පර්යේෂණ හා සංවර්ධන අංශ ප්‍රධානි ගාමිණී සේනාරත්න මහතා පැවසීය.

ISO ප්‍රමිති සහතිකයට අනුකූලව මෙන්ම, එමෙන්ම DSI නිවෙසේ විශ්වාසය රැගත් මේ බූට් සපත්තු පෙළ තත්ත්වයෙන් අඩු, නිසි ප්‍රමිතියට නිෂ්පාදනය නොකළ සපත්තුවලට වඩා වැඩි විශ්වාසයකින් සහ සුවපහසුවකින් පැලඳිය හැක.

## Royal Cashews සිව් වැනි වරටත් රන් සම්මාන දිනයි



ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කජු සැකසීමේ හා අපනයන සමාගමක් වන ROYAL CASHEWS සමාගම 'ජාතික අපනයන සම්මාන උලෙළ -2020' (NCE Exports Awards-2020) හි රන් සම්මානයෙන් සිව් වැනි වරටත් පසුගියදා පිදුම් ලැබීය. ශ්‍රී ලංකා ජාතික අපනයන මණ්ඩලය සංවිධානය කළ 28වැනි ජාතික අපනයන සම්මාන උලෙළ පසුගියදා ශ්‍රී ලංකා ටෙලිකොම් සභාපති රොහාන් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

ROYAL CASHEWS සමාගම මෙවර 'ජාතික අපනයන සම්මාන උලෙළ -2020' හි සම්මානයට පාත්‍රවූයේද Fresh and Processed Agricultural Export Crops අංශය වෙනුවෙන් පිරිනමන ජාතික රන් සම්මානය දිනා ගනිමිනි. එමෙන්ම පසුගිය සිව් වසරේ දී ROYAL CASHEWS සමාගම 'ජාතික අපනයන සම්මාන උලෙළහි' සම්මාන 4කට අඛණ්ඩව හිමිකම් කීමට සමත් විය. ROYAL CASHEWS සමාගම 'ජාතික අපනයන රන් සම්මානයකට හිමිකම් කීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ, වෛද්‍ය, රුවන් වතුගල මහතා පැවසුවේ, 'ජාතික අපනයන සම්මාන උලෙළහි අප සමාගමට රන් සම්මානය හිමිවීම මෙරට කජු සැකසීමේ හා අපනයන සමාගමක් ලෙස අප ලද සුවිශේෂී ජයග්‍රහණයක්.




| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 60 | 120 | 50 | 40-60 | 50 | 60-65 | ගෝවා | 100 |
| අළු කෙසෙල් | 80 | 120 | 60 | 50-55 | 20-30 | 45-50 | කැරට් | 125 |
| පිපිඤ්ඤා | 60 | 120 | 40 | 30-50 | 20 | 18-20 | ලීක්ස් | 55 |
| වැටකොළු | 160 | 160 | 50 | 80 | 30-60 | 65-70 | රාබු | 40 |
| බණ්ඩක්කා | 90 | 120 | 50 | 40-60 | 50-65 | 65-70 | බීට්රූට් | 60 |
| කරවිල | 120 | 160 | 90 | 75 | 80-110 | 80-110 | අර්තාපල් | 110 |
| පතෝල | 90 | 120 | 50 | 50 | 40 | 35-40 | අර්තාපල් රතු | 100 |
| මාළු මිරිස් | 240 | 280 | 190 | 140-150 | 130-140 | 100-110 | නෝකෝල් | 60 |
| බටානා | - | - | 80 | 70-80 | 70-80 | 50-55 | බෙල්පෙපර් රතු | 450 |
| මුරුංගා | 300 | - | - | - | - | 150-200 | කහ | 450 |
| එළබටු | 120 | 120 | 70 | - | 35-60 | 40-60 | කොළ | 350 |
| කැකිරි | 60 | - | 30 | 20-25 | 12-15 | 8-10 | බැසිල් | 330 |
| නෝකෝල් | 80 | - | 90 | 70-75 | 70 | 30-40 | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 80 | 80 | 50 | - | 30 | 30-32 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | - | - | 60 | - | - | 60-70 | සැල්දිරි | 450 |
| දඹල | 100 | 160 | 100 | 80-90 | 60-80 | 70-80 | කොත්තමල්ලි කොළ | 200 |
| මැකරල් | 120 | 120 | 90 | 60-70 | 40-50 | 30-35 | අයිස්බර්ග් | 200 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 60 |
| බෝංචි | 160 | 160 | 120 | 100-120 | 110-120 | 100-110 | රතුසලාද | 350 |
| ගෝවා ගෙඩි | 160 | 160 | 120 | 80-85 | 90-110 | 65-70 | මිංචි | 220 |
| කැරට් | 180 | 200 | 140 | 130-160 | 150 | 130-135 | පාස්ලි | 270 |
| ලීක්ස් | 120 | 140 | 80 | 80 | 75-80 | 55-60 | රැබා | 60 |
| රාබු | 60 | 100 | 40 | 60-75 | 60 | 30-35 | රෝස්මරි | 700 |
| තක්කාලි | 80 | 140 | 60 | 50-60 | 35-40 | 30-35 | බ්‍රොකෝලි | 300 |
| බීට්රූට් | 90 | 120 | 50 | 60-70 | 35-40 | 50-55 | මල්ගෝවා | 400 |
| සලාද | - | 210 | 250 | - | 150-200 | 75-80 | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 60 | - | 100 | 20 | 15-20 | - | පැචර්ලි | 170 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 140 | 130 | 120 | 120 | 120-130 | 120-125 | කහ සුකිනි | 170 |
| ඇඹුල් කෙසෙල් | 160 | 140 | 70 | 120 | 30-70 | 50-60 | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 280 | 220 | 200 | 250 | 160-190 | 180-185 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 160 | 140 | 90 | 90 | 35-70 | 60-70 | මාළුමිරිස් | 200 |
| ඇම්බුන් | 200 | 200 | 140 | - | 130-170 | - | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | 110 | 140 | - | 60-85 | 60-75 | | |
| ගස් ලබු | 180 | 120 | 140 | 110 | 60-85 | 70-80 | | |
| ඇපල් (ආනයනික) | 60 – 80 | 230 | 65 | - | - | - | | |
| මිදි (දේශීය) | - | - | 1000 | - | - | - | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 900 | - | - | - | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | - | - | - | - | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 480 – 720 | 800 | 630 | - | 550 | - | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 500 | 650 | 700 | - | - | - | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 200 | 300 | 160 | - | 180-200 | - | | |
| දෙහි | 160 | 200 | 100 | - | 70-80 | - | | |
| අමු ඉඟුරු | - | 500 | 260 | - | 180-220 | - | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-110 | 110 | 108 | 100 | 96 | - | | |
| සුදු නාඩු | 96-110 | 105 | 105 | 98-100 | 95 | - | | |
| රතු කැකුළු | 89-100 | 95 | 95 | 98-100 | - | - | | |
| සුදු කැකුළු | 93-100 | 100 | 100 | 94-96 | - | - | | |
| සුදු කැකුළු සම්බා | 108 | - | 120 | 115-117 | 130 | - | | |
| තම්බපු කැකුළු සම්බා | 110 | 135 | 120 | - | - | - | | |
| කිරි සම්බා | 125-185 | 190 | 190 | - | - | - | | |



දැනගෙන ගන්න
**රන් මිල**

| |
|---|
| කැරට් 21 - 94500 |
| කැරට් 22- 99000 |
| කැරට් 24- 108000 |

දිනමිණ

2021 අප්‍රේල් 24 සෙනසුරාදා

සදුතතික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා



චිත්‍රය - කසුන් චාමර වික්‍රමසිංහ

## ගැහැනිය ශෘංගාරාත්මක බවෙහි සංකේතයයි.



PAGE 02

## පිරිමි රළුයි ගැහැනු මෘදුයි



PAGE 03

## සාරි වියන තුරුණු දෑත



PAGE 08

දිනමිණ
2021 අප්‍රේල් 24 සෙනසුරාදා

## අපි ඔබ ඉලක්ක කරන්නෙමු

**යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.**

## එන්න, අපි හරි පාරක් හදමු

**සංස්කරණය - රජිත බස්නායක**

**පිටු සැකසුම - පසිඳු මිහිරාන් රැටියල**

younjanatha@lakehouse.lk

**‘යොවුන් ජනතා’, දිනමිණ**
**අංක 35**
**ලේක් හවුස්**
**ඩී. ආර්. විජයවර්ධන මාවත**
**කොළඹ 10**

**යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත්**
younjanatha@lakehouse.lk
**ලිපිනයට යොමු කරන්න**

# ගැහැනිය ශෘංගාරාත්මක බවෙහි සංකේතයයි.

මිනිසා යනු මනසින් උසස් යන්නය. මනසින් උසස් යැයි සලකන මිනිසා තිරිසනාගෙන් සම්පූර්ණයෙන් ම වෙනස් වෙයි. ඒ මිනිසා තුළ පවතින ස්වයං විනය නිසාවෙනි. මේ ස්වයං විනය පරාසය අනුව තිරිසන් සත්වයාගෙන් මිනිසා පැහැදිලිවම වෙනස් වේ. නමුත් කුඩා බිළිඳියකගෙන් වුව ද අසහනය මුදා හැරීමට මාන බලන සමාජයක මිනිසාට ඇත්තේ තිරිසන් භාවයෙන් ඔබ්බට ගිය දූපත් මානසිකත්වකි. අද සමාජයේ මිනිසාට ඇත්තේ විකෘති වූ මනසකි.

ලිංගිකත්වය, ළමා අපයෝජන, ළමා අපචාර, කාන්තා හිංසනය අද සමාජය පුරා ම දක්නට ඇත. ඇමරිකාව යුරෝපය ආදී රටවල කාන්තාවට ඇති නිදහස ලාංකේය කාන්තාවට නොමැති බව අපි අවිවාදයෙන් යුතුව පිළිගත යුත්තෙමු. ආගමික පසුබිම පෙරටු කර ගනිමින් ගමන් කරන ලාංකීය ජන සමාජය තුළ කාන්තාවට නිසි ගෞරවය නොලැබෙන්නේ ඇයි? මෙයට හේතුව ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියමින් පුරසාරම් දොඩමින්, ශිෂ්ටත්වයේ සිංහ හම පොරවා ගත් ශ්‍රී ලාංකික ජන සමාජයේ බොහෝ දෙනා ස්වයං විනයකින් මිදී තිරිසන් භාවය ද අභිභවා යන්නන් වීමයි. එබැවින් වර්තමානයේ ගැහැනිය යනු ලිංගිකත්වයේ සංකේතයකි. ලිංගිකත්වය යනු සාමාන්‍ය ජන ජීවිතයේ එක් ක්‍රියාවලියක් පමණි. නමුත් ලාංකේය ජන සමාජයේ අභිමානවත් හෙළයන්ට හෝඩියේ



සිට ඉගැන්විය යුතු කරුණකි. ගැහැනියකගේ අඩ නිරුවත් ඡායාරූපයක් දුටු පමණින් තරුණ මහලු භේදයකින් තොරව අද ඇති වන්නේ ලිංගිකත්වය පිළිබඳ මන දොළක් පමණක්මය. එයින් ඔවුන්ගේ ස්වයං විනය පිරිහී ගොස් අසහනයක් ඉස්මතු වේ.

ගැහැනිය යනු ශෘංගාරාත්මක බවෙහි සංකේතයකි. වසර දෙදහස් පන්සියයක ප්‍රෞඪ ඉතිහාසයකින් පැවත එන ලාංකේය ජන සමාජයේ සිටින මිනිසුන්, සීගිරි ලලනාවන් පවා විලි වසා ගත්තේ රෙදි කඩකින් යාන්තමිනි. සන්දේශ කාව්‍යයන්හි ස්ත්‍රී වර්ණනාවන් එමටය. නමුත් එම යුගයන්හි මිනිසුන් උසස් මනසකින් ස්වයං විනයකින් ජීවත් වූ බව මම විශ්වාස කරමි.

දූපත් මානසිකත්වයෙන් මිදීමට නම් නිසි ලිංගික අධ්‍යාපනයක් තරුණ පරපුරට දිය යුතු බව ද මම විශ්වාස කරමි. ගැහැනිය යනු ශෘංගාරාත්මක බවෙහි සංකේතයක් මිස ලිංගිකත්වයේ සංකේතයක් නොවේ. ලිංගික කුකුසෙන්, පිපාසයෙන්, අසහනයෙන් මිදෙන්නට තරුණ පරපුරෙහි විවෘත මනසක් ගොඩ නැඟීම අවශ්‍යය. එවිට තම මවට, නැගණියට, පෙම්වතියට, බිරියට ගරු කරන සමාජයක් ගොඩ නැගෙන බව මම විශ්වාස කරමි.

**ඩී.පී.එන්.මධුෂාණි**
**ජනසන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය,**
**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය**
**ත්‍රිකුණාමල මණ්ඩපය**

# යන එන හැමතැන මහමඟ ලටපට

අපි දවසකට කොයි තරම් ගමන් බිමන් යනවද ?
මොහොතකට හිතුවද අපේ අතින් වෙන්න ඕනෙ යුතුකම් අපි ඉටු කළාද කියල. නෑ නේද ?
පාරක විනය රකින්න ඕනෙ පාරවල් භාවිත කරන මිනිස්සු විසින් එහෙම නැතුව ආරක්ෂක අංශවලට බයේවත් වෙනත් කරුණක් නිසාවත් නොවෙයි.
හිතන්න අපි හිස් වැසුම් පලඳින්නේ අපේ ආරක්ෂාවටම ද? නෑ පොලිසියේ මහත්තුරු අපිව අල්ලල දඩ ගහයි කියන බයට තමයි අපි හිස් වැසුම් පැලඳගෙන මෝටර් බයිසිකලයේ යන්නෙ.
ඒ විතරක් නෙවේ පහුගිය ටික දොහට ලංකාවෙ රිය අනතුරු ශීඝ්‍රයෙන් වැඩි වෙලා තියනව. ඒකට හේතුවක් විදියට කියන්න පුළුවන් අධික වේගයෙන් ධාවනය කිරීම කියන එක. ඒ වගේම අපරික්ෂාකාරීව රිය පැදවීමත් එකක්.
මේ දෙකෙන්ම කියන්නෙ එකම කරුණක්. විනයක් නැතුව මහ මඟ වාහනයක් අරන් යනකොට අත්වැරදීම් වෙන්න තියන ඉඩ කඩ හුඟාක් වැඩියි.
අපේ මිනිස්සු හුරු වෙලා තියෙන්නෙ රිය අනතුරක් වුණාම ඒකත් පවතින රජය පිට දාල ගැලවෙන්න නේද?
වරද වුණේ කොතනින්ද, ඒකට හේතුව මොකක්ද, වරද නිවැරැදි වෙන්න අපි මොනවද කළ යුත්තේ කියන එක ගැනයි අපි හිතන්න ඕනෙ.
අන්න එහෙම හිතල විනය ගරුක රියදුරන් නීතිය රකින රියදුරන් බවට පත් වුණ දවසට අපේ රටේ රිය අනතුරු බොහෝමයක් වළක්වා ගන්න අපට පුළුවන් .
මොකද විනයගරුක මිනිසුන් සිටි තැනක වැරදි වෙන්න තියන ඉඩ කඩ අඩු නිසා.
ජපානය, ඕස්ට්‍රේලියාව, ඇමරිකාව වගේ රටක් උදාහරණයට අරන් බලන්න; මිනිස්සු මාර්ගවල විතරක් නෙවේ බොහෝ කරුණු කාරණාවලදි ඒ මිනිස්සු හරිම විනයගරුකයි කියල අපිට පේනව. ඒ දේවල් ඒ මිනිස්සුන්ට පුංචි කාලෙ ඉඳන්ම ලේවලටම කා වද්දලයි තියෙන්නෙ. අපෙත් වෙන්න ඕනෙ අන්න ඒකයි. වැඩිහිටියන් විදියට අද ඉඳන්වත් විනයගරුක ලෙස ඔබ හැසුරුණොත් හෙට දින අප දෙස බලා අනාගත දරු පරපුර නිසි මඟකට එනු ඇත. ඒ වෙනුවෙන් මුල් අඩිතාලම යෙදිය යුත්තේ අපි විසින් වන අතර, ඒ අඩිතාලම සමස්ත සමාජයේම පෙරළියක මූල සැලසුමක් බව ඔබටත් මටත් අද නොහැඟුනත් යම් දිනක අපට ඒ ගැන සතුටු වන්නට පුළුවන්.
සමාජ විනයෙන් තොර සංවර්ධනයක් නැත. සංවර්ධනය වුව ද ඒ තුළ කිසිම පැවැත්මක් නැත.

**ශක්ති සංකල්ප**



# අපි අමතක කළත් අපිව අමතක නොකළ කොරෝනා

හැම අවුරුද්දකම අප්‍රේල් මාසේ තමයි සිංහල හින්දු අලුත් අවුරුද්ද උදා වෙන්නේ. මාර්තු මාසේ අවසාන දවස්වල ඉඳන් ගමේ නගරේ හැම කෙනෙක්ම අලුත් අවුරුද්දට ලක ලෑස්ති වෙනවා. පරිසරය අලුත් වෙලා අවුරුදු ළඟ බව කොහාත් අපිට කියනවා. හැබැයි ගිය අවුරුද්දේ අපිට හරියට අවුරුදු සමරන්න බැරි වුණා. ඒ කොරෝනා වයිරසය ලංකාව පුරා පැතිරීම නිසා. හැමෝම තම තමන්ගේ ගෙවල්වලට වෙලා පුළුවන් විදියට අවුරුදු සැමරුවා. වෙනදා ආච්චිලා සීයලාගේ ගමේ යන පුංචි ළමයි ටිකත් ගෙදරටම කොටු වුණා. ඒ අපේම ආරක්ෂාව වෙනුවෙන් ලංකාව පුරාම ඇඳිරිනීතිය ක්‍රියාත්මක වුණු නිසා බොහෝ දෙනෙක්ට තමන්ගේ රැකියව පවා අහිමි වුණා. සෑහෙන පීඩාවකින් හිටිය අපිට ටිකක් හරි සහනයක් ලැබුණා කොරෝනා රෝගීන් අඩු වීමත් එක්කම. ඒත් නැවත කොරෝනා දෙවන රැල්ල පැමිණියත් පෙර පරිදි රට පුරා ඇඳිරිනීතිය ක්‍රියාත්මක වුණේ නෑ. එයට හේතු වූයේ සාමාන්‍ය ජනයාගේ එදිනෙදා කටයුතු කරගන්න අවශ්‍ය නිසා. නමුත් නිතර නිතර මාධ්‍ය හරහා පැවසුවේ තමන්ගේ ආරක්ෂාව තමන් විසින්ම සපයා ගන්නා ලෙසයි. කණ්ඩායම් ගත දේවල් සඳහා එක්විය හැකි පිරිස සීමා කරන්නටත් වුණා. එහෙත් මෙවර සිංහල හින්දු අලුත් අවුරුද්දත් සමගම ජනතාවට කොරෝනා වසංගතය අමතක වුණා. පොදු ප්‍රවාහනවල, වෙළෙඳ සංකීර්ණවල, ඇඳුම් කඩ සාප්පුවල ජනතාව පිරී ඉතිරී ගියා. කොරෝනා වසංගතය අමතක කොට එවැනි දෙයක් තිබුණායැයි මතකයත් අමතක කොට ඔවුනොවුන්ගේ වැඩ කටයුතු කර ගන්නට වුණා.

එක දවසක ප්‍රීතිය වෙනුවෙන් දරුණු වයිරසයක ව්‍යාප්තිය පවා අමතක කිරීමම කෙතරම් ඛේදජනක සිද්ධියක්දැයි සිතා ගැනීමටවත් නොහැකියි. රෝගයේ බරපතළකම දැන දැනත් මේ ආකාරයට හැසිරෙන ජනතාව තුළ සමාජ සාක්ෂරතාව නොමැතිදෝයි යන සැකයත් ඇති වීම වළක්වන්න බෑ. අද වන විට එලෙස හැසිරීමේ ප්‍රතිවිපාක ලැබෙමින් පවතිනවා. නැවතත් අහඹු පීසීආර් පරීක්ෂණ සිදු කිරීම, මහරගම පමුණුව ප්‍රදේශයේ කඩසාප්පු දෙකක් වසා දැමීම මෙහි ආරම්භයක් වන්නට පුළුවන්. අවුරුදු නිසා කොරෝනා ඉවරයි කියා සිතූ ජනතාවට මේවා දැකීමෙන් තමන්ගේ වරද තේරුම් ගත හැකි වෙයිද? බුද්ධිමත් ජනතාවක් ලෙස හැසිරුණා නම් මෙවැනි දේ වළක්වා ගැනීමට ඉඩකඩ තිබුණ බව වටහා ගත හැකිය.

**කේ.ජේ.සවින්ද්‍යා මධුෂාණි**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**



# පිරිමි රළුයි ගැහැනු මෘදුයි

ආදරේ කියලා කියන්නේ හරිම සුන්දර හැඟීමක්. ආදරේට ගොඩක් නිර්වචන තියෙන්න පුළුවන්. ඒකට හේතුව තමයි මිනිස්සුන්ගේ තියන විවිධත්වය. ආදර සම්බන්ධතාවයක් සාර්ථකව පවත්වාගෙන යන්න බොහෝ හේතු සාධක බලපානව. මූලිකම කාරණාව තමයි අනිත් කෙනාව තේරුම් ගැනීම. කාලයක් තිස්සේ ආදරේ කරල විවාහ ජීවිතේට ඇතුළත් වුනාම ගොඩක් දෙනෙක් හිතන්නේ අපි දෙන්නා දැන් එක්කෙනෙක් කියලා. මේ සම්බන්ධයෙන් විවිධ තර්ක තියෙන්න පුළුවන්. නමුත් මේක ප්‍රායෝගික නොවන කාරණාවක් විදිහටයි මං නම් දකින්නේ. දෙන්නෙක් කියන්නේ දෙන්නෙක්ටම තමයි. පිරිමි කෙනෙක් නිර්මාණය වෙලා තියෙන්නේ රළු විදිහට. හරියට කොස් ගෙඩියක් වගේ. පිටින් රළු වුණාට ඇතුලාන්තයෙන් මෘදුභාවයක් තියනවා. ගැහැනු හරියට පොල් ගෙඩියක් වගේ. පිටින් මෘදු වුණාට ඒ අය ඇතුලාන්තයෙන් රළු ස්වභාවයක් ගන්න පුළුවන්. මේ කියන වර්ග දෙකම විවිධාකාර අනුපාතයන්ගෙන් අපි දෙගොල්ලටම පිහිටල තියනවා. ඉතිං අපිට තියෙන්නෙ අපිටම කියල ආවේණික වුණ ගති ලක්ෂණ. බොහෝමයක් ආදර කතා අතරමග නතර වෙන්නෙ මෙන්න මේ තේරුම් ගැනීම නැති නිසා. එකිනෙකාගේ නොගැළපීම් අනිවාර්යයෙන්ම තියෙන්න පුළුවන්.



ඒ නිසා හැමවෙලේම අනිත් කෙනාගේ හැඟීම්වලට ගරු කරන්න ඕන. අඩුපාඩුවක් දැක්කොත් ඒ ගැන කතා බහ කරලා තේරුම් බේරුම් කරල දෙන්න ඕන. එහෙම නැතුව සම්බන්ධකමක් ඇතුලේ තමන්ගේ සතුට වෙනුවෙන් අනිත් කෙනාගේ සතුට අහිමි කරන එක හරිම අපරාධයක්. ගැහුවොත් ගහන මැරුවොත් මරන තියරි එක නම් මේකට හරියන්නෙ නෑ. ඒකෙන් අදහස් වෙන්නෙ නෑ ජීවිත කාලෙම යටත් වෙලා ඉන්න ඕනද වගේ හැඟීමක්. නෑ කොහෙත්ම එහෙම වෙන්න ඕන නෑ. මං අර කලින් කිව්ව තේරුම් ගැනීම තමයි ඕනම ගැටලුවකට විසඳුම. අවුරුදු ගණන් ආදරේ කරලා විවාහ ජීවිතයට ඇතුළත් වන ඇතැම් අය මාසෙන් දෙකෙන් හෝ ඊටත් වඩා අඩු කාලෙකින් වෙන් වෙලා යනවා. යෝජිත විවාහයක් වුණත් සමහර විට එහෙම වෙන්න පුළුවන්. අර සුන්දරයි කියපු ආදරේ තමන්ගේ අන්තිම හුස්ම ටික යනකල්ම සුන්දර විදිහට දකින්නේ බොහොම අතළොස්සක් විතරක්. විවාහ ජීවිතේ තියන ලිංගික සම්බන්ධතාව ඇතුලේ වුණත් අපි අනිත් පාර්ශ්වය තේරුම් ගැනීම අත්‍යවශ්‍යයි. නමුත් මේ වගේ කාරණාවක් ගැන විවෘත මනසකින් කතා කරන්න තරම් කොන්දක් බොහෝ දෙනෙක්ට නෑ. කායික සම්බන්ධකමක් ඇතුලේ අනිවාර්යයෙන්ම අනිත් කෙනාගේ රුචිය ගැන දැනගෙන ඉන්න එක සාර්ථක විවාහ ජීවිතයට හේතුවක් වෙනවා . තමන් කැමති දේම අනිත් කෙනා කන්න ඕන කියන තැන ඉඳන් අනිත් පාර්ශ්වයට බලපෑම් කරන සම්බන්ධකම් ඕන තරමක් අපේ සමාජයේ දැකගන්න පුළුවන්. ඇත්තටම ඒක ආදරේද කරුමෙද කියල හිතාගන්න බැරි තරමට අසරණ වෙලා යනවා. ඉතිං ඒ වගේ කරුමෙකට යට වෙලා ජීවිතේ විඳවනව ද නැත්නම් හොඳ තේරුම් ගැනීමක් තියන කෙනෙක් එක්ක ජීවිතේ බෙදා ගන්නව ද කියන එක තීරණය කරන්න අපිට කාගෙන්වත් බාධාවක් නෑ. මතක තියාගන්න තේරුම් ගැනීමයි වැදගත්..

**හර්ෂමාලී වීරරත්න**

# සංස්කෘතිය සමඟ දීගකන ලිංගිකත්වය

**සංස්කෘතිය සහ ලිංගිකත්වය අතර තියෙන්නේ අවියෝජනීය සම්බන්ධතාවයක්. ඒ ඒ රටවලට ඒ ප්‍රදේශවලට අනුව සංස්කෘතිය කියන එක වෙනස් වෙනවා. ලිංගිකත්වයත් අන්න එහෙමයි. රටවල් අනුව ගොඩක් වෙනස්කම් දකින්න ලැබෙනවා. බටහිර රටවලට සාපේක්ෂව ආසියාතික රටවල ලිංගිකත්වය තියෙන්නෙ වෙනම ආකල්පයක. මේ දෙකොටසින් වඩාත් හොඳ කොයි විදිහද කියන එකට වඩා ලිංගිකත්වය ගැන දරන දුර්මත සමාජයෙන් බැහැර කිරීම වඩාත් උචිතයි.**

ගැහැනු පිරිමි ලිංගික ආකර්ෂණය කුඩා දරුවකු යෞවනත්වයට පත් වීමත් එක්ක පටන් ගන්න දෙයක් කිව්වොත් හරි. මෙන්න මේ යෞවනෝදයේ ඉඳලා තාරුණ්‍ය, මැදිවිය සහ වයස්ගත වීම දක්වාම ශරීර වෙනස්කම් එක්ක ලිංගිකත්වය කාලෙන් කාලෙට වෙනස් ස්වරූපයක් ගන්නවා. ගැහැනු සහ පිරිමි වශයෙන් ගත්තත් ලිංගිකත්වය ගැන දරන අදහස්, ආකල්ප සහ හැඟීම් පවා යම් යම් වෙනස්කම් දරනවා . ඒ කොහොම වුණත් ලිංගිකත්වය කියන්නෙත් මූලික මිනිස් අවශ්‍යතාවක් කියන එක අමතක කරන්න හොඳ නැහැ. ආහාර ඇඳුම් පැළඳුම් වගේම ලිංගිකත්වය කියන්නේ උපතින්ම හැම මනුෂ්‍යයෙක්ටම වගේම හැම සත්ත්වයකුටම පොදු අවශ්‍යතාවයක්. හැබැයි මේ අවශ්‍යතාවයට ආසියාතික සමාජය තුළ යම් යම් සීමා, කාල පරාස, තහංචි ආදිය පනවලා තියෙනවා. සංස්කෘතිය මත පදනම් වෙලා ඒ කියන්නේ ලිංගිකව දෙදෙනෙක් එකතු විය යුත්තේ කොහොමද? මොන කාලයේද? මොන තත්ත්වයක් උඩ ද? මොන ස්ථානවල ද? කියලා යම් යම් සම්මතයන් ටිකක් ලාංකීය සමාජය තුළ දකින්න ලැබෙනවා. හැබැයි මේවා නීති නම් නෙවෙයි. මං කියන්නම් ඒවට උදාහරණ ටික. ස්ත්‍රියක් සහ පුරුෂයෙක් පමණක් එක්විය යුතුයි. ස්ත්‍රී න් දෙදෙනෙක් හෝ පුරුෂයන් දෙදෙනෙක් අතර ලිංගිකත්වය අසම්මතයි. අශීලාචාරයි.

- දෙදෙනකු ලිංගිකව එක්වීම සිදු කළ යුත්තේ නිසි වයස එළඹීමත් සමඟය. එනම් අවම අවුරුදු 18ට වැඩි විය යුතුය.
- එම වයස සපුරා තිබුණ ද ලිංගිකව එක් වීමට නම් විවාහ වී සිටිය යුතුය.
- විවාහ වී සිටිය ද ලිංගිකව එක්විය යුත්තේ තම නීත්‍යානුකූල බිරිඳ හෝ සැමියා සමඟ පමණි.
- මෙම එක්වීම ද මිනීමැරුමකට, හොරකමකට හෝ වෙනත් සාපරාධී අපරාධයකට වඩා අසභ්‍ය කොට සලකයි.
- සිප ගැනීම් ආදිය පොදු ස්ථානයක සිදු නොකළ යුතුයි.
- ලිංගිකව එක් වීම තම සහෝදරයින්, දෙමව්පියන් හෝ සමීප ඥාතීන් සමඟ සිදු නොකළ යුතුයි.

වැනි රීතීන් හා ආකල්ප රාශියක් ආසියාතික සමාජය තුළ දකින්න ලැබෙනවා. බටහිර සමාජය තුළ ලිංගිකත්වය තුළ කිසිදු නීතියක් හෝ රීතියක් දකින්න ලැබෙන්නේ නෑ. වයස, විවාහය , ඥාති සබඳතා ආදිය ලිංගිකත්වය එක්ක ඔවුන් කිසිසේත් සසඳා ගන්නේ නැහැ. සමාජයක් තුළ ප්‍රසිද්ධියේ සිපගැනීම දඬුවම් ලැබිය හැකි වරදක් විදිහට සලකන්නෙත් නැහැ .මෙන්න මේ සංස්කෘතීන් දෙක තුළ දකින්න ලැබෙන්නේ වෙනස්ම ආකල්ප සමුදායක්. කෙසේ වෙතත් ආසියාතික සමාජයේ හෝ බටහිර සමාජය තුළ ලිංගිකත්වය ගැන දරන මතය සම්පූර්ණයෙන්ම වැරදි හෝ සම්පූර්ණයෙන්ම නිවැරැදියි කියලා කියලා ලේබල් කරන්න නම් බැහැ. ඒ වගේම බටහිර සංස්කෘතියයි ආසියාතික සංස්කෘතියයි සංසන්දනය කරන්නත් බැහැ. හැබැයි අපිට පුළුවන් මේ සංස්කෘතීන් දෙකේම හොඳයි කියලා හිතෙන එහෙම නැත්නම් වරදක් නැහැ කියලා හිතෙන දේවල් ඇඳාගෙන වැරදි, දුර්මත, මිත්‍යා යැයි හිතෙන ආකල්ප බැහැර කරන්න පුළුවන්.

ලිංගිකව එක්වීම විරුද්ධ ලිංගිකයන් අතර ම සිදු විය යුතුයි කියන සම්මතය තුළ යම් යම් දෝෂ ඇති බව දකින්න ලැබෙනවා. ඔබත් මමත් විරුද්ධ ලිංගික ආකර්ෂණය ඇති මිනිසුන් වුව ද ඇතැමෙක් ඉන්න පුළුවන් විරුද්ධ ලිංගිකයින් කෙරෙහි ලිංගික ආකර්ෂණය නැති. ඒ කියන්නේ ඔවුන් ලිංගිකව ආකර්ෂණය වෙන්නේ ඔවුන්ගේම පාර්ශ්වයේ එනම් සම ලිංගිකයන් වෙත පමණයි. උපතින් උරුම කරගෙන ආපු දෙයක් හෝ හෝමෝන වෙනස්වීම් අනුව හෝ වෙන යම් හේතුවක් මත ඔවුන්ට ලිංගික ආකර්ෂණය ඇති වෙන්නේ සමලිංගිකයන් කෙරෙහි නම්, සමස්ත සමාජයම ලිංගිකත්වය අවශ්‍යතාවක් විදිහට විඳිද්දී ඔවුන්ට අහිමි වෙන්නේ ඔවුන්ගේ මූලිකම අයිතිවාසිකමක් අවශ්‍යතාවක් නෙමෙයිද කියන දේ තව පාරක් හිතන්නම වෙනවා .

අනෙක් කරුණ නම් ලිංගිකව එකතු වෙන්න පුළුවන් විවාහයෙන් පසු පමණයි කියන මතය ලංකාවට අනුව වරදක් නැති බව කියන්න පුළුවන්. ඒකට හේතු කිහිපයක්ම තියෙනවා. සමහර ආදර සම්බන්ධතා අතරමැද ලිංගිකව එක්වීම ඕන තරම් දකින්න ලැබෙනවා. මේ එක්වීමෙන් ගැබ් ගැනීම් සිදු වීම සුලබයි. මෙම ගැබ් ගැනීම් අවුරුදු 12ක් 13ක් පමණ කුඩා දැරියන් අතර සිදුවීම අද වෙනකොට සුලබ සිදු වීමක් . ඒ වගේම මෙම ලිංගිකව එක් වීමෙන් හෝ ගැබ් ගැනීමෙන් පස්සේ විවාහ නොවන යුවළ ඕනෑ තරම් දකින්න ලැබෙනවා.

විවාහ වී සිටියත් ලිංගිකව එක්විය යුත්තේ තම නීත්‍යානුකූල සැමියා හෝ බිරිඳ සමඟ පමණක් යන්න තුළ වරදක් නැති බව පෙනෙනවා. එයට හේතුව නම් සමාජ රෝග ඇති වීමේ අවදානම මත සහ සමාජ රෝග පැතිරීම වළක්වා ගැනීමට මෙය සුදුසු සම්මතයක් විදිහට සලකන්න පුළුවන්. ඒ වගේම අනියම් සබඳතා නිසා ලංකාව තුළ බොහෝ ජීවිත හානි සහ දික්කසාද වීම්, පවුල් ආරවුල් ඇති වීම් සහ දරුවන් ළමා නිවාසවලට යොමු කිරීම ආදී බහුලව දකින්න ලැබෙන තර්ජන වළක්වා ගැනීමට මෙම සම්මතය ලංකාවට උචිතයි.

සිප වැළඳ ගැනීම් ආදිය ප්‍රසිද්ධ ස්ථානවල නොකළ යුතු යැයි සම්මතයක් ආසියාතික රටවල බොහෝ විට දකින්න ලැබෙනවා. මේ කාරණය ගත්තොත් දෙපැත්තක් තියෙනවා. එක පැත්තක් තමයි මිනීමැරුම්, මංකොල්ලකෑම්, මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වැනි නොයෙකුත් සාපරාධි අපරාධයන් ප්‍රසිද්ධ ස්ථානවල සිදු වෙන අප රට තුළ , ඒ වගේම රටේ නීතිය හා ආරක්ෂාව සම්බන්ධ පුද්ගලයින් දැනුවත්වම ප්‍රසිද්ධියේ සිදු වන අපරාධ බහුලයි . ඇතැම් මිනීමැරුම් , හොරකම් දුටු නොදුටු ගානට සුළු කොට තකන සමාජයක ප්‍රසිද්ධියේ සිප වැළඳ ගැනීමක් සිදු වීම සාපරාධි අපරාධයක් විදිහට සලකනවා නම් අන්න එතන දෙපාරක් හිතන්න දෙයක් තියෙනවා . එවන් සිප වැළඳ ගැනීමක් ප්‍රසිද්ධ ස්ථානයක සිදු වුව හොත් මුද්‍රිත මාධ්‍ය තුළ වගේම විද්‍යුත් හා සමාජ මාධ්‍ය තුළත් සති ගණනාවක් කතාබහ කළ හැකි මාතෘකාවක් බවට නිසැකයෙන්ම පත් වෙනවා.

මේකෙ අනිත් පැත්ත තමයි ලංකාවෙ ඇතැම් තරුණයින් ප්‍රේම කිරීම තුළ විනයක් නැතුව හැසිරීම. බසයක් තුළ සිපගැනීමට එහා බොහෝ දේවල් ප්‍රසිද්ධියේ සිදු වෙනවා. කුඩා දරුවන් ඉදිරියේ මත් වූ අය මෙන් දඟලනවා. අනෙක් කරුණ තමයි නිදහස දීම තුළ එම නිදහස අයුතු විදිහට ප්‍රයෝජනයට ගැනීම. බටහිර සමාජයක සිප ගැනීම එළිපිට සිදු වුවත් දරුවකු සෑදීම ප්‍රසිද්ධ ස්ථානවල කිසිසේත් කරන්නේ නැහැ. එහෙත් අනවබෝධය නිසාම පාසල් පද්ධතිය තුළ පවා කාමුකව අන්ධ වී ළාබාල තරුණ තරුණියන් උන්මත්තකයින් ලෙස හැසිරීම දක්නට ලැබෙනවා .

අනෙක් කරුණ තමයි කාන්තාවකට බොහෝ විට නීති රීති සම්මතයන් තුළ හිරවෙලා ඉන්න ලාංකීය සමාජය තුළ සංස්කෘතිය තුළ සිද්ධ වෙලා තියෙනවා. දණිස්සෙන් උඩට ඇඳුමක් ඇන්දොත් ලොකු කතාබහකට ලක් වෙනවා. එහෙම අඳිනවා ද නැද්ද කියන එක තම තමන්ගේ කැමැත්ත අනුව සිද්ධ වෙන දෙයක්. ඒ වගේම කාන්තාවන්ගේ පුද්ගලික ජීවිතය ගැන ඕනවට වඩා හොයන එක ලංකාවේ මිනිසුන්ගේ දුර්වලකමක්.




**ආසියාතික සමාජයේ හෝ බටහිර සමාජය තුළ ලිංගිකත්වය ගැන දරන මතය සම්පූර්ණයෙන්ම වැරදි හෝ සම්පූර්ණයෙන්ම නිවැරැදියි කියලා කියලා ලේබල් කරන්න නම් බැහැ. ඒ වගේම බටහිර සංස්කෘතියයි ආසියාතික සංස්කෘතියයි සංසන්දනය කරන්නත් බැහැ. හැබැයි අපිට පුළුවන් මේ සංස්කෘතීන් දෙකේම හොඳයි කියලා හිතෙන එහෙම නැත්නම් වරදක් නැහැ කියලා හිතෙන දේවල් ඇඳාගෙන වැරදි, දුර්මත, මිත්‍යා යැයි හිතෙන ආකල්ප බැහැර කරන්න පුළුවන්.**

කොටින්ම කිව්වොත් ලිංගිකත්වය කුණුහරුපයක් බවට පත් වෙලා තියෙනවා. බටහිර රටවල ලිංගිකත්වය අමුතු දෙයක් නොවන හින්දා කාන්තාවන් දිහා අමුතු කෝණයකින් බලන්න ඔවුන් හුරු වෙලා නෑ . ඒත් ලංකාව ඇතුලේ කාන්තාවක් කොටට ඇන්දොත්, ඒ විතරක් නෙමෙයි නෙවෙයි ඇඳුමක් ඇගෙන් එහෙ මෙහෙ වුණොත් දහ දොළොස් වතාවක් හැරිලා බලන්න තරම් ඇතැම් මිනිස්සු අසහනකරුවන් බවට පත් වෙලා. ඒ වගේම පොදු ප්‍රවාහනයක යෑම පවා කාන්තාවකට අද වන විට තර්ජනයක් .

කාන්තාවක් දිහා ලාංකේය සංස්කෘතිය තුළ බලන්නේ මාතෘත්වය කියන පදනම මත. ඒ වගේම දෙමාපිය දූ දරු සම්බන්ධය තුළ බටහිර සමාජයට සාපේක්ෂව ලංකාව තුළ දකින්න ලැබෙන්නේ විශාල බැඳීමක්. අන්න ඒ කියන දේවල් එක්ක මෙවැනි දේවල් අපේ සංස්කෘතිය තුළට ඇඳා නොගෙන ඉන්න පුළුවන්. සංවර්ධනය කියලා කියන්නේ ගොඩනැඟිලි ඉදි කිරීම විතරක් නෙවෙයි. මිනිසුන්ගේ ආකල්ප දියුණු වීම, ආකල්ප සංවර්ධනය වීමත් සංවර්ධනයේ මූලිකම සාධකයක්. ලිංගිකත්වය පිළිබඳව බැහැර කළ යුතු දේවල් බැහැර කරලා, දුර්මතවලින් මිදිලා ලිංගිකත්වය කියන සාධකය ගැන සැබෑ අවබෝධයකින් ක්‍රියා කළ හොත් ලංකාව ඇත්තටම දියුණු රටක් බවට පත් වෙයි .


**චමෝදි පෙරේරා**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය






# ආයුර්වේද Mask හදපු වැලිවේරියේ ධම්මික

කෝටි ප්‍රකෝටි ගණනකින් මිනිසුන් ඉපිද මැරෙන යළි ඉපදෙන ලෝ තලය මත ඊයේ අද මෙන්ම මතු මතුද ජීවිතයට නිරන්තරයෙන් අප්‍රමාණ වටිනාකමක් එක් කරන නව නිපැයුම්කරුවා නම් සැබෑම මැණිකකි. ගල් දහසකුත් අතරින් පරිස්සමට වෙන්කරගත් සීරුවට කපා ඔප දමා ගත් වටිනාම මැණිකකි. මේ කියන්නට තනන්නේ හෙළ වෙදකමට හා නූතන තාක්ෂණය සුසංයෝග කරගනිමින් මේ දිනවල පවතින කොරෝනා වසංගතයෙන් ආරක්ෂා වීමට තම දැනුම එක්කළ එවන් වූ මැණිකක් පිළිබඳවයි.

ඔහු නමින් ධම්මික ප්‍රභාත්. ධම්මිකගේ පදිංචිය ගම්පහ වැලිවේරිය. ගම්පහ තක්ෂිලා විද්‍යාලයෙන් අකුරු කරපු ඔහු මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික අධ්‍යනාංශයේ විද්‍යාර්ථයෙක්. ඊට අමතරව මේ වන විට පොල්හේන විෂවෙද රෝහලේ පාරම්පරික වෛද්‍ය, කැඩුම් බිඳුම් හා සර්ප විෂ පිළිබඳවත්, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්වය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හදාරන බවත් පැවසුවා.

කොරෝනා වසංගත කාලය තුළ වෙළෙඳපොළේ මුව ආවරණ හිඟ වීම හා මුව ආවරණවල මිල ගණන් ඉහළ යෑම මත එයට විසඳුමක් වශයෙන් ඖෂධීය ගුණයෙන් යුතු මුව ආවරණයක් නිෂ්පාදනය කරන්නට ධම්මික යොමු වූ බව මතක් කළා. එහිදී විවිධ පර්යේෂණ සිදු කරමින් බැක්ටීරියා විනාශ කළ හැකි ආකාරයට ප්‍රති ක්ෂුද්‍ර ජීවී කාරක ගුණයෙන් යුතුව කහ, පෙරුම් කායම් ඇතුළු දේශීය ඖෂධ කිහිපයක්ම යොදා ගනිමින් සෑදී ස්ථරයක් එක්කරමින් ලෝකයේ පළමු වතාවට බැක්ටීරියා නසන මුව ආවරණයක් නිර්මාණය කිරීමට ධම්මිකට හැකියාව ලැබුණු බව පැවසුවා. පැය 72 කට වැඩි කාලයක් පූර්ණ ආරක්ෂාවක් සැපයීම මෙම නිෂ්පාදනයේ විශේෂත්වය වන අතර ඒ සඳහා ආයුර්වේද තත්ත්ව සහතිකයන් ගෙන තිබෙන බව මතක් කළා.

මීට අමතරව ධම්මික අතින් නිර්මාණය වූ නිෂ්පාදන අතර දේශීය ඖෂධ යොදා ගනිමින් නිෂ්පාදනය කරන ලද තරබාරුව අවම කරන තේ පානය, බුද්ධි වර්ධනය හා මතක ශක්තිය වැඩි කරන ගොටුකොළ ආශ්‍රිත කෝපි පානය, අසමෝදගම් නිෂ්පාදනය හා ශාකසාර යොදා ගනිමින් නිෂ්පාදනය කරන ලද හෙයා ඔයිල් මේ වන විට රටවල් 20 ක පමණ ඉහළ පාරිභෝගික ප්‍රසාදයක් හිමි කර දෙන බව පැවසුවා. තවද නුදුරේදීම කසළ ප්‍රතිචක්‍රීකරණය වෙනුවෙන් ඉලෙක්ට්‍රොනික කසළ බඳුනක්ද, දැනට ලංකාවේ පවතින ගැටලු කිහිපයකටම විසඳුම් දියහැකි ඉලෙක්ට්‍රොනික මෝටර් සයිකලයක්ද වෙළඳපොළට හඳුන්වාදීමට බලාපොරොත්තුවෙන් සිටින බව මතක් කළා. ඒ අනුව ඔහුගේ මෙම සියලු නිෂ්පාදන ISO 22,000 හා HACCP GMP යන තත්ත්ව සහතික යටතේ වෙළෙඳපොළට නිකුත්කරන බව මතක් කළා.

පුද්ගලයකුගේ බාහිර ස්වභාවය දෙස බලා ඔවුන් පිළිබඳව තීරණය කිරීම වර්තමානය වන විට බහුතරයක් අතින් සිදු වෙනවා. ඉතිං ධම්මිකත් උසස් පෙළින් පසුව විවිධ නිර්මාණ හා ව්‍යාපාර වෙත යොමු වූ විට බාල වයසක පසු වීම නිසා යම් යම් ආයතන තුළින් ඔහු ප්‍රතික්ෂේප වීමත් ,තරමක මූල්‍ය මය ගැටලු කිහිපයක් පැවතීමත් තමයි ඔහුට මේ දක්වා මුණ ගැහුණු අභියෝග. ඒ සියලු අභියෝග ජය ගනිමින් මේ වන විට විදේශීය වෙළෙඳපොළ ජය ගන්නටත්, ලංකාව තුළ වැඩිම මුව ආවරණ අලෙවිකරණ ආයතනය බවට පත් වන්නටත් ඔහුගේ උත්සාහයට අවස්ථාව ලැබී තියෙනවා. ඊට අමතරව නිෂ්පාදනය කටයුතු කරගෙන යාමේදී තවත් කිහිපදෙනකුට රැකියා අවස්ථාවන් දීමට ඔහුට හැකියාවක් ලැබීමත් ජීවිතේ ගොඩක් වටින බව මතක් කළේ ඉතාමත් සතුටින්.

මේ දක්වා වූ ගමන තුළ ඔහුට අතහිත දුන් පිරිස අතරින් විශේෂයෙන්ම අම්මා,තාත්තා ඇතුළු පවුලේ සියලුම දෙනාටත්,සෑම කටයුත්තකටම සහයෝගය දෙන යහළුවො සියලුම දෙනාටත්,පර්යේෂණ කටයුතු වලදී සහාය දුන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාටමත්,වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතනයේ සියලු දෙනාටමත්,සහයෝගය දුන් හා නොදුන් සියලුම රාජ්‍ය ආයතන සඳහාත්,ධම්මික සමඟ නිරන්තරයෙන් අත්වැල් බැඳගෙන සිටින සියලුම පාරිභෝගිකයන් සියලු දෙනාටමත් හදවතින්ම ස්තූතිවන්ත වෙන්න ඔහු අමතක කළේ නෑ.


**කවී විජේසූරිය**







**කොරෝනා වසංගත කාලය තුළ වෙළෙඳපොළේ මුව ආවරණ හිඟ වීම හා මුව ආවරණවල මිල ගණන් ඉහළ යෑම මත එයට විසඳුමක් වශයෙන් ඖෂධීය ගුණයෙන් යුතු මුව ආවරණයක් නිෂ්පාදනය කරන්නට ධම්මික යොමු විය**



# ගිලිහී යන අපේ අවුරුදු

අතීතයේ සැමරූ සිංහල අවුරුද්ද අද මිලින වී ගොස්ය. අවාසනාවන්ත ලෙස අද පරපුරට දකින්නට ඇත්තේ ඉන් ඉතාම සුළුතර වූ කොටසක්ය. කොහාගේ මියුරු හඬත් ඒ කෑ ගැසිල්ලත් අද සැඟව ඇති සෙයකි. වෙනදා මෙන් ඇසෙන ඒ ගීත අද නැත. ඒ වෙනුවට ඝෝෂාකාරී වූ ශබ්ද විකාශන යන්ත්‍රවල ඝෝෂාවය. මියුරු ගීත, ජනගීත වෙනුවට ඇසෙන්නෙ කන් දෙකඩ වෙන ගීතය.

එදා ඔන්චිලි වාරම් අද නැත. ඔන්චිල්ලාවද බෙහෙතකටවත් නැත. ඉතින් එදා අවුරුදු අද නැත යන්නට තවත් උපහැරණ කුමටද? රත් පැහැ ගත් අපූරු එරබදු මල් අද නැත. ඒවා සොයා ගන්නටත් දුලබය. රබන් හඬ වැයෙන්නේ නැත. ඒ වෙනුවට මහ හඬ නංවන ගුවන් විදුලි යන්ත්‍රය.

එදා හැදුණු කොකිස්, කොණ්ඩ කැවුම් වෙනුවට අද කේක් පීසා, බර්ගර් වැනි විවිධාකාර කඩචෝරුය. බාල මහලු බේදයකින් තොරව සියල්ලෝම ඒවාට ගිජුකමක් දක්වති. වෙනදා හරි හරියට හැඩ වෙන ගැමි ලියන් වෙනුවට අද ඉන්නේ පොෂ් වන්නට ගිය කෙල්ලන්ය. ඒ චීත්තය හැට්ටය වෙනුවට ඇත්තේ නානප්‍රකාර සුකුරුත්තම් ඇඳුම්ය. ඉතින් එදා අවුරුදු නැති හැඩය.

ජන කෙළි වෙනුවට ඇත්තේ ඔළුව මැෂින් කරවන ගේම්ය. ළමා තරුණ මහලු බේදයකින් තොරව ඊට ඇබ්බැහි වී ඇත. මිනිස්සුන්ගෙ මත් ලෝලිත්වය හේතුවෙන් නිවසේ සමඟිය ද ගිලිහී ඇත. අවුරුදු සිරිත් විරිත් සම්පූර්ණයෙන්ම අභාවයට ගොස් ඇත.

සිරිත් විරිත් අතීතයේ මෙන් නොව වර්තමානයේ ඒවා නවීකරණය වී ඇත. අතීතයේ සමහර සිරිත් ආදී අද වෙනස් වී ඇත එනම්, කාසියක් සහ බුලත් කොළයක් අතීතයේ දමන්නෙ ළිඳටය. නමුත් අද එය ටැංකියකට වුවද දමයි. සමහර සිරිත් විහිළුවට පවා ලක්ව ඇත.

තවද නිවෙසේ සියලු දේ කරන මවගේ චරිතය පවා වෙනස්කමට ලක් වී ඇත. සියලු සිරිත් විරිත් වෙනස් වී ඇත. පැරණි වටිනා චාරිත්‍ර අද නොකරන තැනට පත් වී ඇත.

අවුරුද්ද මිලින වී හමාරය. අවාසනාවකට බාල පරපුර තබා තරුණ පරපුරවත් එය දැක නැති හැඩය.


**පී.එම්.සී.සී.ජයසේකර.**
**සන්නිවේදනය අධ්‍යන පීඨය.**
**නැගෙනහිර විශ්වවිද්‍යාලය.**

## වැහි දවස් හරි මිහිරියි...

මනමේ කුමරී සහ වැදි රජු තුරුලු කොට
කුඩ පොඩියක් වළ අද්දරින් පාවෙයි
පියඹත් කැටුව කුමරු මනමේ
හිරි පොද මැදින් මෝටර් සයිකලෙන් ඉගිලෙයි...

ගල්ලෙනේ තනිවුණු සිංහයාගෙ සුසුමක් ඇහැරී
හිල්ඩාවේ කලුගල් බිත්ති සොලවයි
කාටවත් කියා නැති කතාවක් සිහිකොට
මහවැලිය පවා ඇස් බොර කරන් වැලපෙයි...

කළුවලා අගින් බේරි බේරී
පේරාදෙණියට ප්‍රේමයම වැගිරෙයි
ගලහා වීදියම ප්‍රේමයෙන් තෙතබරිතයි
දෙකම්මුල් අද්දර සිහින් සීතක් පැතිරෙයි
ඔබේ සුසුමක උණුසුම් සුවය සිහිවෙයි...

**මදාරා පසදනී ගුණවර්ධන**
**තෙවන වසර**
**කෘෂිකර්ම පීඨය**
**පේරාදෙනිය සරසවිය**

## ඉර ඇහැරිලා

අලුත් දවසක් ගෙනැත්
රැය පුරා නොනිදාම
එළිය දුන් සඳවතී
කෝ ඈ ගිහින්දෝ කොහේ

මුදු සඳට පෙම් නොකොට
සැඩ හිරුට පෙම් බඳින
විල් ගැවසි සියපත්
මන්මත් වෙමින්
කිරිකෝඩු යුවතියක සේ

හිරු කිරණ මනරම්ද
සඳ සිසිල ගිනියම්ද
රෑ පින්නෙ සුව නොවිඳ
ගිනිගහන මද්දහනෙ
නැළවෙන්නෙ නුඹ මේ ලෙසේ

**පූර්ණිමා රාජපක්ෂ**

## ඇය අම්මාය...

දසමසක් කුස දරා
අනෙකවිද දුක්ගැහැට විඳිමින්
තම රුහිරු කිරිකර
තම දරුවන් පෝෂණය කරමින්
සාර්ථකත්වය පමණක්ම
තම දරුවන්හට පතන
ආදරණීය ඇය
අම්මා ය...

**අයි.ඩී.එස්. නවෝදා වීරසිංහ**
**නැගෙනහිර විශ්වවිද්‍යාලය**

## මාළු නැන්දා

දකුණු අත ඔසවගෙන අල්ලාන කූඩේ
ගොරැඩි හඬ තළ තළා මොර දෙනා නාදේ
නුහුරු වූවත් ඈට වමත දකුණත සේ
මා මැණික් කටුව නැත ඈ අතින් මිදුනේ

සතියේ මුල ඇටවල්ලෝ පරාටි මඩුවෝ
සතිය අග සාලයෝ ඉස්සෝ තලපත්තු
හෙට්ටු දහසක් මැද්දේ විකුණලා මාළු
නැන්දාට කන්න එක මාළුවක් නෑලු

අම්මාට ලොකු පුතයි ලොකු දුවලා හතරයි
මම පොඩී ඈට දැන් හතළිහත් පැනලයි
වද දෙන්නේ කෝම මම ඈට අසනීපයි
ඒ හින්දා මාළු නැන්දත් එක්ක යාළුයි

ආදරෙයි නැන්දා මට අම්මටත් වැඩියෙන්
කියලා හිතෙනා වාර අනන්තෙට එහායින්
ඇවිදින්න රුචි නිසා වැව අයිනේ පාරෙන්
නැන්දටත් ආදරෙයි අම්මටත් වැඩියෙන්

**පියුමි මදුභාෂිණී**

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න**
**'යොවුන් ජනතා', දිනමිණ**
**අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.**
younjanatha@lakehouse.lk

## බාර් පාරට

මම ආවෙමි වැරහැල් වෙන්න හිතන්
හැමවිට රැක්ක පන්සිල් පද කටේ තියන්
බඹසර රැක්ක තනිකඩ මතකයත් ලිහන්
ඉඳුල් වත්මනේ කය ගිනියම් වෙන්න කියන්

කඳුළැලි හනික පිසදා ඇස අග රැඳුණු
විනිවිද පෙනෙන විදුරුවට අත ඉක්මන රැඳුණු
අමතක කරන්නට හිතන් අඟනක මා හා රැඳුණු
කරලා කෙළ ගැසුවා උණු මතකයේ පලුදු

පෙරදා කොහොම හදපානේ ජීවිතේ ගෙව්වාද
කෙදිනක හෝ මත්වතුර ගිනියම වින්දාද
වැනී වැනී පරඬැලක මෙන් ගෙපැලට ආවාද
කෙලෙසින් 'බාර් පාරට' අහෝ මා අද ඇද වැටුණාද

**තුෂාරී ජයසිංහ**



## එක වතාවක්...

ජීවිතේ හුදෙකලාවක්
අතරමං වුණු වෙලාවක්
දහස් ගණනක් නුවන් අතරේ
සොයමි නුඹ තව වතාවක්...

නොකී එක'මෙක කතාවක්
සඟවගෙන නෙතු වසාගත්
පුරුදු අහසේ වැහිවියන් යට
හමුවෙමුද එක වතාවක්...

**තත්සරණී කාරියවසම්**

## සඳනාව දවසක්

සඳ අයිති අහසට
කීවා නුඹ හුඟක් ඉස්සර
ඒක මට අද දැනුණේ නැතිවද
පෙම් කළේ මං සඳට එච්චර...

සඳ නාපු දවසක
තැවුනා මං පුදුම විදියට
ඒ නපුරු හීනය ට
ආස නෑ මං සඳේ දෙව්දුව...

පෙම් කඳුළු ඇස් ඉවුරේ
තවත් මං හඬන්න ද
මං කඳුළු පුරන කොට
සඳත් අහස ට අහිමි වේවිද...

**නිශාන්ත දසනායක**

## ඉතින් ඒ ප්‍රේමයේ හැටි......

එකමත් එක සිසිරයක
සීතල හිතක් ගැන ලිව්වම
නුඹ හැරෙන තැපෑලෙන්
මට වසන්තය එව් හැටි...!

ඒ ගෙනත් දුන්නේ
අවසාන වසන්තය බව
නුඹ දැනන් උන්නට
මට ඒක
නොදැනුණු හැටි...!

තාරකා එකක්වත් නැති බව
අහස දිවුරා කී පසුත්
කවුළුව වසා ගන්නට
මට හිත් නොදෙන හැටි...!

මේ සුසුම් ළසොවින්
නුඹ ළඟත් ගැවසෙනවැති
පෙනහලු තාම
මං අඳුරනව ඇති...!

"ලංකාව පුංචි රටක්"
නුඹ එදා කිවු බව මට
අමතක වෙන්නෙ නැති හැටි...!

**උදේශිකා හේරත්**



# සංගීතය රසවිඳීම අපේ වැඩක්

**සංගීතය යනු හැඟීම් පාලනයට ද අනර්ඝ දෙයකි. විටෙක එය සාම්ප්‍රදායික හෝ නොවන වාද්‍ය භාණ්ඩයකින් හට ගන්නාක් ද විය හැක . කෙසේ වෙතත් සංගීතය විකෘති නොකිරීමට අප වග බලා ගත යුතුයි. සංගීතයට කළ හැකි දෑ බොහෝ ය.**

**සංගීතය අමුතු විශ්මිත අපූරු දෙයකි. කාලෝචිත ලෙස ගීත නිර්මාණය රචකයා ට බාරයි**

Music නැතහොත් සංගීතය යනු ලොකු පොඩි භේදයක් නොමැති ව අපි කවුරුත් සිත ප්‍රියමනාපව ප්‍රබෝධමත් කරන්නකි. යෞවනයන් වන අප පමණක් නොව අපගේ මුතුන් මිත්තන් ද සංගීතයට ප්‍රිය උදවියයි. අතීතයේ ශාස්ත්‍රීය සංගීතය බහුලව පාවිච්චි කළා මෙන්ම වර්තමානයේ ද ශාස්ත්‍රීය සංගීතය පවතී. නමුත් වර්තමානයේ අති බහුල ව පවතින්නේ "rap" නමැති සංගීත කාණ්ඩයයි. සංගීතයකට සවන් යොමු කරන විට දී එය කනට සුමිහිර විය යුතුයි. කනට සුමිහිරි ගීත ඇසීම "Musical therapy" ලෙස දැක්විය හැක .

මාගේ අදහසට අනුව වර්තමාන ගීතවලට වඩා සුමිහිරි තාවක් අතීතයේ ගීත තුළ විඳ ගැනීමට හැකිය. මන්ද කනට සුමිහිරි ගීත ඇත. විටෙක අප ගීත කාලයට උචිත ලෙස යොදා ගනී. ගීතයක් ඇසීමේ දී එම ගීතයේ රසාස්වාදය පමණක් නොව උචිත භාවය ගැනත් විමසිලිමත් වීම සවන් දෙන්නාගේ කාර්යයි. කෙනකු දෙස බලන විට විනීතභාවය කැපී පෙනෙන ලක්ෂණයකි. යම් අවස්ථාවල දී මුහුණු පොත ආදී විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ ගීත විකෘති කර දැක්වීමක් දැක ගත හැක. ඒ සදාචාරාත්මක අයගේ ක්‍රියාවක් නොවේ. අතීත හෝ වර්තමාන වේවා, වෙනත් කෙනෙකුගේ දක්ෂතාවක් හැකියාවක් ලෙස ඉදිරිපත් කෙරෙන යම් දෙයක් වේ ද, විකෘති කිරීමට කිසිවකුටත් අයිතියක් නැත .

සංගීතය යනු හැඟීම් පාලනයට ද අනර්ඝ දෙයකි. විටෙක එය සාම්ප්‍රදායික හෝ නොවන වාද්‍ය භාණ්ඩයකින් හට ගන්නාක් ද විය හැක . කෙසේ වෙතත් සංගීතය විකෘති නොකිරීමට අප වග බලා ගත යුතුයි . සංගීතයට කළ හැකි දෑ බොහෝ ය. සංගීතය අමුතු විශ්මිත අපූරු දෙයකි. කාලෝචිත ලෙස ගීත නිර්මාණය රචකයා ට බාරයි. වයසට ගැළපෙන සංගීත රසය විඳීම අපේ වගකීමයි. යම් අවස්ථාවල දී විශේෂයෙන් උත්සව අවස්ථාවල දී අප හොඳට විනෝද වීමට හැකි යැයි සිතා ඝෝෂාකාරි සංගීත උත්සවය ට පාවිච්චි කරයි. අපට එය මිහිරි වීමට හැක. නමුත් එම ඝෝෂාකාරීත්වය අපගේ සිරුර අභ්‍යන්තරයේ ඇති විවිධ ශරීර කොටස් හානි කිරීමට ඉඩ ඇත. සංගීතය යනු රසාස්වාදය වුණත් හරියට රස විඳීමට අපි ඉගෙනිය යුතුයි .

**ශශිනි අමන්දා අලුත්ගේ**
**අශෝක විද්‍යාලය හොරණ**



# මනුස්සකම හොයන මිනිස්සු වෙමු

මලකට පර්යාය පද ගණනාවක් තිබුණද මල නම් මලක්මය. එය පුෂ්පය , කුසුම කවරකින් ඇමතුවත් මලට මල කියා කියනවා විනා වෙන කවරක් නම් පවසන්නද ? සොබා මාතාවගේ ඇකයේ පිපෙන්නාවූ මල් දහස් ගණනකි. ඒවාද නෙක නෙක මාදිලියේය. දැකුම්කලු හෝ සුගන්ධවත් හෝ දුර්ගන්ධයක් ඇති නමුත් විචිත්‍රවත් හෝ කුඩා හෝ විශාලය. ඒ කුමන වර්ගයටත් අවසානයේ හඳුන්වන්නේ " මල " යනුවෙන්ය.

මිනිසාද මෙවන් වූ මලකට සමානය. සමහර මල් ලෝකය සුවඳවත් කරන්නා මෙන් දමිටු මිනිසුන් ලෝකය සුවඳවත් කරයි . දුර්ගන්ධයක් ඇති මල්ද, අවපැහැ මල්ද, කෘමි භක්ෂක මල්ද මල් ලෝකයේ පිපෙයි. එහෙමයි කියා ඒ මල් උගුලා දමන්නට සොබා මව තැත් කරන්නේ නැත . පිටතට එසේ වුව ද අභ්‍යන්තරයේ සඟවාලු ආශ්චර්යජනක නිමිත්ත සොබා දහම හඳුනා ගෙන ඇත.

අභ්‍යන්තරය උලුප්පා ගැනීමට වෑයම් කරන අතරවාරයේ බාහිර කළු පැල්ලම තැකීම ඔබින්නේ නැත. එයයි සොබා දහම මෙතරම් ආනන්දයෙන් කල් ගෙවන්නට වූ රහස. කළු සුදු දෙවර්ගයේම මිනිසුන් වූ අපට නුවණ ඇති පදමට ඇත. ඒ නුවණ භාවිත කිරීමේදී අපිදු අනුවණය. ඒ ඇයි දැයි පැවසුවොත් අපත් අතපත ගාන්නේ බාහිර සැකිල්ල මිස අභ්‍යන්තරය නම් නොවේ. හැකියාවෙන් ඔප මට්ටම් වී ඒ හැකියාවෙන්ම අප පිනවන බොහෝ ජනප්‍රිය මිනිසුන් සිටිති. ඔවුන්ගේ අභ්‍යන්තරයෙන් මෝදු වන හැකියාවන් අනභිභවනීයය. අහෝ දුකකි. එයටම තිතකි. අප සොයන්නේ ඔවුන්ගේ පෞද්ගලිකත්වයයි. ඒ පසුපසම හඹා ගොස් ඔවුනටම ගරහයි. ඔවුනුත් අප වැන්නවුන් බව තකන්නේ නැත. ඒ පෞද්ගලික තතු අතර ඔවුන්ගේ හැකියාවන් මානුෂීය ලෙස වර්ණනා කිරීම කොතරම් වටින්නේද?. මෙය හුදු ජනප්‍රිය පුද්ගලයාට වඩා කුඩුකාරයා, සොරා , බේබද්දා, මිනීමරුවාට ඔබින්නේය. ඒ ඔවුන්ගේ කළු ස්වභාවය අතරේම අභ්‍යන්තරයේ සැඟවුණු

සුදක් ඇති නිසාය. ඒ සුදු බව බාහිරට එළි කරනා විට යහපත් පුද්ගලයකු අපටද ඇඹිය හැකිය. ඒ කාර්යය එක් ආකාරයකට කර්ෂක වුව ද අවසානය ජීවිතයටත් වඩා වටින්නේය.

**කාහට වුවත් දෑතේ ඇඟිලි පහම දිගු කර වරද පෙන්වා දිය හැක. සෑම මලක්ම මලක් වන්නා සේම සෑම මිනිසකුම මිනිසෙකි.**

තවත් කෙනකු සුදෝ සුදු කරන්නට ප්‍රථමව අපද සුද්ද පවිත්‍ර වීම

යෝග්‍යය. එවිට කාහට වුවත් දෑතේ ඇඟිලි පහම දිගු කර වරද පෙන්වා දිය හැක. සෑම මලක්ම මලක් වන්නා සේම සෑම මිනිසකුම මිනිසෙකි. එය යහපත් අයහපත්යැයි කියා වෙන් කර අයහපත ඉවත දැමීම නුසුදුසුය. සුදුසු වන්නේ අයහපතින් යහපත මතු කිරීමය.

වැඩිහිටියන් මේ සඳහා ඔවදන් දෙන අතරවාරයේ තරුණයා තම ජවය යෙදිය යුතුය. බාලයාට ආදර්ශයක් විය යුතුය. තමන්ටම කියා අනන්‍යතාවක් ගොඩනඟා ගත යුතුය. තවකෙකු වන්නට නොව මා වන මා වෙමු. අනන්‍යතාවක් නැත්තවුන්ට අනන්‍යතාවක් ගොඩනඟා ගන්නට අත හිත දෙමු. වැරදි සොයන තැන හොඳක් සොයන්නට තැත් කරමු. සොයන්නාට සම්බවීම අනිවාර්යය.

මිනිසුන්ද මල්ය. එක එක වගේ. හඳුනා නොගත් මල්ද ඇත. වඳවී යන මල්ද ඇත. ඒවා රැක ගැනීමට හැක්කේද ඒ මල් වලටමය.

**දෙව්නි පෙරේරා - වාද්දුව**





# සාරි වියන තුරුණු දෑත

**කොවිඩ් - 19 ගෝලීය වසංගතයත් සමග මුළු ලෝකයේම ආර්ථිකය දිනෙන් දින කඩා වැටීමට පත් වූ අතර, ව්‍යාපාර ද පහතටම ඇද වැටිණි. බොහෝ දෙනකුට තම රැකියා පවා අහිමිව යද්දී කුලියක් මලියක් කර ගනිමින් එදා වේල සරිකර ගත් මිනිසුන් අන්ත අසරණභාවයට පත් විය. එකල රජයෙන් දුන් මුදල්වලින් ජීවිතය ගැටගසා ගත් බොහෝ පිරිසක් ද වූහ. කෙසේ වෙතත් මෙවැනි වූ අසීරුතා බොහොමයක් මධ්‍යයේ කෙනකු තමන්ගේ සාර්ථකත්වය උදෙසා නැඟී සිටීමට වෙර දරන්නේ නම් ඔහු හෝ ඇය සැබැවින්ම උත්සාහවන්තයෙක් හෝ උත්සාහවන්තියකි. එලෙස අසීරු මොහොතක තමන්ගේ සාර්ථකත්වයට දිනෙන් දින ළඟා වෙමින් පවතින තරුණියක් පිළිබඳවයි අප 'යොවුන් ජනතා' තුළින් ඔබ වෙත ගෙන එන්නේ.**

"2017දී මම උසස් පෙළ කරල 2018දී විවෘත විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. ඒ කාලෙ වියදම් වැඩි නිසා මම සති අන්තයේ විවිධ රැකියා කරන්න පටන් ගත්තා. ඒත් සති අන්තෙ පොඩි පොඩි රැකියා කළාට ලොකු මුදලක් හොයන්න නම් බැරි වුණා. ඒ නිසා ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආහාර අලෙවිසලක රැකියාවකට ගියා. සතියෙ දවස්වල මම කැම්පස් එකේ වැඩ ඉවර වෙලා හවස ආහාර අලෙවිසලේ වැඩට ගිහින් රෑ වෙනකම් වැඩ කළා.

එම්. පී. පියුමි මධුෂාණි පතිරණ නම් මේ තරුණිය විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතුවල නරතව සිටින්නීය. ගම්පහ තක්ෂිලා විද්‍යාලයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ හදාරා ඇති පියුමි ජීව විද්‍යාවෙන් විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු සිදු කරන්නීය.

කොවිඩ් - 19 වසංගතයත් සමඟ දේශීය නිෂ්පාදන වෙත බොහෝ දෙනකු නැඹුරු වීමට පටන් ගත් අතර, අප රටේ නාමයට වටිනාකමක් ගෙන දීමට දේශීය අත්යන්ත්‍ර කර්මාන්තය අතීතයේ සිටම බෙහෙවින් ඉවහල් විය. පිටරටවලින් මහා පරිමාණව රෙදිපිළි ආනයනයත් සමඟම දේශීය රෙදිපිළි නිෂ්පාදනවලට තිබූ තැන ක්‍රමයෙන් අඩු විය. නැවතත් දේශීය රෙදිපිළි නිෂ්පාදනය ආරම්භ කර ඉන් සාර්ථක ගමනක් ආ පියුමි මධුෂාණි ඇගේ ගමන්මඟ මෙසේ විස්තර කළාය.

"2017දී මම උසස් පෙළ කරල 2018දී විවෘත විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. ඒ කාලෙ වියදම් වැඩි නිසා මම සතිඅන්තයේ විවිධ රැකියා කරන්න පටන් ගත්තා. ඒත් සතිඅන්තෙ පොඩි පොඩි රැකියා කළාට ලොකු මුදලක් හොයන්න නම් බැරි වුණා. ඒ නිසා ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආහාර අලෙවිසලක රැකියාවකට ගියා. සතියෙ දවස්වල මම කැම්පස් එකේ වැඩ ඉවර වෙලා හවස ආහාර අලෙවිසලේ වැඩට ගිහින් රෑ වෙනකම් වැඩ කළා. එතනින් මට ස්ථාවර වැටුපක් හැම මාසෙකම ලැබුණා. ඒත් කොරෝනා ආවට පස්සෙ ඒකෙත් ගොඩක් සේවකයෝ අයින් කළා. මටත් ඒ නිසා රැකියාව අහිමි වුණා. ඊට පස්සෙ කැම්පස් වහපු නිසා ගෙදර ගිහිනුත් එක එක ඔන්ලයින් බිස්නස් ගොඩක් කළා. ඒත් ඒවට මුලින් දාපු ගාණවත් හොයාගන්න නම් බැරි වුණා. ඊට පස්සෙ මම ඒවත් නැවැත්තුවා."

"අපේ අම්මලගෙ ගම තමයි මඩම්පැල්ල. අම්මලගෙ ගම රෙදි විවීමට ටිකක් ප්‍රසිද්ධයි. ඉස්සරත් මම ගමේ ගියාම දැකල තියෙනවා ගමේ රෙදි වියන තැන්. දේශීය අත් යන්ත්‍ර කියන්නේ ඉස්සර ඉඳන්ම ලංකාවේ තිබ්බ දෙයක්. ඒත් ඒ අය හරි විදිහකට පිළිවෙළකට රෙදි විවීම් කළත් එයාල ඒ රෙදි වෙළෙඳපොළට එහෙමත් නැත්නම් පාරිභෝගිකයා අතට යවන්නේ නෑ. ඒ වගේම ගොඩක් අය උසස් තත්ත්වයෙන් රෙදි විව්වට සමහර අය ඕනෑවට එපාවට තමයි ඒ දේ කරන්නේ. අපි කඩෙන් සාරියක් ගන්නව වගේ නෙමේ සාරියක් වියද්දී, වෙනමම ලොකු වැඩ කොටසක් තියෙනවා. ඒකට නූල් දාන්න ඕනෑ, තව විවිධ රටා එන විදිහට කල්පනා කරල රෙද්ද වියන්න ඕනෑ. මේ වගේ ගොඩක් සංකීර්ණ දෙයක් තමයි මේ රෙදි විවීම."

"ඊට පස්සෙ මම රෙදි වියන ගෙවල් 10කට විතර ගිහින් හොඳින් ඉගෙන ගත්තා රෙදි වියන්න. විවිධ වර්ණ ගළපමින් විවිධ රටා යොදා ගනිමින් මම ගමේ රෙදි වියන අයත් එක්ක එකතු වෙලා සාරි කිහිපයක් නිර්මාණය කළා. මුලින්ම මට මැෂින් එකක් තිබුණෙ නෑ සාරි වියන්න. ඒත් මට ඕන විදිහට ඩිසයින් කරල මම ගමේ රෙදි වියන තැනකට දීල තමයි මුල්ම සාරි කිහිපය නිර්මාණය කර ගත්තේ. මුලින්ම මං පාට 5කින් සාරි දහයක් හදල ඒව ෆොටෝ ගහල යාළුවෙක්ගෙ උදව්වෙන් ෆේස්බුක් එකේ පේජ් එකක් හදල දැම්මා. ඒත් මාසයක් විතර ගියත් එක සාරියක්වත් විකුණුනේ නම් නෑ. ඊට පස්සෙ මම තවත් පාට සාරි දහයක ෆොටොත් අරන් ආයෙත් පේජ් එකට දැම්මා. එතකොට තමයි එක දෙක සාරි විකිණෙන්න පටන් ගත්තේ. එතනින් තමයි මේ සාරි ව්‍යාපාරය ආරම්භ වෙන්නේ. ඒත් මේ අවුරුද්දට මට ඉල්ලුමට හරි යන විදිහට සාරි දෙන්න බැරි තරමට ලංකාවේ හැම තැනින්ම ඕඩර් ආවා. අවුරුද්දටත් කලින් මං හදපු සාරි මේ පාර ඉවරත් වුණා."

"මම මේ සාරි ව්‍යාපාරයට මුලින්ම සල්ලි හොයා ගත්තේ ගොඩක් අමාරුවෙන්. තාත්තගෙන් තමයි මුලින්ම සල්ලි ඉල්ල ගත්තේ. ඒත් මට ඒ මුදල මදි වුණා සාරිය පැකින් කරල පාරිභෝගිකයට දැක්කම් ආස හිතෙන මට්ටමට ගේන්න. තාත්ත කුඩා මෝලක් තමයි කරන්නේ. ඉතිං මං මේ ව්‍යාපාරයට මදි අඩුපාඩු හොයා ගත්තේ ලංකාවෙ වටේම මගෙ යාළුවෙක් එක්ක ගිහින් සෙරෙප්පු විකුණලා. ගෙදරින් මාව සෙරෙප්පු විකුණන්න යවන්න කැමති වුණේ නෑ. ඒ නිසයි මං යාළුවොත් එක්ක ගිහින් සෙරෙප්පු විකුණුවේ. දැන් මටම කියල අතින් වියන මැෂින් එකක් අරන් තියෙනවා. ඊට අමතරව සාරි වියන අයට කියල මට ඕන ඩිසයින්වලට සාරි මං හදා ගන්නවා. මගේ බලාපොරොත්තුව ඉදිරියට තවත් මැෂින් අරගෙන මම ම සාරි වියන්නයි. ඒ වගේම මේ සාරි ලංකාවෙ විතරක් නෙමේ මුළු ලෝකෙටම වුණත් යවන්න පුළුවන් වැඩිපුර නිෂ්පාදනය කරනවනම්."





මෙවැනි වූ ව්‍යාපාරයක් කිරීමේදී ඊට බාධා බොහෝ පැමිණේ. එය සාමාන්‍ය දෙයකි. ඇත්තෙන්ම පියුමි මධුෂාණිට ද පැමිණි බාධා බොහෝය. ඇය ඒ පිළිබඳ විස්තර කළේ වෙනස්ම අයුරකිනි.

"මේ ව්‍යාපාරය පටන් අරන් මං පොඩි කාලයයි දැනට. ඒත් මේ පොඩි කාලෙදි මට ගොඩක් දුර ගමනක් එන්න පුළුවන් වුණා. ඒ මගේ අම්මල තාත්තල වගේම සහෝදරියන්ගෙන් ලැබුණු සහයෝගයත් නිසයි. ඒ වගේම මගේ යාළුවන්ගෙනුත් ගොඩක් ලොකු සහයෝගයක් ලැබිල තියෙනවා. විශේෂයෙන්ම ස්තූති කරන්න ඕන කකුලෙන් ඇදපු අයට තමයි. මානසිකව වැටුණු වාර අනන්තයි. මොකද ඒ අය නිසයි මං ධෛර්යයෙන් මේ දේ කරගෙන ආවේ."

අතීතයේ පටන් රෙදි විවීම සිදු වුවද පසුකාලීනව දේශීය නිෂ්පාදන මිනිසුන්ගෙන් ඈත් වී විදේශීය නිෂ්පාදන ලංකාවේ ප්‍රචලිත වීමට පටන් ගැනිණි. කොරෝනා වසංගතය නැවතත් දේශීය නිෂ්පාදනවල අගය පසක් කර දෙන්නට විණි. දැන් දැන් මිනිසුන් තමන්ට අවශ්‍ය බොහෝ නිෂ්පාදන අප රට තුළම නිපදවීමට පටන් ගෙන ඇත.

මෙවැනි තරුණියන් ඊට හොඳම උදාහරණය. ඇයට මේ ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවශ්‍ය වන්නේ රෙදි වියන මැෂින්ය. එසේම ඇයට යම් කෙනකු අනුග්‍රහයක් දක්වන්නේ නම් අපට පිටරටින් රෙදි නැව් එනතුරු දත නියවාගෙන බලා සිටීමට අවශ්‍ය වන්නේ ද නැත. මෙවැනි කුඩා වයසක පසුවන්නන් ව්‍යවසායකයන් බවට පත්වීම නිකරුණේ කාලය කා දමනා තරුණ තරුණියන්ට සිතා බැලිය යුතුම කරුණකි.

**ගයාන් සංජය**

PIYUMI MADHUSHANI



2021 අප්‍රේල් 24 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.